# අධ්‍යාපන න්‍යාය හා මුල ධර්ම කෙටි සටහන් ගැන කෙටි සටහනක්

ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (PGDE) පාඨමාලාව හදාරන ගුරු ශිෂ්‍ය සහ ආචාර්ය පිරිසකගේ ඉල්ලීම මත කෙරුණු මෙම උත්සාහය නිම කිරීමට ලැබීම පිළිබඳ ව සතුටට පත් වෙමි.

මෙහි අධ්‍යාපන න්‍යාය හා මුලධර්ම විෂය යටතේ විෂය නිර්දේශයේ සඳහන් පාඩම් ඒකක 15 ක් සඳහා අනු ඒකක යටතේ සඳහන් මාතෘකා සඳහා සටහන් 21 ඉදිරිපත් කර ඇත.විෂය මාතෘකාවට අදාළ නිර් වචන, ඒවා සම්බන්ධ කෙරුණු පර්යේෂණ සාරාංශ පිළිබඳ ඉදිරිපත් කිරීම් වලට ප්‍රමුඛතාවක් දුනිමි.

මෙවැන්නකට මා පෙළඹ වුවේ පසුගිය කොරෝනා වසංගත සමයේ එකිනෙකා මුණ නොගැසුණු ගුරු කණ්ඩායම් වල අධ්‍යාපනික නොසන්සුන් තාවයයි .ආකල්ප සංවර්ධිත මෙබඳු ගුරු පුහුණු පාඨමාලාවන් සඳහා මාර්ගගත ඉගැන්වීම් නිවැරදි දිශා ගත කිරීමට අප හට තවත් කාලයක් ගතවනු ඇත.එතැන්හි ඇති වූ හිස් අධ්‍යාපන අවකාශය ට සහායක සේවාවක් ලෙස මෙම පොත සම්පාදනය කළෙමි.

මෙවන් අධ්‍යාපන කාර්යයන් සඳහා මෙරට විශ්ව විද්‍යාල අචාර්ය මහාචාර්ය වරුන් සරල සිංහලයෙන් ලියා පල කළ මාහැගි පත පොත තිබීම මෙම කාර්යය පහසු කළ බව ගෞරවයෙන් ලියා තබමි.

මෙහි නිවැරදි කිරීමට යමක් වේ නම් එය මා වෙත යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

අධ්‍යාපන සත් කාර්යයන් සඳහා නිබඳ මා පොළඹවන බිබිල,අම්පාර හා මොනරාගල PGDE මධ්‍යස්ථාන සම්බන්ධීකරණ මහතුන් ද ගෞරවයෙන් සිහිපත් කරමි.


සී.බී.වනසිංහ

කථිකාචාර්ය PGDE ප්‍රාදේශීය මධ්‍යස්ථානය - බිබිල

2022.10.20

071 811 00 73

# අධ්‍යාපන න්‍යාය සහ මූල ධර්ම

## ප්‍රධන මාතෘකා පෙළ

| | |
|---|---|
| 1. දර්ශනය හැදින්වීම | 12. සමාජානුයෝජනය |
| 2. පෙරදිග අධ්‍යාපන දාර්ශනිකයෝ | 13. සමාජානුයෝගී කාරක |
| 3. අපරදිග අධ්‍යාපන දාර්ශනිකයෝ | 14. සංස්කෘතිකය හා අධ්‍යාපනය |
| 4. විකල්ප අධ්‍යාපන දාර්ශනිකයෝ | 15. බහු සංස්කෘතික අධ්‍යයනය |
| 5. අධ්‍යාපනයේ පරමාර්ථ I ,II | 16. ගෝලීය සංස්කෘතියකට ප්‍රවේශවීම |
| 6. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරමාර්ථ විකාශනය I ,II | 17. සමාජ සමූහ සංකල්ප |
| 7. යාවජීව අධ්‍යාපනය | 18. සමාජ ස්තරායනය සමාජ පන්තිය හා අධ්‍යාපනය |
| 8. අධ්‍යාපනයේ නව ප්‍රවණතා | 19. සමාජ ප්‍රාග්ධනය |
| 9. අධ්‍යාපනය තුළින් සමාජ විශිෂ්ටතාව ඇති කිරීම | 20. සංස්කෘතික ප්‍රාග්ධනය |
| 10. ඵලදායි ගුරුගුරුවරයකු ගේ සමස්ත භූමිකාව I ,II | 21. පාසල හා ප්‍රජාව I ,II |
| 11. සමාජ විද්‍යාවේ ස්වභාවය හා ලක්ෂණ | 22. ගුරුවරයාගේ සමාජ භූමිකාව I ,II |

# 1. දර්ශනය හැදින්වීම

| දර්ශනය හැදින්වීම - නිර් වචන ඇසුරෙන් | අධ්‍යාපන දර්ශනය හැදින්වීම | දර්ශනය හා අධ්‍යාපන දර්ශනය | අධ්‍යාපන දර්ශනය සහ ගුරුවරයා |
|---|---|---|---|
| දර්ශනය ට පැහැදිලි ස්වභාවයක් හෝ අන්තර්ගතයක් නොමැත.ඊට හේතුව වන්නේ දාර්ශනික මතවාද සමාන නොවීමයි.<br>ජෝන් විල්සන් : ජීවිතයට අදාළ කර ගන්නා වූ සිතුම් පැතුම් හා ආකල්ප වඩා ක්‍රමානුකූල අන්දමින් පැහදිලි කර ගැනීමේ ප්‍රයත්නය දර්ශනය යි"<br>එල්.ඒ.රීඩ් : දර්ශනයයෙන් ජීවන දර්ශනයට අවශ්‍ය අගයයන් පද්ධතිය ගෙන හැර දක්වයි ".<br>ආර්.එස්.පීටර්ස් : "දර්ශනය විශ්ලේෂණාත්මක ක්‍රියාවලියකි."<br>ඞී.අයි.ලොයිඞ් : මිනිසා භාවිතා කරන සංකල්ප උපයෝගී කරගන්නා උපකල්පන හා ඉදිරිපත් කරන තර්ක විශ්ලේෂණය දර්ශනය යි."<br>ආනෝල්ඞ් රීඞ් : මිනිසාගේ ගැටලු නැමති අඳුරු වළාකුළු ඉවතට තල්ලු කර අවබෝධය නැමති ආලෝකය ලබා දෙන තියුණු රශ්මි කදම්භය දර්ශනය යි."<br>දර්ශනය සම්බන්ධ විවිධ ක්ෂෙත්‍ර<br>ආගම ඔස්සේ දර්ශනයට : ඇක්වයිනස්, බර්ක්ලේ ,කෙකගාඞ්<br>ගණිතය ඔස්සේ : රෙනකාඞ් ,රසල්<br>දේශපාලන ඔස්සේ : ප්ලේටෝ ,ඇරිස්ටොටල් ,හොබ්ස්,මාක්ස් | කිංස්ලි ප්‍රයිස් : අධ්‍යාපන දර්ශනය යනු අධ්‍යාපනය සම්බන්ධව කෙරෙන විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්<br>ඞී.ජේ.ඕකෝනර් : අධ්‍යාපන දර්ශනය යනු අධ්‍යාපනය හදාරන සිසුන්ගේ අවධානය යොමු විය යුතු වැදගත් දාර්ශනික ගැටලු සමුහයකි .<br>රොබින් බැරෝ: අධ්‍යාපන දර්ශනයේ මුලික කාර්ය නම් අධ්‍යාපනය ට සංකල්ප හා අදහස් විශ්ලේෂණය කිරීමයි.<br>අධ්‍යාපන ක්‍රියාවලිය : ප්‍රධාන ප්‍රශ්න<br>• දැනුම පිළිබඳ ප්‍රශ්න<br>• ඇගයුම් පිළිබඳ ප්‍රශ්න<br>• ළමයාගේ යථා තත්ත්වය පිළිබඳ ගැටලු<br>මේ අනුව අධ්‍යාපන දර්ශනය යනු අධ්‍යාපන ප්‍රශ්න විසඳීම සඳහා දාර්ශනික ක්‍රම විධි භාවිතයයි.<br>අධ්‍යාපනය යනු දර්ශනයේ ක්‍රියාකාරී අංශය යි.දර්ශනය ජීවන පරමාර්ථ පැහදිලි කරයි.දර්ශනය එය ඉටු කර ගන්නා මගයි.<br>ගුරුවරයා ට යහපත් ජීවන දර්ශනයක් අවශ්‍යයි.ඔහු ශිෂ්‍යයා යහපත් ජීවන දර්ශනයකට යොමු කළ යුතුයි .එය පහනකින් පහනක් දැල්වීමකි.<br>අධ්‍යාපන දර්ශනයක් අවශ්‍ය වන්නේ අධ්‍යාපනයේදී භාවිතා කරන පද සහ සංකල්ප වල පරස්පරතා අවම කිරීමට යි. | දර්ශනය හා අධ්‍යාපන දර්ශනය අතර සබඳතාවක් පවතී.<br>ඩබ්.ඞී.රෝස් එය එකම කාසියේ දෙපැත්ත බව පවසයි. බෲනර්ට අනුව සෑම අධ්‍යාපන ක්‍රමයක් ම අධ්‍යාපන දර්ශනයක්ම පදනම් කර ගොඩ නැගෙන බව කියයි.<br>දර්ශනය තුළ අන්තර්ගත ආචාර ධර්ම අංශය අධ්‍යාපනයට විශේෂ බලපෑම් කරයි.උදා: ගණිතය ඉගැන්වීම ශාරීරික අධ්‍යාපනය ඉගැන්වීමට වඩා වැදගත් ද? ළමා අවශ්‍යතා ,ආශා හා ලැදියාවන් අනුව ඉගැන්වීමට අත්දැකීම් සංවිධානය කළ යුතුද? ශාරීරික දඬුවම් ලබාදීම ආචාර ධර්ම වලට පටහැනි ද? වැනි ප්‍රශ්න.<br>දර්ශනය තුළ ඇති ඥාන විභාගය හා අධ්‍යාපනය අතර සමීප සම්බන්ධයක් ඇත සෑම දර්ශනයක් තුළම එයට ආවේනික දැනුම ලබා ගන්නා ක්‍රම සාකච්ඡා කර ඇත. උදා : ඩුවී ගේ උපයෝගීතාවාදය අනුව දැනුම විද්‍යාත්මක ක්‍රමයට ලබා ගන්නා අතර,ප්ලේටෝ ට අනුව දැනුම ආරයෙන් ගෙන එන්නක් බව පවසයි.<br>ලංකාවේ අධ්‍යාපන ක්‍රමයට බෞද්ධ ජීවන දෘෂ්ටිය ආලෝකයක් එල්ල කර ඇත.එහි ඇති ජාතක කතා,ආගමික නීති රීති තුළින් යහපත් බව,ආචාරශිලී බව වඩා වැදගත් බව අවධාරණය කරයි. | • අධ්‍යාපන පරමාර්ථ ,අරමුණ හඳුනා ගැනීමට හා විග්‍රහයට.<br>උදා: අධ්‍යාපිතයා යනු කවරෙක්ද?<br>• විෂය මාලා සම්පාදනයට හා එහි අරමුණු තීරණය කිරීමට.<br>උදා: ප්‍රාථමික /ද්විතීයික විෂය මාලාව කෙබඳු විය යුතුද?<br>• ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානයට.<br>උදා : ප්‍රාථමික අධ්‍යාපනයට දේශන සුදුසුද? එය සමෝධානිත විය යුතුද?<br>• ඉගැන්වීමේ දී අවශ්‍ය වන විශ්වාසයන් ,උපකල්පන ,අගයයන් විනිශ්චයට.<br>• උදා : ශිෂ්‍යයාගේ චරිත ලක්ෂණ අනුව ඉගැන්වීම කළ යුතු ද?<br>• පන්ති කාමර විනය තීරණය කිරීම සඳහා .<br>උදා : දඬුවම් ,නිතී රීති වැනි දේ අවශ්‍යමද?<br>• යහපත් පන්ති වාතාවරණයක් සඳහා.<br>උදා : පන්ති කාමරය ඒකාධිපති ද? ස්වාධීනත්වය සහිතද?<br>• සිසු සදාචාර හා ආකල්ප වර්ධනයට.<br>උදා : යහපත් චර්යා සඳහා උපස්ථම්භක ලබාදීම .අයහපත් චර්යා නිරුන්ධනයට දඬුවම් වැනි.<br>• පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම ශිල්ප තීරණයට.<br>උදා :අධි ශික්ෂණය යොදා ගන්නවාද? වැනි<br>• ගුරු චර්යා සංවර්ධනයට.<br>උදා : තමාගේම ස්වයං විග්‍රහයයක් කර ගැනීම සඳහා තමා අවංක ද?අපක්ෂපාති ද?කිපෙන සුලුද? වැනි ප්‍රශ්න සඳහා .<br>• මිනිස් ජීවිතයේ ක්‍රියාකාරීත්වය,අදහස්,හා ගැටලු හඳුනා ගැනීමට.<br>උදා : ගුරු භූමිකාව තුළ එක් එක් කණ්ඩායම් සමග වැඩ කිරීම .ළමුන් සමග,විදුහල්පති සමග,දෙමාපියන් සමග වැනි.<br>• උපදේශනය සඳහා<br>• නවීන තාක්ෂණය සමග ඇති වු ප්‍රවනතා ,එනම් අධ්‍යාපන යාන්ත්‍රික භාවය සමහන් කරලීමට. |

# 2.පෙරදිග අධ්‍යාපන දාර්ශනිකයෝ

| දාර්ශනිකයා<br>කාල වකවානුව | දර්ශන<br>වාදය | බලපෑම් කළ දාර්ශනිකයෝ | අධ්‍යාපනය පිළිබඳ<br>ඉදිරිපත් කළ අදහස් | ළමයා පිළිබඳව කළ<br>ඉදිරිපත් කිරීම. | පෙර දිග දාර්ශනික මත ශ්‍රී ලංකාවට අදාළ කර<br>ගැනීම. |
|---|---|---|---|---|---|
| රබීන්ද්‍රනාත්<br>තාගෝර්<br>1861-<br>ඉන්දියාව | සෞන්දර්ය<br>වාදය | ඇල්බට් අයින්ස්ටයින්<br>බර්නාඩ් ෂෝ<br>එච්.ජී.වේල්ස් | 1. අධ්‍යාපනය, මිනිසා සහ ස්වභාව ධර්මය අතර ඇති ආත්මීය සම්බන්ධතාවය.<br>2. අධ්‍යාපන අරමුණු බුද්ධිමය, සදාචාරාත්මක හා කායික ලෙස වර්ගීකරණය. | 1. අධ්‍යාත්මයත් ළමයාත් අතර සම්පසම්බන්ධය.<br>2. අධ්‍යාපනයේ සැබෑ අරමුණ ළමා මනසට නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩදීම. | 1. ජාතික ඒකාග්‍රතාවයට.<br>2. විෂය මාලාවේසෞන්දර්ය අංශයේ වර්ධනයට.<br>3. ගුරුවරුන්ගේ අඛණ්ඩ පුහුණුවට.<br>4. විෂය මාලාවේ සෞන්දර්ය හා ශාස්ත්‍රීය අංශ වල සමබරතාවට. |
| මහත්මා ගාන්ධි<br>1869 – 1948<br>ඉන්දියාව | අවිහිංසා<br>වාදය | ජෝන් රස්කින්<br>ලියෝ තෝල්ස්තෝයි<br>රායි චාන්ද්බායි<br>හෙන්රි හොරෝ<br>කාල් මක්ස්<br>ජෝන් ඩුවී | 1. H3 සංකල්පය. (හිස,හද,අත)<br>2. ශිල්ප කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රම.<br>3. ප්‍රජා අධ්‍යාපනය.<br>4. කාන්තාවන්ට අධ්‍යාපනය.<br>5. අධ්‍යාපන මාධ්‍ය මව්බස.<br>6. වර්ධා අධ්‍යාපන ක්‍රමය. | 1. අධ්‍යාපනය යනු ළමයාගේ මනස සහ අධ්‍යාත්මයේ ඇති විශිෂ්ට ලක්ෂණ පිබිදීම.<br>2. ළමා වර්ධනය ට ගැලපෙන විෂය මාලාවක්. | 1. ගුරුවරයා සමාජ නායකයකු විය යුතු බව.<br>2. විෂය මාලාව ශිල්ප කේන්ද්‍රීය විය යුතු අඛණ්ඩව අධ්‍යාපනය.<br>3. කාන්තා අධ්‍යාපනය /මිශ්‍ර අධ්‍යාපනය. |
| සී.ඩබ්.ඩබ්<br>කන්නන්ගර<br>ශ්‍රී ලංකාව<br>1884 – 1969 | සමාජ<br>සංවර්ධන<br>වාදය | බර්නාඩ් ෂෝ<br>මහත්මා ගාන්ධි<br>ශ්‍රී නේරු<br>ජොන් රස්කින්<br>ප්ලේටෝ/ඩුවී<br>කාල් මාක්ස් | 1. අධ්‍යාපනය සමාජ අවස්ථා.<br>2. ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය.<br>3. ශාස්ත්‍රීය විෂය මාලාවේ බර ඉවත් කිරීම.<br>4. නොමිලේ සැමට අධ්‍යාපනය.<br>5. විශ්ව විද්‍යාලය දක්වා නිදහස් අධ්‍යාපනය. | 1. ප්‍රජාතන්ත්‍රීයව ඉගෙනුම ලබා දීම.<br>2. න්‍යායයාත්මක ප්‍රායොගික අධ්‍යාපනය.<br>3. ළමයාගේ සෞඛ්‍ය හා පෝෂණය ගැන සැලකිලිමත් වීම.<br>4. සැමට පොදු අධ්‍යාපනය.<br>5. මව්බසින් අනිවාර්ය අධ්‍යාපනය. | 1. නිදහස් අධ්‍යාපන සංකල්පය.<br>2. අධ්‍යාපන අවස්ථා සුලභ කිරීම.<br>3. අධ්‍යාපනය විමධ්‍යගත කිරීම.<br>4. අධ්‍යාපනයේ සමාජ පන්ති ක්‍රමය ඉවත් කිරීම.<br>5. ශිල්ප කේන්ද්‍රීය අධ්‍යාපනය.<br>6. අවාසිදායක සමාජ පරිසර දරුවන්ට අවධානය. |
| ක්‍රිෂ්ණමූර්ති<br>1895 –1986<br>ඉන්දියාව | අධ්‍යාත්මික<br>වාදය | විනොද් භාවේ<br>බලීල් ජිබ්රාන්<br>ඇල්බට් හක්ස්ලි | 1. දැනුම යනු දර්ශනයයි.<br>2. කුතුහලය අධ්‍යාපනයේ පදනමයි.<br>3. දෘෂ්ටීන් බලෙන් ඉගැන්වීම් නොකළ යුතුයි.<br>4. ඉගෙනුම විවෘත්තාන්ත වීම.<br>5. ආගමික ඉගැන්වීම් මධ්‍යස්ථ විය යුතුයි. | 1. විෂය කරුණු ඉගෙනීම අධ්‍යාපනය නොවේ.<br>2. ඉගෙනීම යනු උගත්දේ අත් හැරීමයි.<br>3. ප්‍රශංසාව මෙන්ම දඬුවමද දූෂණයට සහ අල්ලසට හේතුවේ.<br>4. මිශ්‍ර පාසල් ක්‍රමය අවශ්‍යයි.<br>5. විභාග පීඩාකාරීයි.<br>6. ඉගෙනුම වදයක් නොව විනෝදයක් විය යුතුයි. | 1. පාසල සෞන්දර්යාත්මක තැනක් තැනක් බවට පත් පත් කිරීම.<br>2. ගුරු සිසු සබඳතා සමානාත්මකව පැවතීම.<br>3. ශිෂ්‍යයා මෙන්ම ගුරුවරයා ද උගත උගත යුතු බව.<br>4. පන්ති කාමරය තරගකාරී බවෙන් මුදවා ගැනීම.<br>5. ගුරුවරයා නිර්මාණශීලී විය යුතු බව. |

# 3. අපරදිග අධ්‍යාපන දාර්ශනිකයෝ - I

| දාර්ශනිකයා/<br>කාල වකවානුව | දර්ශන වාදය/<br>පොත පත | බලපෑම් කළ<br>දාර්ශනිකයෝ | අධ්‍යාපනයේ පිළිබඳව ඉදිරිපත් කළ අදහස් | ළමයා පිළිබඳ ව කළ ඉදිරිපත් කිරිම් | ශ්‍රී ලංකාවට අදාළ කර ගැනීම |
|---|---|---|---|---|---|
| කාල් මාක්ස්<br>1818 – 1883 | මාක්ස් වාදය/භෞතික වාදය<br>Das Capital | • හේගල්<br>• හොබ්ස්<br>• පියුබාච් | 1. අධ්‍යාපනයේ ප්‍රජාවට විවෘත විය යුතුයි.<br>2. අධ්‍යාපනය සහ ආගම රාජ්‍ය පාලනයෙන් නිදහස් විය යුතුයි.<br>3. අධ්‍යාපනයේදී පූජකයාගේ තැන ගුරුවරයා ගත යුතුය.<br>4. රජයේ අධ්‍යාපන නීති සම්පාදනය කළ යුතුයි.<br>5. සැමට පොදු අධ්‍යාපනය සංකල්පය.<br>6. අධ්‍යාපනය අනිවාර්ය කිරීම.<br>7. අධ්‍යාපනයේ වර්තමානයට හා අනාගතයට යෝග්‍ය විය යුතුයි. | 1. නිෂ්පාදන ශ්‍රමය ඉගෙනීම හා ක්‍රීඩාවට සම්බන්ධ කර ඉගැන්විය යුතුය.<br>2. ළමුන්ට රජයේ පාසැල් වල නොමිලේ අධ්‍යාපනය ලබාදිය යුතුයි .<br>3. ළමුන් රැකියාවන් සඳහා යොදා නොගත යුතුයි.<br>4. ළමුන්ට හස්ත කර්මාන්ත පුහුණුව ලබා දිය යුතුයි. | 1. අඩු ආදායම් ලාභීන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය.<br>2. කණිෂ්ඨ තාක්ෂණික අධ්‍යාපනය පුළුල් කිරීම.<br>3. වැඩබිම් ආශ්‍රිත දාරකා ගාර මඟින් කාන්තා ශ්‍රමය ඇගයීම.<br>4. පෙර පාසල් අධ්‍යාපනයට රජය මැදිහත්වීම.<br>5. ශ්‍රම හුරුව විෂය මාලාවට ඇතුලත් කිරීම.<br>6. පාසල සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කිරීම. |
| ජොන් ඩුවී<br>1859 – 1952 | උපයෝගීතාවාදය<br>Democracy and Education | • ප්ලේටෝ<br>• හර්බාට්<br>• ෆ්‍රීබල්<br>• පෙස්ටලොසි<br>• හේගල්<br>• ඩාවින්<br>• කාන්ට් | 1. අත් දැකීම් පිළිබඳ න්‍යාය.<br>2. පංචේන්ද්‍රියන් මගින් ඉගෙනුම.<br>3. කාර්මික සමාජයකට ගැලපෙන අධ්‍යාපනය.<br>4. අධ්‍යාපනය යනු ජීවිතයට සහභාගී වීමයි.<br>5. පාසල අනාගත ජීවිතයට සූදානම් කිරීම නොව වර්තමානයට සූදානම් කිරීමයි.<br>6. ගුරුවරයා කණ්ඩායම් නායකයෙකු විය යුතුයි. | 1. ක්‍රියාකාරී අධ්‍යාපනය<br>2. කණ්ඩායම් වැඩ සහ අත්දැකීම් ලබාදීම.<br>3. නිශ්ශබ්ද පන්ති කාමරයට වඩා සෝෂාකාරී පන්ති කාමරය හොඳ බව.<br>4. පාසල හා ප්‍රජාව අතර මනා සම්බන්ධතාව.<br>5. පන්ති කාමරය නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට සුදුසු තැනක් බව. | 1. ජීවත්වීමට අවශ්‍ය දක්ෂතා පාසලෙන් ලබා දීම.<br>2. පන්ති කාමරය තුළ අත් හදා බැලීම් සඳහා ඉඩ ලබා දීම.<br>3. පෙළඹවීමසහ ශිෂ්‍යයන් අගය කිරීම.<br>4. ළමා මූලික අධ්‍යාපනය සංකල්පය.<br>5. ක්‍රියාකාරකම් තුළින් ඉගෙනීමට අවස්ථා ලබාදීම. |

**3. අපරදිග අධ්‍යාපන දාර්ශනිකයෝ - II**

| දාර්ශනිකයා/ කාල වකවානුව | දර්ශන වාදය/ පොත පත | බලපෑම් කළ දාර්ශනිකයෝ | අධ්‍යාපනයේ පිළිබඳව ඉදිරිපත් කළ අදහස් | ළමයා පිළිබඳ ව කළ ඉදිරිපත් කිරීම් | ශ්‍රී ලංකාවට අදාළ කර ගැනීම |
|---|---|---|---|---|---|
| කාල් මාක්ස්<br>1818 – 1883 | මාක්ස් වාදය/භෞතික වාදය<br>Das Capital | • හේගල්<br>• හොබ්ස්<br>• පියුබාච් | 1. අධ්‍යාපනයේ ප්‍රජාවට විවෘත විය යුතුයි.<br>2. අධ්‍යාපනය සහ ආගම රාජ්‍ය පාලනයෙන් නිදහස් විය යුතුයි.<br>3. අධ්‍යාපනයේදී පූජකයාගේ තැන ගුරුවරයා ගත යුතුය.<br>4. රජයේ අධ්‍යාපන නීති සම්පාදනය කළ යුතුයි.<br>5. සැමට පොදු අධ්‍යාපනය සංකල්පය.<br>6. අධ්‍යාපනය අනිවාර්ය කිරීම.<br>7. අධ්‍යාපනයේ වර්තමානයට හා අනාගතයට යෝග්‍ය විය යුතුයි. | 1. නිෂ්පාදන ශ්‍රමය ඉගෙනීම හා ක්‍රීඩාවට සම්බන්ධ කර ඉගැන්විය යුතුය.<br>2. ළමුන්ට රජයේ පාසැල් වල නොමිලේ අධ්‍යාපනය ලබාදිය යුතුයි .<br>3. ළමුන් රැකියාවන් සඳහා යොදා නොගත යුතුයි.<br>4. ළමුන්ට හස්ත කර්මාන්ත පුහුණුව ලබා දිය යුතුයි. | 1. අඩු ආදායම් ලාභීන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය.<br>2. කණිෂ්ඨ තාක්ෂණික අධ්‍යාපනය පුළුල් කිරීම.<br>3. වැඩබිම් ආශ්‍රිත දාරකා ගාර මඟින් කාන්තා ශ්‍රමය ඇගයීම.<br>4. පෙර පාසල් අධ්‍යාපනයට රජය මැදිහත්වීම.<br>5. ශ්‍රම හුරුව විෂය මාලාවට ඇතුලත් කිරීම.<br>6. පාසල සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කිරීම. |
| ජොන් ඩූවී<br>1859 – 1952 | උපයෝගීතාවාදය<br>Democracy and Education | • ප්ලේටෝ<br>• හර්බාට්<br>• ෆ්‍රිබල්<br>• පෙස්ටලොසි<br>• හේගල්<br>• ඩාවින්<br>• කාන්ට් | 1. අත් දැකීම් පිළිබඳ න්‍යාය.<br>2. පංචේන්ද්‍රියන් මගින් ඉගෙනුම.<br>3. කාර්මික සමාජයකට ගැලපෙන අධ්‍යාපනය.<br>4. අධ්‍යාපනය යනු ජීවිතයට සහභාගී වීමයි.<br>5. පාසල අනාගත ජීවිතයට සූදානම් කිරීම නොව වර්තමානයට සූදානම් කිරීමයි.<br>6. ගුරුවරයා කණ්ඩායම් නායකයෙකු විය යුතුයි. | 1. ක්‍රියාකාරී අධ්‍යාපනය<br>2. කණ්ඩායම් වැඩ සහ අත්දැකීම් ලබාදීම.<br>3. නිශ්ශබ්ද පන්ති කාමරයට වඩා සෝෂාකාරී පන්ති කාමරය හොඳ බව.<br>4. පාසල හා ප්‍රජාව අතර මනා සම්බන්ධතාව.<br>5. පන්ති කාමරය නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට සුදුසු තැනක් බව. | 1. ජීවත්වීමට අවශ්‍ය දක්ෂතා පාසලෙන් ලබා දීම.<br>2. පන්ති කාමරය තුළ අත් හදා බැලීම් සඳහා ඉඩ ලබා දීම.<br>3. පෙළඹවීමසහ ශිෂ්‍යයන් අගය කිරීම.<br>4. ළමා මූලික අධ්‍යාපනය සංකල්පය.<br>5. ක්‍රියාකාරකම් තුළින් ඉගෙනීමට අවස්ථා ලබාදීම. |

# 4. විකල්ප අධ්‍යාපන දාර්ශනිකයෝ

| | දාර්ශනිකයා පිළිබඳ සුවිශේෂිතා | අධ්‍යාපනය පිළිබඳ ඉදිරිපත් කළ අදහස් | ළමයා පිළිබඳව ඉදිරිපත් ඉදිරිපත් කළ අදහස් | ශ්‍රී ලංකාවට අදාල කර ගැනීම |
|---|---|---|---|---|
| ජුලියස් නියරේරේ 1922 – 1997 | 1. ආත්ම විශ්වාසය පිළිබඳ අධ්‍යාපනය.<br>2. ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය හඳුන්වාදීම.<br>3. අධ්‍යාපනයේගෝත්‍ර වාදය ප්‍රතික්ෂේප කිරීම.<br>4. අධ්‍යාපනයට ග්‍රාමීය සවිබලකරනය හඳුන්වාදීම.<br>5. අධ්‍යාපනයට සමාජවාදී දේශපාලන දර්ශනය යොදා ගැනීම. | 1967 අරුෂා ප්‍රකාශනය<br>1. සැමට සමාන අයිතිවාසිකම් අධ්‍යාපනයේදී ලබාදිය යුතු බව.<br>2. සියල්ලෝම පීඩාවට හා සූරාකෑමට ලක් නොවිය යුතු බව.<br>3. සියලු දෙනාටම අවම වශයෙන් හෝ භෞතික සම්පත් හිමිවිය යුතු බව.<br>4. ස්වශක්තිය පිළිබඳව උජම්මා ගම්මාන සංකල්පය.<br>5. විධිමත් අධ්‍යාපනයෙන් අධ්‍යාපනයෙන් වැඩි පුර ඵල ලබා ගන්නේ වරප්‍රසාද ලත් පන්තිය බව.<br>6. විධිමත් අධ්‍යාපනය නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සම්බන්ධ නොවන බව.<br>7. විධිමත් අධ්‍යාපනය ගමෙන් නගරයට යාම සඳහා වීසා බලපතක් ලෙස වරප්‍රසාද සහිත පන්තිය යොදා ගන්නා බව. | 1. විභාග සමත්වීම හා සහතික පත්‍ර ලැබීම අධ්‍යාපනය අධ්‍යාපනය නොවේ.<br>2. අධ්‍යාපනය යනු විධිමත් පාසලට යාම පමණක්ම නොවේ.<br>3. විධිමත් අධ්‍යාපනයෙන් ළමයා තුළ අසමානතාවය, බුද්ධිමය උඩඟු බව සහ අධි ආත්මාර්ථකාමිත්වය ගොඩ නැගෙන බව. | 1. රටක පොදු ජනතාවට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් යෝජනා කිරීම.<br>2. සැලසුම් කිරීමට හා තීරණ ගැනීමට සිසුන් සම්බන්ධ කර ගැනීම.<br>3. පාසල් විෂය මාලාව සමෝධානය විය යුතු බව.<br>4. ආත්ම විශ්වාසය සඳහා අධ්‍යාපනය සැලසුම් කිරීම .<br>5. ගුරුවරයා සමාජ විපර්යකාරක යෙකු යෙකු බව.<br>6. ගුරුවරයා විෂය විශේෂඥයෙකු විය යුතු බව.<br>7. රටේ නිෂ්පාදනයට අධ්‍යාපනය දායක විය යුතු බව. |
| පැව්ලෝ ප්‍රෙයරේ 1921 – 1997 | 1. විවෘත මනසකින් ගවේෂණශීලී ලෙස ළමයාගේ වැඩීම ට නිවස පිටිවහලක් බව.<br>2. අධ්‍යාපනයෙ සියලු ගැඹුරු ඥාණය ලබා ගත හැක්කේ කම්කරුවන් සමග වැඩ කිරීමෙන් සහ ඔවුනට ඉගැන්වීමෙන්ම පමණි.<br>3. අයිවන් ඉලිච් ඉදිරිපත් කළ පාසැල් විරහිත සමාජයක් යන සංකල්පය ආදර්ශයට ගැනීම.<br>4. අධ්‍යාපනයේ බැංකු සංකල්පය ඉවත් විය යුතු බව පෙන්වා දීම.<br>5. පුද්ගලයා අවබෝධ කර නොගෙන චර්යාව වෙනස් කළ නොහැකි බව අවධාරණය කිරීම.<br>6. විඥානය පිබිදීම යන සංකල්පය ඉදිරිපත් කිරීම.<br>7. දැනුවත් බව වර්ධනය වීමේ ප්‍රතිඵලය අධ්‍යාපනය බව. | 1. මිනිසාගේ යුතුකම වඩාත් උසස් මිනිසකු වීමට උත්සාහ කිරීමයි.<br>2. විධිමත් අධ්‍යාපනය මිනිසා හීලෑ කරයි.<br>3. නිශ්ශබ්ද සංස්කෘතියෙන් මිදී සංවාදශීලී සමාජයක් අධ්‍යාපනයෙන් ගොඩනැගිය යුතු බව.<br>4. ගුරුවරයා දැනුම සොයා දෙන්නෙක් මිස දැනුමක් පටවන්නේ නොවිය යුතු බව. | 1. අධ්‍යාපනයෙන් ළමයාගේ විඥානය පපුබුදුවාලීම විය යුතුයි.<br>2. ඉගෙනීම යනු හිස් බඳුන් පිරවීමක් නොවේ.<br>3. නිර්මාණශීලී නොවන ගුරුවරයා ළමයා නිර් වින්දකයෙකු බවට පත් කරයි.<br>4. දැනුම ගබඩා කිරීම අධ්‍යාපන නොවේ. | 1. වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳ සංකල්පය.<br>2. ඉගෙනීම යනු සාක්ෂරතාවය ම නො වේ ය යන අදහස.<br>3. අධ්‍යාපනයේ බැංකු සංකල්පය තුළින් තරගකාරී බව සහ සමාජ අසහනය ඇති වීම.<br>4. ළමුන් තෝරා බේරා ගෙන ඉගැන්වීම නොකළ යුතු බව.<br>5. සමාජ දරිද්‍රතාවයට හේතුව අධ්‍යාපන අවස්ථා අහිමි වීම බව. |

# 5. අධ්‍යාපන පරමාර්ථ -1

| අධ්‍යාපන පරමාර්ථ | අධ්‍යාපන අරමුණු | අධ්‍යාපනයේ සුවිශේෂී අරමුණු තීරණය කිරීමට දාර්ශනික චින්තාවන් ගේ බලපෑම |
|---|---|---|
| අධ්‍යාපන පාරිභාෂික වචන :<br>**Golas / objectives** - පරමාර්ථ / අරමුණු / අපේක්ෂා / ඉලක්ක (මලලසේකර ශබ්ද කෝෂය)<br>අධ්‍යාපන අපේක්ෂණ : **Educational Expectation .**<br>අධ්‍යාපන අරමුණු /අභිමතාර්ථ : **Educational Aims**<br>අධ්‍යාපන නිෂ්ටාවන් : **Educational Inocence**<br>මෙම වචනාර්ථ වල සුළු සුළු වෙනස්කම් ඇතත් අදහස බොහෝ දුරට සමානයි.<br>**Golas /Objectives**<br>පරමාර්ථ නිර්වචනය : සංකල්පීය ලෙස ඉතා පුලුල් ය.සීමාවන් දැක්විය නොහැක.එය සාමාන්‍ය දිශාභිමුඛකරණයක් කරයි.<br>අධ්‍යාපන පරමාර්ථ :<br>1. පුද්ගලයා මෙන්ම පොදු සමාජයේ ප්‍රගතිය තහවුරු කිරීම සඳහා සකස් කළ ඇගයුම් විශේෂයකි.<br>2. අධ්‍යාපන පරමාර්ථ දිගුකාලීනව ඉටුකරගත හැකි බලාපොරොත්තුවකි. සෑම පරමාර්ථයක් ම දිගුකාලීනයි. ( බෙරී සහ ලී කිං )<br>3. රටකහෝ සමාජයකට ගැළපෙන ලෙස අධ්‍යාපනය හැසිරවීමට මූලික වන්නේ අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු යි.<br>4. ' සෑම අධ්‍යාපන පරමාර්ථයක් ම රටක ජීවන දර්ශනය හා සම්බන්ධව සිටින නිසා එහි විශ්වීය පරමාර්ථ දැක්වීම අපහසුයි.<br>( සර් පර්සිනන් )<br>අධ්‍යාපනයේ මූලික පරමාර්ථ :<br>• ළමයාට ස්වකීය පෞද්ගලික මෙන්ම සමාජයීය ජීවිතය ඵලදායීව ගත කිරීමට අවශ්‍ය උසස් මානසික ලක්ෂණ ප්‍රගුණ කිරීම .<br>• මානසික වර්ධනය සහ සංවර්ධනය තුළ විචාර පූර්ව ස්වභාවය ඇති කිරීම .<br>• දැනුම රැස් කිරීමට පෙළඹවීම.<br>• ජෝන් ඩුවී ට අනුව ළමයාට තමා ලබන දැනුම හා අත්දැකීම් සමුදාය යළි යළිත් අලුත් වැඩියාවට අනුබල දීම ද අධ්‍යාපන පරමාර්ථ යකි.<br>• වයිට් හෙඩ් දක්වන්නේ ' පාරම්පරික ව සමාජය අනුදත් සිරිත් විරිත් නීති රීති ඇදහිලි විශ්වාස ආදියට ගරු කිරීමට ළමයා පුහුණු කිරීම ද ,<br>• ආර්.එස්.පීටර්ස් ට අනුව ' සමාජයේ විසින් අටවනු ලබන දේශපාලන සංස්කෘතික සාමාජීය ආකෘති වලින් වියුක්තව ළමයාට නිදහස ලබා දීමටත් එතුලින් ඒ තුළින් මානසික කුසලතා පුබුදුවාලීම ද අධ්‍යාපන පරමාර්ථයකි.<br>• **UNESCO** දක්වන ජාත්‍යන්තර පොදු අධ්‍යාපන පරමාර්ථ.<br>1. විද්‍යාත්මක මානව වාදය කරා.<br>2. නිර්මාණ ශක්තිය කරා.<br>3. සමාජ වගකීම් කරා.<br>4. සුපිරි මිනිසා කරා. | අධ්‍යාපන පරමාර්ථ ඉටුකරගැනීම සඳහා අධ්‍යාපන අරමුණු යෝජනා කෙරේ.<br>අධ්‍යාපන පරමාර්ථ මෙන්ම අධ්‍යාපන අරමුණු ද රටින් රටට වෙනස් වේ.<br>(සමාජවාදී රටවල නිෂ්පාදන ශ්‍රමිකයෙක්,<br>ඇමෙරිකාව පිරිසිදු ඇමෙරිකානුවෙක් ,ටැන්සානියාව ස්වයං විශ්වාසය ඇත්තෙක් ,ශ්‍රී ලංකාව සුසමාහිත පෞරුෂයක් ).<br>ශ්‍රී ලංකාව ප්‍රථම වරට ජාතික අරමුණු පද්ධතියක් හඳුන්වාදෙන ලද්දේ 1992 දීය.ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ යෝජිත මෙම අරමුණු සංඛ්‍යාව 9 කි.<br><br>ජාතික පොදු අරමුණු 2009<br>• මව්බිම වෙනුවෙන් කැපවෙන ආත්මාභිමානී පුර වැසියෙක්<br>• සාරධර්ම පිරි පුරවැසියෙක් .<br>• නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙක්<br>• නිර්මාණශීලී බුද්ධිමතුන්,ව්‍යවසායකයන් ,නායකයන්,ශ්‍රමදායකයන් බිහි කිරීම .<br>• විභව ශක්තියෙන් යුතු යුග පුරුෂයන්<br>• නූතන විද්‍යාත්මක දැනුම පෝෂණය<br>(මෙම අරමුණු ගුරු අත් පොත් වල දැක්වේ.ඒවා අධ්‍යයනය කරන්න.) | 1. තාගොර් : යටත්විජිත සංස්කෘතියට එරෙහි දේශීය සංස්කෘතියක්.<br>2. ගාන්ධි : නිෂ්පාදනය හා ආර්ථිකය ප්‍රමුඛ කරගත් අධ්‍යාපනයක්.<br>3. ක්‍රිෂ්ණමූර්ති : නිවැරදි ආකල්ප හා කෞශල්‍යය.<br>4. ප්ලේටෝ : උගත් පුරවැසියෙක්<br>5. රූසෝ : හැකියාවන්ට අනුව අධ්‍යාපනය.<br>6. මාක්ස් : ආර්ථිකයට ගැලපෙන ගැලපෙන ශ්‍රම බලකායක්.සමාජ අසමානතා අඩු කරන අධ්‍යාපනයක්.<br>7. ඩුවී : සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතයට ගැනීම .<br>8. නියරේරේ : ශ්‍රමාභිමානී ආර්ථිකයක්. |

# 5. අධ්‍යාපන පරමාර්ථ - II

| ශ්‍රී ලංකාවේ ලංකාවේ ජාතික අධ්‍යාපන අරමුණ (1992-2003) දාර්ශනික චින්තාවන් අතර සබඳතාවය | ශ්‍රී ලාංකිකයෙකු බිහිකිරීම සඳහා අධ්‍යාපන අරමුණුවල දායකත්වය | ජාතික ඒකාග්‍රතාවය සඳහා අධ්‍යාපනය | විශ්ව පුරවැසියකු පුරවැසියකු බිහි කිරීමට ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු වල දායකත්වය |
|---|---|---|---|
| 1992 ජාතික අධ්‍යාපන අරමුණු : ජා.අ.කො. "සම්පූර්ණ මිනිසෙකු බිහි කිරීමේ අධ්‍යාශයෙන් කෙරෙන ශාරීරික ,බුද්ධිමය ,භාවාත්මක හා ගුණාත්මක සංකලනයක් ලෙස අර්ථ දක්වයි.<br>1. ක්‍රියාශීලි ජාතික ඒකාබද්ධතාව,ජාතික අන්‍යොන්‍යතාවක් හා ජාතික සමගියක් ගොඩනැගීම.<br>(ගාන්ධි සහ තාගෝර් ගේ දේශීය සංස්කෘතිය යන අදහස)<br>2 . පෘථුල සමාජ සාධාරණ රටාවක් පිහිටුවීම . (මාක්ස් : සමාජ අසමානතා අඩු කරන අධ්‍යාපනයක්. නියරේරේ : අධ්‍යාපනයේදී සැමට සමාන අයිතිවාසිකම් ලැබිය යුතු බව.<br>3.දැරිය හැකි ජීවන රටාවක් ගොඩ නැගීම . මාක්ස් : ආර්ථිකයට ගැලපෙන ශ්‍රම බලකායක්.<br>ඩුවී: සම්පත් කාර්යක්ෂමව හා උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම .<br>4.ඵලදායී වූත් ආත්ම තෘප්තිය ලැබීමට මග සලසන්නා වූත් ජීවනෝපායන් හා රැකියා අවස්ථා සොයා යාම.<br>ගාන්ධි : නිෂ්පාදනය හා ආර්ථිකයේ ප්‍රමුඛ කරගත් අධ්‍යාපනය .<br>නියරේරේ : ශ්‍රමාභිමානය සහ වෘත්තියාභිමුඛ ඉගෙනුම් .<br>5.රටේ සාමාජීය හා ආර්ථික වර්ධනයට ආධාර වන මානව සම්පත් සංවර්ධනය. කන්නන්ගර : ලෝකෝත්තර පැවතුණු සඳහා සඳහා ජීවිතය පිළියෙල කිරීම.<br>6. ජාතිය ගොඩනැගීමේ කටයුතු වලට සම්බන්ධව වීම. ගාන්ධි : ක්‍රිෂ්ණමූර්ති<br>දේශීය සංස්කෘතියක් ගොඩනැගීම.<br>7. වෙනස්කම් වලට ගැලපෙන පරිදි ඉගෙනීම හා සකස් වීමේ ශක්තිය උදා කර ගැනීම. ක්‍රිෂ්ණමූර්ති : නිවැරදි ආකල්ප හා කෞශල්‍යයන්.<br>ප්‍රෙයරේ: අත්දැකීම් තුළින් ඉගෙනීම.<br>8. ව්‍යාකූල වූත්,අනපේක්ෂිත වූත් අවස්ථාවන්ට මුහුණ දීම හා සංරක්ෂිත හැඟීම් ඇති කර ගැනීම.<br>මොන්ටිසෝරි : ළමයා තමාම උගනී.නව අවස්ථාවන්ට නොබියව මුහුණ දෙයි.<br>මාක්ස් : වර්තමානයට හා අනාගතයට යෝග්‍ය අධ්‍යාපනය.<br>ඩුවී : අධ්‍යාපනය යනු ජීවිතයට සහභාගි වීම<br>9. ජාත්‍යන්තර සමාජයේ ගෞරවනීය ස්ථානයක්. ඩුවී: නූතන ගෝලීය<br>සමාජ පෙරළිය ට ගැලපෙන අධ්‍යාපනයක්.<br><br>2003 ජා.අ.අරමුණු සංඛ්‍යාව 8 ක් වූ අතර,අදහස් අතින් විශාල වෙනසක් නොවීය. | 1. ජාතිය ගොඩනැගීම සඳහා ප්‍රධාන මෙවලමක් ලෙස අධ්‍යාපනය යොදාගත යුතු බව ජා.අ.කො.නිර්දේශ කර තිබීම.<br>2. සාරධර්ම අධ්‍යාපනයට මුල් තැනක් ලබා දීම.<br>3. ජාතික අධ්‍යාපන අරමුණු ඉටුවන ආකාරය ට විෂය අරමුණු,විෂය අන්තර්ගතය,ඉදිරිපත් කිරීමේ ක්‍රමවේද සහ ඇගයීම් පුලුල් කිරීම . | 1. බහු ජාතික ,බහු වාර්ගික සමාජයේ අගය පිළි ගැනීම .<br>2. ජාතිය ගොඩනැගීමේ දී සහජීවනය හුරු පුරුදු කරවීම.<br>3. ජාතික සමගියට අදාළව සමාජ පුහුණුව ලබාදීම සඳහා සෑම විෂයයකටම ජාතික සමගියට අදාළ තේමා ඇතුළත් කිරීම . | 1. ජාත්‍යන්තර ප්‍රජාව පිළිබඳ අවබෝධය හා බලය,ආර්ථිකය, වෙළඳාම ආදී අංශ වලින් තම රට අන්තර් ජාතික ක්ෂෙත්‍රයේ හිමිකර ගන්නා තැන පිළිබඳ හැඟීම.<br>2. මිනිස් ජීවිතය හා මානව අයිතීන් පිළිබඳ අවබෝධය .<br>3. ප්‍රජාතන්ත්‍රවාදී ආයතන වල ඵලදායී බව,උද්දීප්තිමත් බව ගැන දැන සිටීම .<br>4. ලොව විවිධ ජන කණ්ඩායම් වල විවිධත්වය හා සාරවත් බව අවබෝධ කර ගැනීම .<br>5. අන්තර්ජාතික සහයෝගිතාව හා තරඟකාරිත්වය හඳුනා ගැනීම.<br>6. නොයෙක් අංශ වලින් උසස් ජීවන තත්ත්වයක් අත්පත් කර ගැනීම .<br>7. මෙරට නිෂ්පාදනය වන භාණ්ඩ වල ජාත්‍යන්තර ප්‍රමිතිය සහතික කර ගැනීම .<br>8. මෙරට තරුණ පරපුරේ බුද්ධිමය සේවා දායකත්වය ලෝකයට ලබා දීමට ඉඩ හසර විවර කිරීම .<br>9. සැමට අධ්‍යාපනය ,ජාතික සමගිය,ප්‍රජාතාන්ත්‍රික මූලධර්ම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය,මානව හිමිකම්,පරිසර සුරක්ෂිතාව වැනි සංකල්ප අරමුණු වලට එකතු කිරීම .<br>10. ' ගෝලීය පුරවැසියෙක් ' ලෙස කටයුතු කිරීමට පුහුණු කිරීම . |

# 6. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරමාර්ථ විකාශනය - I

| යුගය/දශකය | අධ්‍යාපන පරමාර්ථ | පරමාර්ථ ඉටුකර ගැනීමට යෝජිත අරමුණු |
|---|---|---|
| 16 සියවස දක්වා<br>මුල් යුගය | බෞද්ධ අධ්‍යාපන ප්‍රතිපත්ති<br>පංච ශීලය,සතර බ්‍රහ්ම විහරණ,සතර සංග්‍රහ වස්තු ,සප්ත අපරිහානී ධර්ම,දසරාජ ධර්ම<br>(දෙලොව සැපත අරමුණු කරගත් ඉගෙනුම් ක්‍රම ) | 1.පුද්ගල පෞරුෂ වර්ධනය .<br>2. ලෞකික ජීවිතයේ ගති පැවතුම් .<br>3. සසර දුකින් මිදී නිවන් අවබෝධය |
| යටත් විජිත යුගය | පෘතුගීසි සහ ලන්දේසි යුගවල අධ්‍යාපන පරමාර්ථ වූයේ ආගම පැතිරවීමයි.<br>ඉංග්‍රීසි යුගයේදී වැවිලි ආර්ථිකයට සුදුසු සමාජ පන්තියක් ගොඩ නැගීම | 1. ස්වදේශිකයන් තම ආගම්වලට හරවා ගැනීම.<br>2. වෙළඳ කටයුතු වලට සහාය වර්ධනය කර ගැනීම .<br>3. ආගම තුළින් පාලනයේ අවනත බව ලබා ගැනීම .<br>4. ආගම වැළඳ ගත් අයට අධ්‍යාපන අවස්ථා පුලුල් කිරීම .<br>5. පාලනයට අවශ්‍ය මධ්‍ය පන්තික උගතුන් පිරිසක් බිහි කර ගැනීම . |
| නිදහසින් පසු<br>50 දශකය | 1. යටත් විජිත සංස්කෘතියට එරෙහිව අධ්‍යාපනය තුළින් දේශීය සංස්කෘතිය ක් ගොඩ නැගීම .<br>2. බහු වාර්ගික එකතුවකින් ශ්‍රී ලාංකීය ජන සමාජයක්.<br>3. ආර්ථිකයට ගැලපෙන ශ්‍රම බලකායක්<br>4. අධ්‍යාපනය සමාජ සචල කාරකයක් බවට පත් කිරීම . | 1 මව්බසින් අධ්‍යාපනය .<br>2 ම.ම.වි.පිහිටුවීම .<br>3. දිවා අහාරය/ශිෂ්‍යත්ව දීම<br>4.විෂය විවිධාංගීකරණය<br>5.වැඩිහිටි සාක්ෂරතාව<br>6.පාසල් රජයට පවරා ගැනීම |
| 60 දශකය | 1. නිවැරදි ආකල්ප හා කුසලතා වර්ධනය .<br>2. නිෂ්පාදනය හා ආර්ථිකය ප්‍රමුඛ කොට අධ්‍යාපනය සැලසුම් කිරීම .<br>3. කාර්යක්ෂම අධ්‍යාපන පරිපාලනය<br>4. ගුණාත්මක හා ප්‍රමාණාත්මක අධ්‍යාපන සංවර්ධනය<br>5. මව් බසින් ඉගෙනීමේ බාධා දුරු කිරීම . | 1. විවිධ දක්ෂතා වලට ගැලපෙන අධ්‍යාපන ආයතන .<br>2. 5 – 14 ළමුන්ට ක්‍රියාකාරී විෂය මාලාවක්<br>3. අත්දැකීම් වලින් ඉගෙනුම්<br>4. දක්ෂතා අනුව විෂය ධාරා වලට වෙන්කිරීම් .<br>5. 1966 විශ්වවිද්‍යාල කොලීජ් මගින් වෘත්තීයාභිමුඛ පාඨමාලා .<br>6. මව්බසින් වි.වි .අධ්‍යාපනය<br>7. විෂය මාලා පුහුණු මධ්‍යස්ථානයක්<br>8. ක්‍රමවත් ගුරු පුහුණුවීම් |
| 70 දශකය | 1.ආර්ථික දියුණුවක් සමග පරිපූර්ණ ජීවිතයක්.<br>2. දේශීය සම්පත් උපයෝගී කරගත් නව අධ්‍යාපන රටාවක්<br>3. ආර්ථිකයට ගැලපෙන ශ්‍රම බලකායක්<br>4. නුගත්කම හා දුප්පත්කම දුරලීම | 1. ප්‍රාථමිකයට සමෝධානිත ඉගෙනුම්<br>2. කණිෂ්ඨ ද්විතීයික මට්ටම ට විද්‍යාව<br>3. පාසල ප්‍රජාවට සමීප කිරීම .<br>4. ප්‍රාග් වෘත්තිය විෂයයන් ඇරඹීම .<br>5. විෂය මාලා ප්‍රතිසංස්කරණ |
| | | |

# 6. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරමාර්ථ විකාශනය - II

| | | |
|---|---|---|
| 80 දශකය | 1981 ධවල පත්‍රිකාව ට අනුව:<br>1. ආර්ථික සමාජීය ,සදාචාර ,දේශපාලනික වශයෙන් ජාතික අවශ්‍යතා ඉටුකර ගැනීම .<br>2. උගත් පුරවැසියෙක් බිහි කිරීම .<br>3. රැකියා වෙළෙඳ පලට සුදුසු අධ්‍යාපනයක්.<br>4. හැකියාව අනුව වැඩිදුර අධ්‍යාපනය .<br>5. ඉගෙනුම් ලොවෙන් වැඩ ලොවට.<br>6. යාවජීව අධ්‍යාපනයක්.<br>7. සමබර ,සමෝධානිත ජාතික අධ්‍යාපන ක්‍රමයක් . | 1. විවෘත්ත විශ්ව විද්‍යාලය ඇරඹීම .<br>2. පාසල් පර්ෂද හඳුන්වා දීම<br>3. නව ගුරු පුහුණු ක්‍රමවේද .<br>4. ජාතික අධ්‍යාපන ආයතනය ඇරඹීම .<br>5. අධ්‍යාපන කළමනාකරණය විධිමත් කිරීම .<br>6. නව ඇගයීම් ක්‍රම හඳුන්වා දීම.<br>7. වතු පාසල් නගා සිටුවීම .<br>8. පාසල් කලාප පිහිටුවීම .<br>9. නොවිධිමත් ඉගෙනුම් දිරිගැන්වීම<br>10. පරිගණක විද්‍යාව විෂය මාලාවට<br>11. අඛණ්ඩ ඇගයීම ඇරඹීම .<br>12. ජීවන කුසලතා විෂය .<br>13. අධ්‍යාපන සේවා කමිටුව පිහිටුවීම |
| 90 දශකය | 1. ප්‍රජාතන්ත්‍රවාදයට වඩ වඩාත් නැඹුරුව බලය පැවරීම හා සංවාදය<br>2. සම අධ්‍යාපන අවස්ථාවන්.<br>3. ආදායම,ධනය,වර ප්‍රසාද,ප්‍රතිලාභ අතර අසමානතා අඩුකිරීම .<br>4. හිග ජාතික සම්පත් කාර්යක්ෂම හා උපරිම ලෙස ප්‍රයොජනයට ගැනීම .<br>5. අසීමාන්තික පරිභෝජනය වැලක්වීම .6.විවධත්වය ප්‍රකාශිත සාරධර්ම සහ සමාජ සංස්ථා ස්ථාපිත කිරීම . | 1. ශ්‍රේණි ගත තාක්ෂණික අධ්‍යාපනයක්.<br>2. පාසල් කළමනාකරණ මණ්ඩල පිහිටුවීම .<br>3. ත්‍රි භාෂා පරීක්ෂණය .<br>4.දෙවන,තෙවන බස ඉගෙනුම ඇරඹීම .<br>5. ගුරු උපදේශකවරු පත්කිරීම<br>6. ජාතික අධ්‍යාපන කොමිසම පිහිටුවීම<br>7. ගුරු / විදුහල්පති සේවා පිහිටුවීම . |
| 2000 න් පසු | 2. ජාත්‍යන්තර අධ්‍යාපනය පිළිබඳ යුරෝපා කොමිසම ඉදිරිපත් කළ වාර්තාව : (ඩෙලෝ වාර්තාව )<br>• දැන ගැනීම සඳහා අධ්‍යාපනය learning to know<br>• යමක් කිරීම සඳහා අධ්‍යාපනය learning to do<br>• එකමුතුව සඳහා අධ්‍යාපනය learning to live together<br>• පැවත්ම සඳහා අධ්‍යාපනය learning to be<br>මෙය පදනම් කර ගනිමින් ජාතික පොදු අරමුණු 9 නිපුණතා 5 | 1.අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහන යටතේ (education sector development frame work programme 2006 – 2010) ප්‍රධාන තේමා හතරක් හඳුන්වාදීම.<br>• මූලික හා ද්විතීක අධ්‍යාපනය ට ළඟාවීම සඳහා සම අධ්‍යාපන අවස්ථා .<br>• ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපයේ ගුණාත්මක තත්ත්වය නංවාලීම.<br>• සම්පත් වෙන් කිරීමේ සමානාත්මතාව හා ආර්ථික සඵලත්වය වැඩි දියුණු කිරීම .<br>• අධ්‍යාපන පාලනය ශක්තිමත් කිරීම හා දෙනඅ ලබන සේවා ශක්තිමත් කිරීම .<br>(2)තෝරා ගත් ද්විතීයික පාසල් 1000 හා ප්‍රාථමික පාසල් 5000 සංවර්ධනය (the flag ship flag programme)<br>(3) මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 1000.<br>(4) ළමා මිතුරු පාසල් සංකල්පය .<br>(5) වතු පාසල් සංවර්ධන විශේෂිත වැඩ සටහන.<br>(6) අනු කලන (Inclusive)අධ්‍යාපනය සංවර්ධනය .<br>(7) වෘත්තීය ප්‍රවේශය (2015)<br>(8) Smart Class room වැඩ සටහන.<br>(9) කාර්ය බද්ධ සාක්ෂරතා වැඩ සටහන (Functional literacy center )<br>(10) ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථාන (Community development center ) වැනි ආයතන පිහිටුවීම.<br>(11) ගුරු වෘත්තීය සංවර්ධන වැඩ සටහන් /පාඨමාලා |

# 7. යාවජීව අධ්‍යාපනය

| යාවජීව සංකල්පය හැඳින්වීම | යාවජීව අධ්‍යාපන සංකල්පයේ දාර්ශනික පදනම |
|---|---|
| 'පුද්ගලයාගේ උපතේ සිට විපත දක්වාත් ඔහුගේ ජීවිතයේ විවිධ අංශයන් පිළිබඳව නිබඳව ඉගෙනුම ලබමින් ජීවත්වන ක්‍රියාවලියකි.'<br><br>අධ්‍යාපනය පිළිබඳ සමස්ත වුත් ,නිර්මාණාත්මකවුත් නව අර්ථ කථනයක් ගෙනෙන්නාවුත් එහි ගැඹුරු අර්ථය ක්‍රමයෙන් සොයා ගනිමින් නැවත නැවත සංස්කරණය වන්නාවුත් යන අදහස යාවජීව අධ්‍යාපනය යන වචනය තුළ ඇත. එය නව අධ්‍යාපන ව්‍යවහාරයකට මග පෙන්වන්නකි.පවතින අධ්‍යාපන රාමුව ට කොටු වන්නක් නොවේ.<br>යාවජීව අධ්‍යාපනය සාමාන්‍ය අධ්‍යාපනය තුළ ඇති පටු ආකල්ප සීමා,බන්ධන වලින් බැහර වේ.<br>එය පුද්ගලයාට අනියත,අසීමිත,අනේකවිධ වුත් ,දිනපතා වෙනස්වන දැනුම් ප්‍රවාහයකට ,ඥාන සම්භාරයකට පිවිසීමේ මංපෙත් සලසයි.<br>1990 ජොම්තියන් නුවර 'Education For All ' (සැමට අධ්‍යාපනය ) සම්මේලනය මෙම සංකල්පය ලෝකය පුරා ව්‍යාප්තියට මග හෙළි විය.<br>යාවජීව අධ්‍යාපනය Life Wide Education (ජීවිත ව්‍යාප්ත ඉගෙනුම ) ලෙසද හඳුන්වයි.<br>යාවජීව අධ්‍යාපනයේ අග්‍ර ඵලය නම් Quality Of Life (සමාජ ජීවිතයේ ගුණාත්මකභාවය )ප්‍රගුණ කිරීමයි.<br>යාවජීව ඉගෙනුම වනාහී අධ්‍යාපනයේ නියම අර්ථය අනාවරණය කර ගැනීමකි. එනම් මානව ප්‍රාග්ධනය (Human Capital ) උපරිමයට ගෙන යාමයි. | • ආමෝස් කොමීනියස්.<br>"සැම කෙනෙකුටම තොටිල්ලේ සිට සොහොන් ගැබ දක්වාම ජීවිතය පාසලක් වේ."<br>• ජේ.ක්‍රිෂ්ණමූර්ති .<br>"අප සියලු දෙනාම අධ්‍යාපනය හා පරිසරය මගින් පුහුණු කර ලැබ ඇත්තේ සුරක්ෂිතාවට හා අපගේ ප්‍රශ්න වලට සටන් වැදීමටය.ඊට යාවජීව අධ්‍යාපනය අත්‍යවශ්‍ය වේ."<br>• ආර්.එස්.පීටර්ස්<br>"සංවර්ධිත මිනිසා ( එනම් ජීවිත කාලය පුරාවට ඉගෙන ගන්නා තැනැත්තා ) අධ්‍යාපනයේ අග්‍ර ඵලයයි"<br>• එස්.එස්.මැකන්සි<br>"පෘථුලාර්ථයෙන් ගත් විට අධ්‍යාපන ක්‍රියාවලිය සුජීවිතය පුරාවටම දිවෙන්නකි ."<br>• ප්‍රෙඩ්රික් මයෝරි<br>" අධ්‍යාපනය ආරම්භ කිරීමට මුල පිරීම ඉගෙනීමයි "<br>• ජොර්ජ් සන්තායන<br>"පාසලේදී පමනක් උගත් ළමයා නූගතෙකි"<br>• සී.කාරියවසම්<br>" යාවජීව අධ්‍යාපනය සියලු අධ්‍යාපන ක්‍රම සදහා මාර්ගෝපදේශක මූල ධර්මය වේ ".<br>" යාවජීව අධ්‍යාපනය ,වර්තමාන ජීවිතයේ වැරදි නිවැරදි කිරීමට උපකාරරී වේ."<br>• ඊටින් ලොවෙල්<br>" මිනිසා ඉගෙනීමටම පිළියෙල වී සිටින්නෙකි.එමෙන්ම මිනිසා අධ්‍යයන සත්ත්වයෙකි" මෙම දාර්ශනික සංකල්ප පැහැදිලි කරන්න. |

# 7. යාවජීව අධ්‍යාපනය

| යාවජීව අධ්‍යාපනයේ විවිධ අංශ | ඉගෙනුම් සමාජයක් කරා විධිමත් , අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනයේ දායකත්වය |
| --- | --- |
| 1. විධිමත් අධ්‍යාපනය<br>2. නොවිධිමත් අධ්‍යාපනය<br>3. අවිධිමත් අධ්‍යාපනය<br>4. වැඩිහිටි අධ්‍යාපනය<br>5. ප්‍රජා අධ්‍යාපනය<br>6. සමාජ අධ්‍යාපනය<br>1. විධිමත් අධ්‍යාපනය : නියාමනය කළ අධ්‍යාපනය .නිශ්චිත විෂය මාලාවක් සහිත හිතාමතා සැලසුම් කළ ක්‍රමානුකූල ක්‍රියාවලියකි.<br>2. විධිමත් අධ්‍යාපනය ,අධ්‍යාපන මට්ටම් සහිතය.අනිවාර්ය ශ්‍රේණි සහිත විද්‍යාල සහ පුහුණු ආයතන ඇත. සිවිල් සමාජ කණ්ඩායම් හා සංවිධාන කණ්ඩායම් සමග සම්බන්ධ වේ.<br>3. විවිධ මට්ටම් වලදී දැනුම ,කුසලතා ,හැකියා,සාරධර්ම ,වර්ධනය අරමුණුයි.මෙය මිනිස් සංවර්ධනයේ ස්ථර පදනමයි.<br>2. නොවිධිමත් අධ්‍යාපනය :<br>1. සියලු ළමුන් ,වැඩිහිටියන්,විධිමත් අධ්‍යාපනයෙන් බැහැර වුවන් ,විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ කුසලතා ඉහළ නැංවීමට යොදා ගන්නා අධ්‍යාපනය .<br>2. අනිවාර්ය අධ්‍යාපන වයසේ සිටින (අවු.5- 16) ළමුන් සඳහා අධ්‍යාපන අවස්ථා සැලසීම.<br>3. මූලික සාක්ෂරතා වැඩ සටහන්,කාර්ය බද්ධ සාක්ෂරතා වැඩ සටහන්,මාවත්වාසී,බන්ධනාගාර රැඳවියන්ආදීනට අධ්‍යාපනය ,<br>4.පාසල් හැර ගිය අය සඳහා වැඩ සටහන් ව්‍යවසායකයනට වැඩ සටහන්,වෘත්තිකයන්ට ධාරිතා සංවර්ධනය ,කාර්මික ,කෘෂි අංශයනට නව ක්‍රමවේද හඳුන්වාදීම ද නොවිධිමත් අධ්‍යාපන අංශය ට ඇතුළත් වේ.<br>අන්තර්කරණ අධ්‍යාපනය ද ඇතුළත් ය.<br>3 අවිධිමත් අධ්‍යාපනය :<br>මිනිසුන් ,ආයතන ,ජන මාධ්‍ය ,මුද්‍රිත මාධ්‍ය ,සම්ප්‍රදායන්,සිරිත් විරිත්,සමාජ හැසිරීම් සහ අනෙකුත් ව්‍යුහ ගත නොවන සියල්ලෙන් නිදහස් ස්වයං සිද්ධව ලබන දැනුම - අවිධිමත් අධ්‍යාපනය යි.<br>පුහුණුව අක්‍රමත්ව සිදුවේ .විෂය මාලා ප්‍රගතිශීලී ය.ගුරුවරුන් නැත.නීති රීති නැත .ස්වයං සිද්ධව සිදුවේ .<br>4. ප්‍රජා අධ්‍යාපනය<br>මෙය, ප්‍රජා පාදක අධ්‍යාපනය ,ප්‍රජා ඉගෙනුම් හා සංවර්ධනය යන ලෙසද හඳුන්වයි .විධිමත් අවිධිමත් ඉගෙනුම් ක්‍රම රැසක් භාවිතා කෙරේ.<br>පුද්ගලයා සහ සමාජ කණ්ඩායම් සංවර්ධනය ට යොදා ගනී.අවිධිමත් අධ්‍යාපන ලක්ෂණ ඇතුළත් වේ.පැව්ලෝ ප්‍රේරි වඩාත් අගය කළ ක්‍රම වේදයයි.<br>5. වැඩිහිටි අධ්‍යාපනය<br>පන්ති කාමර ඉගෙනුමක සිට ස්වයං සිද්ධ ඉගෙනුම දක්වා විවිධ අවස්ථා වල දැකිය හැක.<br>සම්ප්‍රදායික අධ්‍යාපනයෙන් ඔබ්බට ගිය,සාක්ෂරතාවෙන් යුත් අධ්‍යාපනය කි.<br>පරිණත වූ ඉගෙනුම් ,දැන ගත යුතු දේ ගැන ඉගෙනුම් ,ගැටලු කේන්ද්‍රීය ඉගෙනුම් සිදු කෙරේ.<br>මූලික කරුණු ක්‍රියාකාරී සාක්ෂරතාව යි.ස්ත්‍රී පුරුෂ සමාජ භාවය,විවිධ සමාජ ගැටලු සඳහා උපකාරී ඉගෙනුමකි. | 1. **Learning ;The Treasure Within** වාර්තාවේ අධ්‍යාපනයේ දක්වන කුලුණු 4 අවසාන කුලුණ වන්නේ මෙම අධ්‍යාපන ක්‍රමවල සම්පිණ්ඩනය යි.(**Learning to Live Together** )<br>2. යාවජීව අධ්‍යාපනය වර්ගීකරණය :<br>1. පොදු අධ්‍යාපනය<br>2. වෘත්තීය අධ්‍යාපනය<br>මේවා එකිනෙකට වෙනස් නොවන අතර,එකිනෙකට සමීපතාවක්ද පවතී.<br><br>3. වැඩ කිරීමට ඉගෙනීම<br>• සෑම ඉගෙනුමක්ම වැඩ ලෝකයට සම්බන්ධ විය යුතුයි .<br>• අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දිය හැකි විය යුතුයි .<br>• ආරම්භක ශක්තිය,සහයෝගයෙන් වැඩ කිරීම ,අවදානමට මුහුණු දීම හුරු කළ යුතුයි .<br>• පාසල වැඩපලක් විය යුතුයි .<br><br>4. අනාගතයේදී නූගතා වන්නේ කියවීමට බැරි පුද්ගලයා නොව ඉගෙන ගන්නා හැටි නොදන්නා පුද්ගලයා යි.මෙම අදහස විමසන්න.<br>5. පවතින අධ්‍යාපන ක්‍රමයේ යාවජීව අධ්‍යාපන ලක්ෂණ අඩුයි.ප්‍රේරේ ට අනුව 'එය නිශ්ශබ්ද අසා සිටීමකි'.<br>6. පුද්ගලයා සමාජ ගත වන විට ඔහුගේ කාර්ය භාරය විවිධ වේ.ඊට යාවජීව අධ්‍යාපනය අවශ්‍යයි .<br>7. ගෝලීයකරණය නිසා රැකී රක්ෂා නවීකරණය වේ.ඒ සඳහාද යාවජීව අධ්‍යාපනය අවශ්‍යයි.<br>8. සමාජයක වටිනාකම දැනුම හා පුහුණුව යි.ඊටද යාවජීව අධ්‍යාපනය වැදගත් වේ.<br>යාවජීව අධ්‍යාපනය සමාජගත ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරයි. |

# අධ්‍යාපනයේ නව ප්‍රවණතා

| නව ප්‍රවණතා හැදින්වීම /නිර් වචන | අධ්‍යාපනයේ නව ප්‍රවණතා විමර්ශනය කළ හැකි විවිධ දෘෂ්ටි කෝණ |
|---|---|
| • **Trend** මලලසේකර ශබ්ද කෝෂයට අනුව ප්‍රවණතාව,නැඹුරුව ,නැම්ම යන අර්ථ දක්වයි.<br>• අධ්‍යාපනයේ නව ප්‍රවණතා :<br>1. දැනට මෙරට පවතින සමාජ ,දේශපාලන ,ආර්ථික අර්බුද හමුවේ බිඳ වැටුණු පාසල් අධ්‍යාපනය .<br>2. විශ්ව විද්‍යාල විවෘත නොවීම තුළ ශිෂ්‍ය අරගල.<br>3. කොරෝනා වසංගතය මත අඩාල වූ අධ්‍යාපනය .<br>4. මාර්ගගත ඉගෙනුම් ප්‍රචලිත වීම.<br>5. පාසල් දරුවන් අතර මන්ද පෝෂණය .<br>6. පාසල් යාම හා අධ්‍යාපනය අතර හිදැස.<br>7. අධ්‍යාපනයේ විභාග තරගකාරිත්වය .<br>8. උපකාරක පන්ති සමාජ රැල්ල<br>9. අධ්‍යාපන ආයතන වල අධිකාරිත්වය .<br>10. විදෙස්වල අධ්‍යාපනය සඳහා ඉල්ලුම ඉහළ යාම.<br>11. පෞද්ගලික විශ්වවිද්‍යාල කරා ඇති තරගකාරී ආකර්ෂණය. | • ඉගෙනුම් ලාභියාගේ පාර්ශවයෙන්<br>1.ඉගෙනීම දැනීම ගබඩා කිරීමක් ලෙස සැලකීම.<br>2. ආර්ථික වශයෙන් වඩාත් ලාභදායී විෂය පාඨමාලා තෝරා ගැනීම.<br>3. නාගරික ශිෂ්‍යයා ජාත්‍යන්තරකරණය වීම.<br>4. අර්ධ නාගරික ශිෂ්‍යයා ජාතිකකරණය වීම .<br>5. ග්‍රාමීය අඩු වරප්‍රසාදිත ශිෂ්‍යයා අධ්‍යාපනයෙන් විතැන්වීම.<br>6. පාසල් අධ්‍යාපනය ගැන විශ්වාසය බිඳ වැටීම.<br>7.විභාග ඉලක්ක ,අධ්‍යාපනයකට විශ්වාසය තැබීම.<br><br>• විෂය මාලාවෙන් : නව ප්‍රවණතා<br>1. ජෝන් .එප්.කර් ට අනුව වර්තමානයේදී පාසල විසින් සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලබන සියල්ල විෂය මාලාවයි.<br>2. පූර්ණ විෂය මාලාව විධිමත් සහ අවිධිමත් ලෙස සංවර්ධනය වීම.<br>3. සැඟවුණු විෂය මාලාව පාසල් සංස්කෘතිය පෙන්වන කැඩපත බව.<br>4. 20සියවසේදී ඥාන වර්ධනය සහ ගුණ ධර්ම වර්ධනය වැදගත් ලෙස.සැලකුවද, 21 සියවසේදී ජීවත්වීමේ දක්ෂතා වඩා වැදගත් බව.<br>විෂය මාලාව සාම්ප්‍රදායික පන්ති කාමරයට සීමා නොවී අවිධිමත් ක්‍රම ඔස්සේ දරුවාට ළඟා කරවීම වඩා ඵලදායී බව.<br><br>• ගුරු කාර්ය භාරයෙන් : නව ප්‍රවණතා<br>1. නූතන ගුරු භූමිකාව පරිණාමන ගුරු භූමිකාව දක්වා සංවර්ධනය .<br>2. ගුරුවරයා සම්පත්දායකයෙක් ලෙස.<br>3. විෂය විශේෂඥයෙකු ලෙස.<br>4. ගුරුවරයාගේ සමාජ භූමිකාව පුළුල් වීම.<br>5. ගුරු භූමිකාව වෘත්තීය භූමිකාවක් දක්වා පුළුල් වීම. |

# අධ්‍යාපනයේ නව ප්‍රවණතා

| අධ්‍යාපනයේ නව ප්‍රවණතා විමර්ශනය කළ හැකි විවිධ දෘෂ්ටි කෝණ | අනාගත සමාජයේ අධ්‍යාපන ලාභියාගේ නිපුණතා |
| --- | --- |
| • ජාතික ගෝලීය අවශ්‍යතා ඔස්සේ : නව ප්‍රවණතා .<br>1. 90දශකයේ හදුන්වා දුන් පොදු නිපුණතා 05<br>2. K.A.S.P.මොඩලය හදුන්වා දීම .<br>3. පාඩම් සටහන වෙනුවට ක්‍රියාකාරකම් සටහන් ක්‍රමය<br>4. නිපුණතා පාදක විෂය මාලා<br>5. එ.ජා.සං මුල්කොට ගත් සම්මුතීන් පිළි ගැනීම .<br>6. ජාත්‍යන්තර සංවිධාන බිහිවීම .(නේටෝ,සාක්,යුරෝපීය සංගමය,ලෝක බැංකුව, IMF වැනි)<br>7. තිරසාර සංවර්ධනය සංකල්පය<br>8. 2017 State of he World වාර්තාව R- 7 සංකල්පය (ප්‍රති චක්‍රීකරණයට අදාළ සංකල්ප)<br>9. ගෝලීය අධ්‍යාපන සංකල්පය සහ ගෝලීය විෂය මාලා හදුන්වා දීම<br><br>• විද්‍යාත්මක සහ තාක්ෂණික නිමැවුම් ඔස්සේ නව ප්‍රවණතා<br>1. ගෝලීය අනාගත අභියෝග ; සම්පත් ක්ෂයවීම,පරිසර ,සාගර දූෂණ,අධි පරිභෝජනය,යුද්ධ ,ජන ගහනය පුපුරා යාම,මත්ද්‍රව්‍ය ,සරණාගතයන් ,HIV/ AIDS ,වසංගත,නාගරීකරණයන් ,මානව හිමිකම්,කාන්තා /ළමා හිංසන වැනි අංශ<br>2. අධ්‍යාපනයේ කාර්ය භාරය වන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නොව පූර්ණ අධ්‍යාපන වෙනසක් බව.<br>3. සියල්ලන්ටම ගෝලීය සාක්ෂරතාව ලබා දිය යුතු බව.<br>4. පාසල සමස්ථ මොලය පදනම් කර ගෙන ඉගැන්වීම් .<br>5. තාක්ෂණය ස්වයං ඉගෙනුමකට යොමු කිරීම.<br>6. ඉගෙන ගන්නා හැටි ඉගැන්වීම. | • ආත්ම සම්ප්‍රජානනය.<br>• ශුභවාදී ලෙස සිතීම.<br>• සන්නිවේදන කුසලතා .<br>• විශ්ලේෂණ හැකියාව .<br>• පුරෝකතනය .<br>• නවෝත්පාදනය.<br>• අනුවර්තන හැකියාව.<br>• මෘදු කුසලතා.<br>• ගැටුම් කළමනාකරණය .<br>• සහ කම්පනය.<br>• ප්‍රජාතාන්ත්‍රික පෞරුෂය .<br>• බහු සංස්කෘතික මිත්‍රත්වය .<br>• මානව හිමිකම් සුරකීම.<br>• සෞන්දර්ය කාමිත්වය<br>• දේශාභිමානය .<br>• ලෝකාභිමානය. |

# අධ්‍යාපනය තුළින් සමාජ විශිෂ්ටතාව ඇති කිරීම

| සමාජ විශිෂ්ටතාව හැදින්වීම සහ අවශ්‍යතාව | සමාජ විශිෂ්ටතාව ඇති කිරීම සඳහා අධ්‍යාපනයේ සිදුවිය යුතු වෙනස්කම් | අධ්‍යාපනය තුළින් සමාජ සාරධර්ම පෝෂණය කිරීම | තාක්ෂණික අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම |
|---|---|---|---|
| • අධ්‍යාපන පාරිභාෂික ශබ්ද කෝෂය අනුව විශිෂ්ටතාව උත්කෘෂ්ටතාව ලෙසද හඳුන්වයි .<br>• මලලසේකර ශබ්ද කෝෂය Excellent යන්න උත්කෘෂ්ටතාව ,විශිෂ්ටතාව ,ශ්‍රේෂ්ඨත්වය ලෙස අර්ථ ගන්වා ඇත.<br>• අධ්‍යාපනය තුළින් පස් වැදෑරුම් පුද්ගලයන් බිහිවන බව.<br>1. ප්‍රඥාවන්තයන් - අතිශය බුද්ධිමතුන්<br>2. ප්‍රතිභාවන්තයෝ - නිර්මාණශීලීන්<br>3. විශිෂ්ට බුද්ධිමතුන් - විවිධ ක්ෂෙත්‍ර වල නිපුනයන්<br>4. නිර්මාපකයන් - නව නිපැයුම් කරුවන්<br>5. සහජ කුසලතා ඇත්තෝ - උපතින් හැකියාවන් ගෙන එන්නෝ<br>මෙම පස් වැදෑරුම් පුද්ගලයන් විධිමත් , අවිධිමත් ,නොවිධිමත් ඕනෑම අංශයකින් බිහි විය හැක.දාර්ශනිකයන් බොහෝ දෙනෙක් ශාස්ත්‍රාලීය උගතුන් නොවේ.උගතා සහ බුද්ධිමතා අතර වෙනසක් ඇත.අධ්‍යාපන දාර්ශනිකයන් බොහෝ දෙනෙක් ප්‍රායෝගික බුද්ධිමතුන් ලෙස සැලකේ. | ගෝලීයකරණයට පෙර රට රටවල් අධ්‍යාපනයේ දී ජාතික ගැටලු වලට වැඩි අවධානය යොමු කරන ලද අතර අද වන විට එය විශ්ව ප්‍රජාවීය ලක්ෂණ දක්වා විකාශනය වීමක් දක්නට ලැබේ.විසිඑක් වෙනි සියවසේ අධ්‍යාපන වෙනස්කම් ,සයිබර් අධ්‍යාපන අවස්ථා ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වීම මෙයට හේතු ලෙස දැක්විය හැක.<br>මේරි.එම්.මෙරිපිල්ඩ් සමාජ විද්‍යාඥවරිය අධ්‍යාපනයේ විශිෂ්ටතාව උදෙසා ගෝලීය විෂය මාලාවක් ඉදිරිපත් කර ඇත.<br>1. මනුෂ්‍යයන් ඇතුලු සියලු ජීවීනට ගරු කිරීම .<br>2. සංස්කෘතික අවබෝධය .<br>3. ලොව සියලු දෙනාඑක් ව ජීවත්වීම.<br>4. ශිෂ්ටාචාර අතර සංවාද ගොඩ නැගීම .<br>5. විවිධ අර්ථ ක්‍රම පිළිබඳ දැනුමවර්ධනය කරගැනීම.<br>6. තුලනාත්මක ආගම් අධ්‍යයනය.<br>7. දේශපාලන මතවාද අධ්‍යයනය.<br>8. ගැටුම් නිරාකරණය.<br>9. ගෝලීය පරිසර ගැටලු<br>10. තාක්ෂණයට අනුවර්තනය වීම.<br>මේ සම්බන්ධ ශ්‍රී ලංකාව ගෙන ඇති උත්සාහයන්:<br>• ජාතික පොදු අරමුණු හඳුන්වාදීම. මිනිස් අභිමානයට ගරු කිරීම ,බහු සංස්කෘතික අවබෝධය ,ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු කිරීම .<br>• ගෝලීය විෂය මාලාවේ අංක 3, එක්ව ජීවත්වීමට සමගාමී ව මානව අයිතිවාසිකම් සුරකීම,යුතුකම් හා වගකීම් වලට ගරු කිරීම ,සංකල්ප ඇතුලත්කර තිබීම.<br>• පොදු නිපුණතා තුළ ද ගෝලීය විෂය මාලාවේ අරමුණු වලට අදාළ අභිමතාර්ථ දැකිය හැකිය.<br>සන්නිවේදනය ,පරිසරයට අදාළ නිපුණතා ,ඉගෙනීම ට ඉගෙනුම වැනි කාරණා | සාරධර්ම යනු පුද්ගලයා පිළිපදින අභ්‍යන්තර ශික්ෂාපද වේ.පුද්ගලයා සිතන- පතන, කරන - කියන ,කන - බොන ,අඳින - පළඳින සියල්ලයි. සාරධර්ම පුද්ගල යහ පැවත්මට අවශ්‍ය මාර්ගෝපදේශ මූලධර්ම,ඇගයුම් පද්ධති ,සමාජ ප්‍රතිමාන,ජීවිත කාලීන ආකල්ප පරමාදර්ශ,හිරි ඔතප්,ලෝක පාලන ධර්ම<br>1967 බ්‍රිතාන්‍ය ෆලවුඩන් වාර්තාව :<br>" පාසල පවත්වනු ලබන්නේ සාරධර්ම හා ආකල්ප වර්ධනය සඳහායි".<br>පාසල ශිෂ්‍ය පෞරුෂ වර්ධනය ට,යහපත් සිරිත් වර්ධනය ට, අත්දැකීම් ලබාදීමට , පෞද්ගලික ගෞරවයට, ආගමික සහජීවනයට තෝ තැන්නකි. | මානව වර්ගයාගේ අනාගතය පිළිබඳ විකල්ප (3)<br>• වර්තමාන සිදුවීම් වලට මැදිහත්වීමකින් තොරව එළැඹෙන අනාගතය (දැන් ගෝලීය තත්ත්වය )<br>• පුද්ගල මැදිහත්වීමකින් නිර්මාණය කරන අනාගතය ( තාක්ෂණික ලෝකය)<br>• මැදිහත් වීම් වලින් යුතුව වටිනාකම් හා සාරධර්ම ඇතුලු වූ වඩා කැමති අනාගතය.<br>මෙයින් පළමු විකල්පය පාලනය කළ නොහැක .අවිනිශ්විතයි.දෙවැන්න අවි බලය,ආර්ථික ශක්තිය,ලෝක බලය වැනි සාධක මත රඳා පවතී .(යුද්ධ ,වසංගත පාලනය,ආර්ථික බලය මෙහෙවීම) තෙවැන්න,සමාජ වටිනාකමක් සහිත අනාගතයයි.එය උසස් අධ්‍යාපනය පරමාර්ථ අරමුණු ,නිපුණතා මත ගොඩ නගා ගත යුත්තකි. |

# අධ්‍යාපනය තුළින් සමාජ විශිෂ්ටතාව ඇති කිරීම

| සමාජ යහ පැවත්ම සඳහා තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පය හැඳින්වීම | තිරසාර සංවර්ධනයේ අවශ්‍යතා | අධ්‍යාපනය තුළින් තිරසාර සංවර්ධනයට ලබා දිය හැකි දායකත්වය | ගුරුවරයාගේ කාර්ය භාරය |
|---|---|---|---|
| • **2005 – 2014** එ.ජා.ගේ තිරසාර සංවර්ධනය පිළිබඳ දශකය යි.<br>• මෙයට දශක ගණනකට පෙර ලෝකය කතා කළේ,වැඩි වැඩියෙන් නිෂ්පාදනය කරන්න ,වැඩි වැඩියෙන් පරිභෝජනය කරන්න සංකල්පය යි.<br>එහි අනිසි ප්‍රතිඵල<br>1. ගෝලීය උෂ්ණත්වය ඉහළයාම<br>2. ජෛව විවිධත්වය විනාශය<br>3. සාගර,ජල දූෂණ<br>4. දරිද්‍රතාවය ඉහළ යාම<br>5. ලෝකය ධනවත් ,දුප්පත් ලෙස බෙදී යාම<br>• අධ්‍යාපනය තුළ එදා නිෂ්ටාව වුවේ 3 R සංකල්පයයි.(කියවීම ,ලිවීම ,ගණනය) අද එය 7 R ලෙස වෙනස වී ඇත.(reduce, re use ,re cycle.re spect ,re flect ,repair ,responsibility )<br>• අද ප්‍රවේග ඉගෙනුම් (අධිවේගී ඉගෙනුම් ) නිසා මානව බුද්ධිය පරදා කෘත්‍රිම බුද්ධිය පෙරට එමින් පවතියි . | අවශ්‍යතා හඳුනා ගැනීමට නම් ගැටලු පෙල ගස්සවා ගත යුතුයි .<br>• සම්පත් ක්ෂයවීම<br>• ජෛවීය,සාගරය,ජලය,වායු දූෂණය<br>• අධි පරිභෝජනය .<br>• ජන ගහනය පුපුරා යාම.<br>• ආර්ථික දරිද්‍රතාවය .<br>• මත්ද්‍රව්‍ය ගැටලු.<br>• සරණාගතයන් .<br>• නාගරීකරණයන් .<br>• කාන්තා /ළමා හිංසන<br>• මානව හිමිකම් කඩවීම්<br>• දූෂිත දේශපාලනය<br>• රාජ්‍ය දූෂණය<br>ලෝකය පුරා පැතිරෙන මෙම තත්ත්වය තිරසාර සංවර්ධනයට බාධාකාරී සාධකයයන්ය.වර්තමාන ශ්‍රී ලංකාවේ තත්ත්වය සහ ලෝක තත්ත්වයන් සමාලෝචනයක යෙදෙන්න. | 1. දැනුම සම්ප්‍රේෂණය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රම ඉවත් කිරීම .<br>2. නව තාක්ෂණය පදනම්ව ගෝලීය සාක්ෂරතාවට ගැලපෙන නවෝත්පාදනය සහිත අධ්‍යාපනයකය හැරීම .<br>3. පාසල සමස්ත මොලය පදනම් කරගත් අධ්‍යාපනයකට යා යුතුයි . (හොවාඩ් බහුවිධ බුද්ධි න්‍යාය )<br>4.ඇල්ප්‍රඩ් වයිට් හෙඩ් "අභාවයට පත් අබල දැනුම (Dead and inert knowledge) වෙනුවට කරුණු කපා දැමීම (Cut back facts) එනම් විෂය කරුණු ලිහිල් කර අනවශ්‍ය දෑ ඉගෙනුම නතර කළ යුතු බවයි.<br>5. 1992 සැමට අධ්‍යාපනය සංකල්පය පුලුල්ව ලෝකයට අධ්‍යාපනය විවෘත කළ යුතුයි .<br>6. රැකියාවකට සරිලන ඉගෙනුම වෙනුවට ලෝක මට්ටමේ කුසලතා (World class skills ) අනිවාර්ය වීම. | • ගුරුවරයා සමාජ විශිෂ්ටතාව සංකල්පය ගැඹුරින් හදාරා තිබීම .<br>• විෂය මාලාව තුළ මෙම සංකල්පය ඉස්මතු කරන අවස්ථා හැදෑරීම .<br>• සුබවාදී ජීවන දර්ශනයකින් ලෝකය දෙස බලන්නෙකු වීම.<br>• පරිසර හිතකාමී,බහුවිධ සංස්කෘතිය අගයන්නකු වීම.<br>• අධ්‍යාපනයතුළ,පාසල් පද්ධතියේ පවතින නිශේධනීය තැන් අවස්ථා හඳුනා ගැනීම.<br>• සමාජ විශිෂ්ටතාවේ පෙර ගමන්කරු ගුරුවරයායි.<br>• පින්ලන්තය වැනි රටවල ආදර්ශයන්<br>• ලෝකයේ දියුණු යැයි සලකන රටවල් එම දියුණුව ලගා කර ගැනීමට ප්‍රබලම ආධාරක ලෙස අධ්‍යාපනය යොදා ගත් බවට උදාහරණ ;<br>චීනය,ජපානය ඇසුරෙන් දක්වන්න.මේ සියල්ලෙන් සමාජ විශිෂ්ටතාව ගොඩනගා ගැනීමට නම් අධ්‍යාපනයේ වෙනස්වන නව දිශානති සොයා බැලිය යුතුයි .අධ්‍යාපනයෙන් ම පමණක් සමාජ විශිෂ්ටතාව ගොඩනැගිය හැකිද?ඊට දායකයෝ වෙන වෙනත් සමාජ ගාමක බලවේග මොනවාද?මේ සම්බන්ධ සමාජ කතිකාවතක් ගොඩ නගා ගත යුතුයි. |

# 10. ඵලදායී ගුරුවරයකුගේ සමස්ත භූමිකාව - I

| ඵලදායී ගුරුගුරුවරයකුගේ ලක්ෂණ . | ගුරුවරයා නිපුණතා සහිත වීම | ගුරු වෘත්තීයට අදාළව සංවර්ධනය කර ගත යුතු ක්ෂෙත්‍ර |
|---|---|---|
| • ගුරු වරයා දැක්මක් සහිත වීම<br>ගුරු වචනාර්ථය : බර,ගැඹුරු , ගරු කටයුතු ,බරසාර පුද්ගලයා .<br>• දැක්ම : සමාජයේ අන්‍යයනට වඩා දැනුමෙන්,ආවරණයෙන්,උපදේශනයෙන්,හැකියාවෙන් ඉහළ මට්ටමෙන් කටයුතු කිරීම .<br>• ගුරු : සංස්කෘත වචනය 'අඳුරින් ආලෝකය වෙත් කර දෙන උතුමා '<br>**Vison** දෘෂ්ටිය ,දර්ශනය .දෘෂ්ටිමය පරිකල්පනය යන අදහස ගෙන දෙයි.<br>• යුනෙස්කෝව දක්වන දැක්ම :<br><br>' ගුරුවරයා යනු ඉගෙනුම් පද්ධති සැළසුම් කර ක්‍රියා කර වන්නාය.<br>ළමයින්ගේ චින්තනය පුබුදුවන්නාය.අනාගතය සඳහා සම්පත් රැස් කර වන්නාය’.<br><br>රුසියානු ජාතික ෂාට්ස්කි : ගුරුවරයා පුලුල් ක්ෂිතිජයක් ග්‍රහණය කරගත් සමාජ සංවිධායකයාය.ඔහු බුද්ධිමත් නිරීක්ෂකයෙකි.පරීක්ෂකයෙකි.<br><br>බර්ටන් : ගුරුවරයාගේ හැසිරවීම ,පෞරුෂය ක්‍රියා කලාපය ආදිය ශිෂ්‍යයන් කෙරෙහි බෙහෙවින් බලපෑම් ඇති කරවන ඔහු අත්‍යන්තයෙන්ම ශිෂ්‍යයාට ආදර්ශය ක් සපයන්නෙක් විය යුතුයි .<br><br><br><br><br>දැක්මක් සඳහා අදහස් : | නිපුණතා (**Skills** ) සඳහා කෞශල්‍යය ,කුසලතාව ,සුහුරුව යන වචනද සමානාර්ථව යෙදේ.<br>නිපුණතාවක් යනු යම් ක්ෂේත්‍රයක යමෙකු පුහුණු කරන ලක්ෂණ වේ.න්‍යායාත්මක කුසලතා පමනක් නොව චින්තනය ,චරිතය,සාරධර්ම හා ගැටලු තත්ත්වයන් හොඳින් හැසිරවීමද මීට අඩංගු වේ.<br>ගුරුවරයකු සතු නිපුණතා :<br>1. සාමාන්‍ය නිපුණතා<br>2. විශේෂිත නිපුණතා<br><br>1.සාමාන්‍ය නිපුණතා : දැනුම<br><br>සාමාන්‍ය දැනුම<br><br>විෂය දැනුම<br>ළමයා ගැන දැනුම<br>න්‍යාය ගැන දැනුම<br>සංස්කෘතිය ගැන දැනුම<br>උපදේශනය ගැන දැනුම<br>කළමනාකරණ දැනුම<br>සාරධර්ම පිළිබඳ දැනුම<br>ආකල්ප :<br>අවංක බව<br>සාමූහික බව<br>කැපවීම<br>ඇගයීම<br>විනය<br>සමානාත්මතාව<br>ආචාර ධර්ම<br>කුසලතා :<br>ඉගැන්වීම<br>සන්නිවේදනය<br>ගැටලු විසඳීම<br>නායකත්වය<br>පුද්ගල සබඳතා | 1. වෘත්තීයට සම්බන්ධ විශේෂඥ භාවය<br>2. කාර්යයට අදාළ බුද්ධිමත් බව.(ප්‍රායෝගික බව)<br>3. අධ්‍යාපනික පොහොසත් බව .(උගත්කම/සුදුසුකම් )<br>4. විමසුම් සහගත ආකල්ප .<br>5. පුද්ගල ජීවිත සම්බන්ධ තීරණ ගැනීමේ වගකීම් දැරීම.<br>6. කාර්යය සඳහා අවශ්‍ය කුසලතා හා උපක්‍රම.<br>7. සේවයට පෙරටුව කටයුතු කිරීම.<br><br>වෘත්තීයට අදාළව සංවර්ධනය කරගත යුතු ප්‍රමුඛ ක්ෂෙත්‍ර 02<br>• පාසල තුළ කාර්යයන්<br>• පාසලෙන් බැහැර කාර්යයන්<br><br>• පාසල තුළ : ළමා ස්වභාවය අධ්‍යයනය කිරීම ,ඉගෙනුම් කටයුතු ප්‍රවර්ධනය ,ළමා අධ්‍යයන කටයුතු වලට ආධාර කිරීම ,ළමා වර්ධනය නිරීක්ෂණය,කායික,මානසික බාධා හඳුනා ගැනීම හා ඉවත් කිරීමට සහායවීම ,ඉගෙනුම් උපකරණ නිෂ්පාදනය ,දැනුම් ගවේෂණය ,පර්යේෂණ වල යෙදීම. |

| | | |
|---|---|---|
| • ගුරුවරයා යනු සමාජ සංකේතයයි.<br>• ගුරුකම යනු එකම අය එකම දෙය එකම අයට එකම විදියට ඉගැන්වීමන් නොවන්නකි.<br>• මෙහෙවර ප්‍රකාශයක් :<br>සමස්ත ජාතියක් වෙනුවෙන් ඉගෙනුම් පද්ධති සැලසුම් කරන්නා වුද,පෘථුල ක්ෂිතිජයක් ග්‍රහණය කර ගන්නා සමාජ සංවිධායකයෙක් වුද ,ළමයින්ගේ චින්තනය පුබුදු කරමින් අඳුරින් ආලෝකය වෙන් කර දෙන්නාවුද ,විශිෂ්ට නිපුණතා අත්පත් කර ගනිමින් ඒවා අනාගත සමාජය වෙත පවරා දෙමින් සේවා පෙර දැරිව කටයුතු කරන්නාය. | ඇගයීම<br>විශ්ලේෂණය<br>අනාවරණය<br><br>වෘත්තීය භූමිකාව :<br>ඉගෙනුම් කටයුතු සංවිධානය<br>ඉගෙනුමට පහසුකම් සැපයීම<br>උපදේශනය ලබාදීම<br>නායකත්වය ලබාදීම<br>වරප්‍රසාද රහිත සිසුනට උදව් කිරීම<br>ඉගෙනුම් ආධාරක සැකසීම හා භාවිතය<br>හෝලි ගේ විග්‍රහය :<br>• ගුරුවරයාගේ සමාජ භූමිකාව (සමාජ නියෝජිතයෙක් )<br>• ගුරුවරයාගේ වෘත්තිය භූමිකාව (දැනුම් මූලාශ්‍රයක්)<br>ගුරු වෘත්තීකභාවය :<br>'ගුරුවරයාගේ වෘත්තීය නිපුණත්වය (Professional Competency )යනු තම පන්ති කාමර ඉගැන්වීම් සංවිධානයේදී වැදගත් අවශ්‍යතා ආශ්‍රිත සියලු අංශයන් මැනවින් තක්සේරු කර වඩාත් ඵලදායී සැලසුම් කරණයක් තුළින් අපේක්ෂිත ඉගෙනුම් පල ( Expect Learning Out Comes) ළඟා කර ගැනීමට තම විෂය හා පන්ති කාමරය කළමනාකරණය කර ගැනීමේ හැකියාවයි.''<br>(අධ්‍යාපන සංවාද - කොළඹ වි.වි.ප්‍රකාශනය )<br>ගුරු වෘත්තීය ඉගැන්වීම් වෘත්තීයක් ලෙස නැතහොත් වෘත්තීය කාර්යයක් ලෙස (Propersonal Task) ලෙස වර්ගීකරණය කර තිබේ.<br>• වෘත්තීකභාවය<br>1.ප්‍රවීණ දැනුම (Expert knowledge )<br>2. විශේෂඥ කුසලතා (Speliased Traning Skills ) | • පාසලෙන් පිටත : යහපත් පුරවැසියෙක් බිහිකිරීම ,ශිෂ්‍යයා සමායෝජනය කිරීම සඳහා සමාජ සම්බන්ධතා ගොඩ නගා ගැනීම ,සමාජ උරුමයන් සුරකීම,ප්‍රජා සංවර්ධනයේ යෙදීම, |

# 10.ඵලදායි ගුරුවරයකුගේ සමස්ත භූමිකාව - II

| වෘත්තියට අදාළ න්‍යායික හා ප්‍රායෝගික දැනුම හා පරිචය ලැබීම. | සමාජ සම්බන්ධතාවල පරිචය බව: | ගුරුවරයා ඉගෙන ගන්නෙකු ලෙස |
|---|---|---|
| • බ්‍රිතාන්‍ය ලීඩ්ස් වි.වි.ය ගුරුවරයා වර්ධනය කර ගත යුතු වෘත්තීය ගුණාංග 03<br>1.ගුරු වෘත්තීයේ එදිනෙදා කටයුතු සඳහා ඍජු සම්බන්ධතාවක් ඇති දක්ෂතා හා ශිල්පීය ක්‍රම වර්ධනය .<br>2.දැනුම වර්ධනය<br>3. පෞරුෂ ගුණාංග වර්ධනය.<br><br>අංක (2)යටතේ : දැනුම වර්ධනය සඳහා අධ්‍යාපනයේ දාර්ශනික පදනම,විෂය මාලාවේ විවිධ ක්ෂෙත්‍ර ගැන ගැඹුරු අවබෝධය ,ළමා මනෝ විද්‍යාව,මානව සම්බන්ධතා සැකස්ම,දේශීය /විදේශීය අධ්‍යාපන ක්‍රම,සුබ සාධන හ උපදේශන සේවා දැනුම .<br>අංක (3)යටතේ : පෞරුෂ ගුණාංග කොටස් 03<br>• වෘත්තීමය ආකල්ප යටතේ වගකීම පිළිබඳ හැඟීම,ශිෂ්‍යයා ගැන පෞද්ගලික සැලකිල්ල ,සදාචාරාත්මක ගති පැවතුම්,කාලය හා වේලාව ගැන හැඟීම් ,<br><br>• නම්‍යතාව හා අනුහුරුව : ක්‍රියාශීලි බව,පෙළඹවීමෙහි යුතු බව,පරිකල්පනය ,උත්සාහය,හාස්‍ය ප්‍රිය බව,කුතුහලයෙන් යුතුබව.<br><br>• විශ්වාසය : ගුරුවරයා පිළිබඳව ළමයා හා සමාජය ගොඩ නගා ගන්නා විශ්වාසය. | macpaland දක්වන ඵලදායි ගුරුවරයකු සතු ප්‍රවීණතා අතර සම්පත් පුද්ගල සහය ලබාගැනීමේ දක්ෂතාවයද ගුරුවරයා සතු විය යුතුයි.ළමයාගේ සෞඛ්‍ය සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂක,දිසා වෛද්‍ය නිලධාරි, කෘෂිකාර්මික අංශයෙන් කෘෂි පර්යේෂණ නිලධාරීන් ,තාක්ෂණික දැනුම ලබා දීම සඳහා කාර්මික විද්‍යාලවල විද්‍යාලවල තාක්ෂණික කථිකාචාර්යවරුන්,ඉතිහාසයේ විෂය සඳහා සංස්කෘතික නිලධාරීන් සහ පුරාවිද්‍යා නිලධාරීන්,නීතිය පිළිබඳ දැනුම ලබාදීම සඳහා පොලිසිය සහ ආරක්ෂක නිලධාරීන්,ක්‍රීඩාවේ දැනුම ලබාදීම සඳහා ක්‍රීඩා නිලධාරීන් වැනි විවිධ සම්පත් ධාරීන් තමාගේ පන්ති කාමරයට කැඳවා ගැනීමට ගුරුවරයා සමත් විය යුතුයි.<br>ලේබෲමන්(1956) කොවිස් (1965) මාර්න්ස් ටෙවින් (1976)ගුරු වෘත්තිකභාවයේ මිණුම් දඬු මෙසේ දක්වයි.<br>• ජනතාවට සේවය කිරීමේ හැඟීමකින් යුක්ත වීම (සුභසාධනය)<br>• ප්‍රතිලාභ ලබන සේවාලාභීන්(ළමුන් )පිළිබඳව කැපකිරීමක් කිරීම.<br>වෘත්තීය පෞරුෂයේ පරිචය බව:<br>• අරමුණු සහිත බව<br>• සැලසුම් සහගත බව<br>• විශ්වාසවන්ත බව<br>• වැරදි පිළිගන්නා බව<br>• ගැටළු විසඳන්නෙකු වීම<br>• කණ්ඩායම් ගතිකත්වයෙන් යුක්ත වීම<br>• නවෝත්පාදක හැකියාව<br>• ගවේෂණශීලී සුහදත්වය<br>• සුහද අධීක්ෂණය<br>• ඍජු ආධාර ලබාදීම<br>• වගකීම් භාර ගැනීම<br>• සර්ව ප්‍රජාතන්ත්‍රීය වීම<br>• අන්‍ය ආදර්ශයකයෙකු වීම. | මහාචාර්ය මැක්පලන්ඩ් ගුරුවරයා ළඟා කර ගත යුතු ප්‍රවීණතා පහක් දක්වා ඇත.<br>• තමන්ට මෙන්ම අනිත් අයටත් පැහැදිලි වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් සඳහා අපේක්ෂිත අරමුණු සකස් කිරීම.<br>• අදහස් හුවමාරුවෙන් හා අන්තර් පුද්ගල සම්බන්ධතා මගින් ළමුන්ගේ චර්යා පාලනය කිරීම හා බලපෑම් බලපෑම් ඇති කිරීම.<br>• සුවිශේෂී විෂයයන් පිළිබඳ දක්ෂතා ලබා ගැනීම.<br>• ඉගැන්වීමේ ඒකකයකට පසුව ඇතිවූ සාධනය සඳහා නිරීක්ෂණ හා තක්සේරු කිරීමේ නිපුණතා අත්පත් කර ගැනීම.<br>• ඉගැන්වීමේ ව්‍යාපෘති සඳහා භෞතික වාතාවරණය,ද්‍රව්‍ය සම්පත හා වෙනත් පුද්ගලයන් ගේ සහාය ලබා ගැනීම.<br>ස්වයං ඉගෙන ගන්නෙකු වීම.<br>ගුරුවරයා ළඟා කරගත යුතු දැනුම.<br>• විෂය දැනුම<br>• සාමාන්‍ය දැනුම<br>• ළමයා පිළිබඳ දැනුම<br>• න්‍යාය පිළිබඳ දැනුම<br>• තාක්ෂණය පිළිබඳ දැනුම<br>• සංස්කෘතිය පිළිබඳ දැනුම<br>• සාරධර්ම පිළිබඳ දැනුම<br>• උපදේශනය පිළිබඳ දැනුම<br>• කළමනාකරණය පිළිබඳ දැනුම<br>• ජාතික අධ්‍යාපන පරමාර්ථ සහ සහ අරමුණු පිළිබඳ දැනුම. |

| | | |
|---|---|---|
| | පෞද්ගලික පෞරුෂයේ පරිචය බව :<br>මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2012/37 අංක දරන ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාරධර්ම පද්ධතිය හා පොදු නීති මාලාව චක්‍රලේඛ යටතේ<br>1. හැඳින්වීම<br>2. පද නිර්වචන - ගුරුවරයා,ආචාරධර්ම,නීති මාලාව<br>3. අරමුණු<br>4. පොදු පරමාර්ථ සහ මූලධර්ම<br>දක්වා ඇත.ගුරුවරයා පුද්ගලයෙකු වශයෙන්,දෙමව්පියන් වෙනුවෙන් පෙනී සිටින්නෙකු,කුසලතා ,ආකල්ප සංවර්ධනය කරන්නෙකු, නිර්මාණාත්මක මගපෙන්වන්නෙකු,උපදේශකවරයෙකු,ඇගයීම් කරන්නෙකු,වෘත්තිකයෙකු,කළමනාකරණයේ වගකියන්නෙකු,සමාජයේ හා හා දේශයේ පෙරගමන්කරුවකු ලෙස අර්ථ දක්වා ඇත.ඉහත තත්ත්වයන් නැවත නීතිමය වශයෙන් දක්වා ඇත. | යාවජීව ශිෂ්‍යභාවයේ පිහිටීම .<br>• මානුෂීය බව.<br>• තමා වැදගත් බව නොසිතීම.<br>• නිරන්තර නිරීක්ෂණය.<br>• කණ්ඩායම් හැඟීම හා බැඳීම.<br>• නිර්මාපී බව.<br>• නවීකරණ හැකියාව..<br>• වෙනස් වීමට ඇති කැමත්ත .<br>අමතර : 21 සියවසේ ගුරුවරයා :<br>Code of ethics for registered teacher (නවසීලන්තය ) ආචාර ධර්ම 4ක්<br>• ස්වාධීනත්වය<br>• සාධාරණත්වය<br>• වගකීමෙන් යුක්ත බව<br>• අවංක බව<br>Unesco (2001)<br>• ශිෂ්‍ය අයිතිවාසිකම් සුරකින්නෙක්<br>• පහසුකම් සපයන්නෙක්<br>• උපදේශනය ලබා දෙන්නෙක්.<br>• වරප්‍රසාද රහිත සිසුන්ට උදව් කරන්නෙක්<br>American national board for professional teaching (2007)<br>• විෂය මෙන්ම උගන්වන ක්‍රම ශිල්ප ද දැන සිටියි.<br>• ස්වයං විවේචනයට හා කාර්යබද්ධ පර්යේෂණයට යොමුවේ.<br>• ඉගෙනුම කළමනාකරණය,නියාමනය සහ ඇගයීමට වග කියයි. |

# 11. සමාජ විද්‍යාවේ ස්වභාවය හා ලක්ෂණ

| සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචන සහ අරමුණු : | සමාජ විද්‍යාවේ විකාශනය. | සමාජ විද්‍යාව හා සාමාජීය විද්‍යා අතර වෙනස හා සම්බන්ධය |
|---|---|---|
| හැඳින්වීම : අධ්‍යාපන සමාජ විද්‍යාවේ මව් විෂය වන්නේ සමාජ විද්‍යාවයි.සමාජයේ වාසය කරන විවිධ පුද්ගලයන්ගේ චර්යාව යථාර්ථවාදී ව විග්‍රහ කරන විෂය ලෙස සමාජ විද්‍යාව හැඳින්වේ.සමූහයක් ලෙස ජීවත් වන මිනිසා පිළිබඳව විද්‍යාත්මකව හැදෑරීම සමාජ විද්‍යාව යි .<br>නිර්වචන :<br>1. **J.Q Dealy (1905) :** සාමාජීය ප්‍රපංචයන් හා මිනිසා අතර ඇති වන තුලනාත්මක සබැඳියාව තක්සේරුකරණ විධික්‍රම ශාස්ත්‍රය සමාජ විද්‍යාවයි.<br>2. ගින්ස්බර්ග් : සමාජ මානව අන්තර් ක්‍රියා හා අන්තර් ක්‍රියා සම්බන්ධතා සහ ඒවායේ සබඳතා අධ්‍යයනය සමාජ විද්‍යාවයි.<br>3. හැරී .එම්.ජොන්සන් (1977) සමාජ සමූහ පිළිබඳ අධ්‍යයනය කරන විෂය<br>4. එමිල් ඩුර්කයිම් (1895) සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ විද්‍යාව සමාජ විද්‍යාවයි.<br><br>සමාජ විද්‍යාවේ අරමුණු.<br>1. අන්තර් මානුෂික සබඳතා හැදෑරීම.<br>2. සමාජ සිද්ධි හෝ කරුණු හැදෑරීම.<br>3. සමාජ ක්‍රියාවන් අධ්‍යයනය කිරීම.<br>4. සමාජ පන්ති පිළිබඳව හැදෑරීම.<br>5. සමාජය ද එයට අදාළ ආයතනවල ක්‍රියාකාරිත්වය ද හැදෑරීම .<br>6. සමාජ අන්තර් ක්‍රියා දැන හැඳින ඒවා ක්‍රමවත්ව අධ්‍යනය කිරීම. | ඉබ්බන් කල්දූර් නැමැති අරාබි ලේඛකයා අරාබියෙ නගරයක බිඳ වැටීම ගැන සඳහන් කරමින් සමාජ සහයෝගයක් නොමැති වූ විට සමාජ බිඳ වැටෙන බවට කළ සඳහන සමාජ විද්‍යාවට එක් වූ මුල්ම අදහස ලෙස සැලකේ.<br>19සියවසේ ඔගස්ට් කොම්ට් විසින් සමාජ විද්‍යාව යන නම මුලින්ම භාවිතා කරන ලදී.<br>එමිල් ඩුර්කයිම් සහ මැක්ස් වෙබර් සමාජ විද්‍යාව ස්වාධීන විෂයයක් වශයෙන් වර්ධනයට දායක විය.<br>සංවර්ධනයට ආර්ථික නොවන සාධක ද දායක වන බව තහවුරු කිරීමට සමාජ විද්‍යාව යොදා ගැනේ.<br>වාණිජකරණය,කාර්මීකරණය,ගෝලීයකරණය තුළ සංකීර්ණ සමාජ වල අපරාධ ,පරිසර දූෂනය,න්‍යෂ්ටික පවුල ,සන්නිවේදනය වැනි සමාජ වෙනස්වීම් අර්ථවත් විග්‍රහ කිරීමට සමාජ විද්‍යාව අවශ්‍ය විය.<br>දර්ශනවාදී ඇතැම් සොයාගැනීම් ද සමාජ විද්‍යාවේ සංවර්ධනයට දායක විය.මිනිස් චර්යාවන් පිළිබඳව ගැඹුරෙන් සොයා බැලීමට,විද්‍යාත්මක ක්‍රම යොදා ගැනීමේ අවශ්‍යතාව සමාජ විද්‍යාවේ වර්ධනයට හේතු විය.<br>සමාජ විද්‍යාවේ උප විද්‍යාවන්<br>• සාමාන්‍ය සමාජ විද්‍යාව<br>• ආගමික සමාජ විද්‍යාව<br>• නීතිමය සමාජ විද්‍යාව<br>• සංඛ්‍යාන සමාජ<br>• අපරාධ සමාජ විද්‍යාව<br>මෙවැනි සමාජ විද්‍යා උප විෂයයන් 40 කට වැඩි ප්‍රමාණයක් ඇත.සමාජ විද්‍යාව ප්‍රධාන ධාරා දෙකකට බෙදේ.<br>1. ශුද්ධ සමාජ විද්‍යාව<br>2. ප්‍රායෝගික සමාජ විද්‍යාව. | • ඔගස්ට් කොම්ට් සමාජ ශාස්ත්‍ර වල රැජින ලෙස සමාජ විද්‍යාව හඳුන්වයි.අනෙකුත් සමාජ ශාස්ත්‍ර වලට සමාජ ජීවිතය විග්‍රහ කිරීමට නොහැකි නිසා සමාජ විද්‍යාව බිහි විය.<br>• හර්බට් ස්පෙන්සර් සමාජ විද්‍යාව සමාජීය විද්‍යාවන්ගේ පදනම ලෙස හඳුන්වයි.<br>• ගිඩින්ස් සිසිල් සාමාජීය විද්‍යාවන් ගේ මව සමාජ විද්‍යාව යි.<br>• සාමාජීය විද්‍යාවන් ගෙන් සමාජ ක්‍රියාකාරීත්වය සුවිශේෂී අංග හා විවිධ පාර්ශව ගවේෂණය කෙරේ.සමාජ විද්‍යාවෙන් කෙරෙනුයේ මිනිස් ක්‍රියාකාරකම් ස්වභාවය සමස්ත සමාජය තුළ වන ආකාරය විමසීමයි.<br>• ප්‍රාථමික සමාජ හැදෑරීමට, විවිධ සමාජ සංස්කෘතික හැදෑරීමට සමාජ විද්‍යාවේ හැකි වීම නිසා එය,ඉතිහාසය, දේශපාලන විද්‍යාව,මනෝ විද්‍යාව,වාග් විද්‍යාව වැනි විෂයයන් සමඟ සමීපව කටයුතු කරයි. |

# 11. සමාජ විද්‍යාවේ ස්වභාවය

| අධ්‍යාපන සමාජ විද්‍යාවේ ස්වභාවය සහ අධ්‍යාපන සමාජ විද්‍යාවේ අන්තර්ගතය | අධ්‍යාපන සමාජ විද්‍යාව හැදෑරීමේ වැදගත්කම | අධ්‍යාපන සමාජ විද්‍යාව පදනම් කර ගත හැකි ක්ෂේත්‍ර / අවස්ථාවන් |
|---|---|---|
| අධ්‍යාපන සමාජ විද්‍යාව විශේෂ විෂය වශයෙන් හඳුනාගන්නේ 1960 දශකයේ වුවත්,1970 දශකය වන විට ගුරු අධ්‍යාපනයේ විශේෂිත විෂයයක් ලෙස වර්ධනය විය.<br>• මිනිසාගේ අධ්‍යාපන ක්‍රියාවලියේදී සිදුවන සාමූහික ක්‍රියාකාරකම් හැදෑරීම අධ්‍යාපන සමාජ විද්‍යාව යි. සී.ජේ.කුක් අධ්‍යාපන ක්‍රියාවලියේ දී සිදුවන සමාජ අන්තර් ක්‍රියා ,ප්‍රති ක්‍රියා හා සමාජ රටාවන් පිළිබඳ විද්‍යාත්මක විග්‍රහයක් ලෙස අධ්‍යාපන සමාජ විද්‍යාව හඳුනා ගනී.<br>අධ්‍යාපන සමාජ විද්‍යාවේ අන්තර්ගතය<br>• පවුල ,සම වයස් කණ්ඩායම් ,පාසල,පන්තිය,ආගම,ප්‍රජා කණ්ඩායම් ආදී සමාජ සංස්ථා පුද්ගලයාට බලපාන අයුරු මෙම විෂයයෙන් විග්‍රහ කෙරේ.<br>• ආගම හා සදාචාරය මුල් කරගෙන අතීතයේදී අධ්‍යාපනය පැවති අතර සමාජය හා අධ්‍යාපනය අතර සමීප සබඳතාවයක් විය.<br>• රටක සමාජ අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස විෂය මාලාව ක්‍රියාත්මක කිරීමෙන් අධ්‍යාපනයේ සමාජ විද්‍යාව මතුවේ.<br>අධ්‍යාපන සමාජ විද්‍යාවෙන් සොයා බැලෙන විෂය ක්ෂේත්‍ර :<br>• සමාජ ගැටලු /සමාජ විෂමතා<br>• සමාජානුයෝගී ක්‍රියාවලිය<br>• පාසල හා සමාජ සමූහ<br>• අධ්‍යාපනයට ආවේනික සමාජ සංකල්ප<br>• අධ්‍යාපන කාරක,ගුරු භූමිකාව<br>• සමාජ පන්ති/ ස්තරායනය<br>• බහු සංස්කෘතික සාධක<br>• සමාජ ප්‍රාග්ධනය<br>• සංස්කෘතික ප්‍රාග්ධනය<br>• ඩිජිටල් අවකාශ ක්‍රියාවලිය<br>• Z සහ ඇල්ෆා පරම්පරාවන්ගේ අභිලාෂයන් | 1. පුළුල් ලෙස අධ්‍යාපන ගැටලු ගැන අවබෝධයට.<br>2. පාසල සමාජය සමූහයක් ලෙස හඳුනා ගැනීමට.<br>3. විවිධ අවාසිදායක සමාජ පරිසර තත්ත්වයන්ගෙන් පන්ති කාමරයට වන බලපෑම අවම කිරීමට.<br>4. ගුරු සිසු අන්තර් සබඳතා අධ්‍යයනයට.<br>5. විධිමත් සහ අවිධිමත් සමාජ සමූහ අධ්‍යයනයට.<br>6. ශිෂ්‍ය චර්යාවන් ට බලපාන සමාජ චර්යාවන් අධ්‍යයනයට.<br>7. බහු සංස්කෘතික සමාජ හැසිරීම් අධ්‍යයනයට.<br>8. අනාගත අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයට.<br>9. ඩිජිටල් අවකාශයේ පැන නගින අධ්‍යාපන සිදුවීම්/ ගැටලු පිළිබඳ ව සමාජ විද්‍යාත්මක දෘෂ්ටියෙන් විමසා බැලීමට. (උදා : ලෝක ගුරු දිනය දා කදිරාන විදුහලේ ගුරු නර්තනය නිසා මතු වූ සමාජ කතිකාව.....) | ඉගෙනුම් ක්‍රියාවලියේදී<br>• ළමයා,පවුල ,පන්ති කාමරය<br>• ශිෂ්‍ය චර්යා / සමූහ චර්යා<br>• ශිෂ්‍ය චර්යාවන්ට බලපාන සමාජ සාධක<br>• විවිධ සංස්කෘතික වල සමාජ හැසිරීම්<br>කළමනාකරණ ක්‍රියාවලියේදී<br>• පන්ති කාමර කළමනාකරණයට.<br>• ශිෂ්‍ය චර්යා කළමනාකරණයට .<br>• ප්‍රජා ක්‍රියාකාරකම් කළමනාකරණයට .<br>• අවිධිමත් සමාජ කණ්ඩායම් කළමනාකරණයට .<br>ප්‍රජා සබඳතාවන් සඳහා<br>• හඳුනා ගැනීමට /අධ්‍යයනයට<br>• බලපෑම් ප්‍රබල මෙන්ම අවම කිරීමට .<br>• උපදේශන අවශ්‍යතාවන්ට .<br>• ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට .<br>පර්යේෂණ මෙහෙයවීමට<br>• ගුරු වරයාට තමාගේ ක්‍රියාවලිය ගැන පර්යේෂණ කිරීමට .<br>උදා: කාර්ය මූල පර්යේෂණ<br>• ගැටලු යථාර්ථවාදීව හඳුනා ගැනීමට .<br>• ගැටලු පුරෝකථනය කිරීමට .<br>• විෂය මාලා සම්පාදනයට හා නවීකරණයට<br>• අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයට .<br>ඉදිරි පස් වසර තුළ පාසල් දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය 10%දැනට පවතින මට්ටමේ සිට 30% දක්වා ඉහළ යාමේ අවධානම අධ්‍යාපන පර්යේෂකයන් පුරෝකථනය කර ඇත.ගුරුවරයාට මෙය අධ්‍යාපන සමාජ විද්‍යාත්මක දත්තයකි.ඔබට කළ හැක්කේ කුමක්ද ? |

# 12. සමාජානුයෝජනය

## නිර් වචන සහ අවශ්‍යතාව

- හැදින්වීම : සමාජයට අනුකූල ව ජීවත්වීමට හුරු කිරීම සමාජානුයෝජනයයි.
- නිර් වචන : මස්ග්‍රේව් : ඕනෑම සමාජ සමූහයක් ඒ සමූහයට අයත් සාමාජිකයන් ගෙන් අපේක්ෂා කරන චර්යා රටාවට හුරු කිරීම.
- ජොන්.එෆ්.කර් : පුද්ගලයා වසන සමාජයේ සාමාජිකත්වය ගැනීමට සූදානම් කිරීමේ ක්‍රියාවලිය.
- නිම්කොෆ් : පුද්ගලයන් මිනිසුන් බවට පත්කරවන ක්‍රියාවලියක්.
- ඩුර්කයිම් : මූලික සමාජීය හා සදාචාර අගයන් ග්‍රහණය කර ගැනීමක්.
- පීටර් වර්සිලි : සංස්කෘතිය පවරා දීමේ ක්‍රියාවලියක්.
- වයිල්ඩ් : සංස්කෘතියෙන් දරුවන් සකසන ක්‍රියාවලියක්.
- ගිඩන්ස් : ස්ව සම්ප්‍රජානනය හා දැනුම ඇති පුද්ගලයකු බවට පත් පත් කිරීමේ කිරීමේ ක්‍රියාවලිය.
- හර්බට් මීඩ් : දෙමව්පියන් පිළිගත් ධර්මතා දරුවන්ට අභ්‍යන්තරීකරණය කරන චක්‍රීය ක්‍රියාවලියක්.
- මෙරිල් ප්‍රැන්සිස් : තමා වසන සමූහය ගැන ඉගෙනීමක් .

සමාජානුයෝජනයේ අවශ්‍යතාව

- උත්පත්තියේ සිට මරණය දක්වා අඩු වැඩි වශයෙන් සිදු වෙන යාවජීව ක්‍රියාවලියකි.
- සමාජානුයෝජනය සවිඥානිකව මෙන්ම අවිඥානිකව ස්වොත්සාහයෙන් ක මෙන්ම නිරුත්සාහයෙන් සිදු විය හැක.
- දැනුම ,ආකල්ප ,කුසලතා ආදී වූ විවිධ අත්දැකීම් ලැබීම පමනක් නොව සාර ධර්ම උකහා ගැනීමටත්,සමාජ ගැටලු වලට සාර්ථකව හා අභීතව මුහුණ දෙමින් තමා ජීවත්වන සමාජ ක්‍රමය තුළ ප්‍රවීණ සමාජිකත්වය ලබා ගැනීමටත් හැකි වන්නේ උචිත සමාජානුයෝජනය යි.
- සමාජානුයෝජනය යනු තම සමාජ ක්‍රමය තුළ පවත්නා සංස්කෘතිය ළදරුවා වෙත පවරාදී ඔහු සමාජයට උචිත ලෙස සකස් කොට නිර්මාණය කරන්නා වූත් , ඔහුගේ චින්තනය,වේදනය හා චර්යාව ක්‍රමානුකූලව හා අඛණ්ඩව ,සමාජ සාරධර්මයන් ට අනුකූලව සංවර්ධනය කරන්නා වූ ක්‍රියාවලියකි.
- ටැල්කොට් පාසන් : සංස්කෘතිය පවරා දීමෙන් සමාජය ඉදිරියට ගෙනයන ශක්ති ධාරාවක් ලෙස හඳුන්වයි.
- පුද්ගලයාට සමාජයෙන් සහ සහජයෙන් ඇතිවෙන බලපෑම අවම කර ගැනීමටත් ,පවුල තුළින් උපරි අහම්භාවයෙන් යුත් පෞරුෂයක් නිර්මාණය ට.
- සමාජානුයෝජනයේ අරමුණු :
    1. සමාජීය මිනිසෙකු බවට පත් කිරීම.
    2. පුද්ගල පෞරුෂය ගොඩ නැගීම.
    3. සමාජ ඉගෙනුමෙන් විනය ගරුක වීම.

## සමාජානුයෝගී ශිල්ප ක්‍රම

සමාජානුයෝජනයට ලක්වන පුද්ගලයාගේත්, සමාජානුයෝගීකාරකයේත් ස්වභාවය අනුව ශිල්ප ක්‍රම තීරණය වේ.
**1.**තෑගි සහ දඬුවම් : ත්‍යාග තුළින් තුළින් චර්යාවන් උපස්ථම්භනය කිරීමටත්, දඬුවම් තුළින් චර්යාවන් නිරුන්ධනයත් අපේක්ෂා කෙරේ. එහෙත් මෙය වයසින් වැඩෙන විට දුර්වල ක්‍රමයක් බවට පත්වේ.කුඩා දරුවෙකුට චොකලට් පෙත්තක්,වැඩිහිටියෙකුට පාරිතෝෂිකයන් ලබාදීම මෙන්ම,මෙය ද්‍රව්‍යාත්මක නොවන හාදුවක්,ඇගයීමක් ලෙසද යොදා ගත හැක. දඬුවම් මගින් භෞතික හෝ සාමාජීය තහංචි පැනවීම සමාජ ගත කිරීමේ ක්‍රමයකි.
**2.** ආදර්ශය,අනුකරණය සහ තදාත්මීකරණය මගින් ද සමාජානුයෝජනය සිදුවේ.
**3.** උපදේශනය හෙවත් ඉගැන්වීම් : මෙය පාසලෙන් මෙන්ම අවිධිමත් ද සිදුවේ.පවුලෙන්,සමාජයෙන්,ආගමික ආයතන මගින්,බහු ජන සංවිධාන මගින් මෙය සිදුවේ.
**4.** ආදර්ශය සහ අනුකරණය : මෙය සවිඥානික මෙන්ම සවිඥානිකව ද සිදුවේ.ආදර්ශවත් පුද්ගලයන් ආදර්ශයට ගැනීම ,ඒ සදහා පෙළඹවීම සිදු කළ හැකියි.
**5.** පුද්ගලයා තුළ පවත්නා ශක්තීන් කීපයක් ද සමාජානුයෝජනයේ දී ප්‍රයෝජනවත් වේ.

- ව්‍යංගයතාව
- අනුකරණය
- අනුවේදනය
  යමෙක් තුළ ඇති ව්‍යංගයතාව (ඉගිය) නිසා තවකෙක් බොහෝ දේ උගනියි. භාෂාව සිරිත් විරිත් අනුකරණයෙන්ද ,අනුවේදනය හෙවත් අනුකම්පාව මිනිසා තුළ මිනිස්කම ගොඩ නංවයි.

## සමාජානුයෝජනය හා අධ්‍යාපනය

සමාජයටසමාජයට උචිත යහපත් පුරවැසියන් තැනීම අධ්‍යාපන පරමාර්ථයකි.
එල්කින් : සමාජය නිසියාකාර ක්‍රියාවලියකට ක්‍රියාත්මක වීම සඳහා යම්කිසි සමාජයක හෝ කණ්ඩායමක ක්‍රම හා විධි යම්කිසි කෙනෙකු ඉගෙනීම ලබන ක්‍රියාවලිය සමාජානුයෝජනය යි.
සමාජානුයෝජනය සදහා අධ්‍යාපනය අත්‍යාවශ්‍යයි. .සවිඥානිකව හෝ අවිඥානිකව අධ්‍යාපනය සිදුවේ .විධිමත් ,අවිධිමත් හෝ නොවිධිමත් යන ඕනෑම අංශයක අධ්‍යාපනය තුළ සමාජානුයෝජනය සිදුවිය හැකියි.
එහෙත් සියලු ඉගෙනුම් සමාජානුයෝජනය ම නොවේ.සමාජ හැකියා,උපස්ථම්භනය ලැබීමට කරන ඇතම් ඉගෙනුම් සමාජානුයෝජනය ට අදාළ නෙවෙන බව ජොන්සන් (1978) දක්වා ඇත .
සමාජානුයෝජනය සදහා ළමා ශික්ෂණ ක්‍රම ද ඉතා වැදගත් .සෞඛ්‍ය පුරුදු,වත් පිළිවෙත් සහ යහ ජීවන පුරුදු වැනි දේ.
කුඩා කල සිටම යම් යම් දේ වැඩිහිටියන් විසින්ම කිරීම (උදා : කුඩා දරුවන්ට වැසිකිලි පාවිච්චි හුරු කිරීම )නිසා ඇතමෙකු තුළ පරායත්ත පෞරුෂයක් (අනුන් මත යැපෙන) හට ගැනෙන අතර,කුඩා කළම ඒවාට හුරු කිරීම තුළ ස්වායත්ත පෞරුෂයක් ගොඩ නැගෙන බව ද හෙළි වී තිබේ.
සමාජානුයෝජනය ට දරුවන් පෙළඹවීම තුළ අධ්‍යාපනය අතර ඇති සම්බන්ධතා මතු කර ගත හැකි බවත්,අභිප්‍රේරණය මගින් යම් යම් දේ නැවත නැවත කිරීමට පෙළඹවීම කළ හැක.( පිහිනීම - දිය නෑම වැනි)
අදාළ භෞතික හා සංස්කෘතික පසුබිමට උදව් කරන පෞද්ගලික ලක්ෂණ මෙන්ම,දැනුම ,ආකල්ප ,කුසලතා ,වටිනාකම් හා අගයයන් පිළිබඳ දැනුම ලබන ක්‍රියාවලිය ද සමාජානුයෝජනය බව ඉන්කලීස් ඇලෙක්ස් (1966) දක්වා ඇත.
සමාජීය හෝ සංස්කෘතික වශයෙන් අර්ථ කථනය කර ඇති චර්යා ,අපේක්ෂණ ඉගෙනීමද සමාජානුයෝජනය බව සයිරස් වර්ජිනියා (1977) කියයි.
මේ අනුව පුද්ගලයා කුඩා කළ සිටම අධ්‍යාපනය හා සමාජානුයෝජනය අතර සමීප සම්බන්ධතාවකින් කටයුතු කරන බව අවබෝධ කර ගන්න.

# 12. සමාජානුයෝජනය

| සත්ව හැසිරීම් රටා සහ මානව හැසිරීම් රටාවන් ඇසුරෙන් අධ්‍යාපනය හා සමාජානුයෝගය අතර සම්බන්ධය | නව පරම්පරාවකට සමාජානුයෝජනය ලබාදීමට අධ්‍යාපනය අවශ්‍ය බව. |
| --- | --- |
| • ප්‍රජනනය : සමාජානුයෝජනය පිළිබඳ ජීව විද්‍යාත්මක සාධක අනුව මානව සමාජය රඳා පවතින්නේ ප්‍රජනන ක්‍රියාවලිය මතය.ඒ අනුව ලිංගික නියාම අතරෙන් අතරින් ප්‍රධානතම නාභිය වන්නේ අවාහ විවාහ සම්බන්ධය යි. සමාජය යමෙකුට පූර්ණ වැඩිහිටි තත්ත්වය ප්‍රදානය කරන්නේ ද විවාහයෙන් පසු දරුවන් ලැබූ විට ය.සත්ව ප්‍රජාව තුළ මෙම සංසිද්ධිය ක්‍රියාත්මක නොවේ.ඔවුන්ගේ ප්‍රජනනය සිදු වන්නේ ස්වභාව ධර්ම සංසිද්ධියක් ලෙස ය.මානවයා පවුල සමාජය සමවයස් වැනි කාණ්ඩවලින් අධ්‍යාපනය ලබන අතර සත්ව ප්‍රජා ආදර්ශ අත්දැකීම් අත්දැකීම් අනුකරණ ලෙස අවිධිමත්ව ලබා ගනියි.<br>• දීර්ඝ යැපුම් ස්වභාවය : විවාහයෙන් පසු මානවයා ගේ ඊලඟ දැඩි බන්ධනය මව හා දරුවා අතර සම්බන්ධය යි. දරුවා ස්වාධීන වෙනතුරු පවුල මත යැපේ. සත්ව ප්‍රජාව දීර්ඝ යැපුම් ස්වභාවයක් නොමැත.සත්ත්ව නවජයා තමාම උගෙන පරිසරයට අනුවර්තනය වේ. මානවයාගේ යැපීම දෙපාර්ශවයේම අධ්‍යාපනය මත රඳා පවතී.<br>• පවුලේ කාර්ය භාරය :මානව වර්ගයාගේ පවුලට භාර වූ වගකීම් සම්භාරයක් තිබේ.<br>1. පවුලවෙනුවෙන් ඉටු විය යුතු යුතුකම්.<br>2. සමාජය වෙනුවෙන් ඉටු විය යුතු යුතුකම්.<br>පවුල වෙනුවෙන් නව සාමාජිකයන් බිහි කිරීම ,භාණ්ඩ හා සේවා සැපයීම,ආරක්ෂාව සැපයීම ,ප්‍රවීණ සමාජ සාමාජිකත්වයට හුරු කිරීම වැනි. සත්ව ප්‍රජාවට පවුලේ කාර්ය භාරයක් නැත.එයද සවභාව ධර්ම සංසිද්ධියකි.මාවනයාගේ සේවා සැපයුම සිදු වන්නේ අධ්‍යාපනය තුළ මනා සමාජානුයෝජනයක් සිදු වුවහොත් පමණි.වගවීම ,වගකීම වැනි සමාජ ප්‍රතිමාන නිවැරදි ව අධ්‍යාපනයෙන් ගොඩ නැගුනොත් පමණි.<br>• පෞරුෂ වර්ධනය : මෙන්ම අන්‍යෝන්‍යතා ගොඩ නැගීමද සිදු වන්නේද අධ්‍යාපනය තුළිනි.සත්ත්ව සමාජයේ මෙබඳු පෞරුෂ ගොඩ නැගීමක්,සිදු නොවේ.<br>මෙබඳු සාධක අනුව සත්ත්ව හැසිරීම් රටා අනුව සමාජානුයෝජනය සහ අධ්‍යාපනය අතර නිශ්චිත සම්බන්ධතාවයක් දැකිය නොහැකි අතර මිනිස්මිනිස් ප්‍රජාව තුළ විධිමත් අධ්‍යාපන රටාවක් ඒ ඒ සමාජ විසින් ගොඩ නගා ගෙව ඇති බව විද්‍යාමාන වේ. | • සමාජානුයෝජනය සිදුවන ප්‍රබලතම සමාජ සංස්ථාව සංස්ථාව ලෙස පවුල හැදින්වේ.පවුල නව සමාජිකයන් සමාජ ගත කිරීම සමාජානුයෝජනය යොදා ගනියි.ඊට පවුල භාවිතා කරන්නේ අධ්‍යාපනයෙන් ලබාගන්නා ලද දැනුම ආකල්ප කුසලතා වටිනාකම් ය.<br>• ඉගෙනුම සම්බන්ධ සියුම් චර්යා ගොඩ නැගෙන්නේ ද හැඩ ගැසීම හා වෙනස් වීම සිදු වන්නේද දෙමාපිය අභාෂයෙනි.ආරක්ෂාව,සංරක්ෂණය ,අනුමැතිය මනෝවිද්‍යාත්මක අවශ්‍යතා සපුරාලීමට දරුවාගේ අධ්‍යාපනය අධ්‍යාපනය පමණක් නොව දෙමාපියන්ගේ අධ්‍යාපනය ද වැදගත් වේ.එනිසා නව පරම්පරාවකටසමාජානුයෝජනය ලබා දීමට අධ්‍යාපනය අවශ්‍ය වේ.<br>• සමාජානුයෝජනය තුළ සංස්කෘතිකය පවරාදීම සිදුවේ .<br>සංස්කෘතිය තුළ පුද්ගල චින්තනය ,වේදනය හා චර්යාව ,සමාජ සාරධර්මයන්ට අනුකූලව සංවර්ධනය වේ.මේ සදහාද අධ්‍යාපනය අවශ්‍ය වේ.<br>• නව පරම්පරාවකට සමාජානුයෝජනය ලබාදීම ට අධ්‍යාපනය වැදගත් වන්නේ ඉන් විශාල ක්ෂේත්‍ර ගණනාවක් විධිමත්ව ආවරණය කිරීමට හැකි වීමයි.අධ්‍යාපනය තුළ නව දර්ශන බිහිවීම,නව න්‍යායයන් සංවර්ධනය ,නව උපදේශන ප්‍රවේශ හදුනා ගැනීම තුළ සමාජානුයෝජනය වඩ වඩාත් සියුම්වීම, නිවැරදි වීම,දිශා ගතවීම සිදු කිරීමට සමාජයට හැකි වී තිබේ.නව පරම්පරාවකට එය විශාල වාසියකි. මෙය අධ්‍යාපනයෙන් ලැබුණු අගනා අවස්ථාවකි. |

# 13. සමාජානුයෝගී කාරක

| හැදින්වීම | පාසලේ සමාජානුයෝගී ක්‍රියාවලිය | පාසලේ සමාජානුයෝගී ගැටලු |
|---|---|---|
| අධ්‍යාපන ක්‍රියාවලියේ දී අරමුණු වලට අනුව ක්‍රමවත් අධ්‍යාපනයක් ලබාදීම සඳහා සංවිධානය වූ ආයතන විධිමත් ආයතන වේ.උදා: පාසල /විශ්ව විද්‍යාල )වක්‍රාකාරව අධ්‍යාපනයක් හෝ සමාජානුයෝජනයක් ලබා දෙන පවුල සමවයස් කණ්ඩායම් වැනි සමාජානුයෝගීකාරක අවිධිමත් අධ්‍යාපන කාරක වශයෙන් සැලකේ.<br>**පාසල විධිමත් අධ්‍යාපන කාරකයෙක් ලෙස :**<br>**1.** සංස්කෘතික උරුමය සංකීර්ණ වන විට වැඩිහිටියන්ට පමණක් එය පවරා දීමට නොහැකි වූ විට ඊට නිර්මාණය වූ ආයතනය පාසැලයි.<br>**2.** පුද්ගලයාට දැනුම කුසලතා ප්‍රතිමාන හා අගයන් අගයන් පවරා දීම සඳහා විධිමත්ව මග පෙන්වන ආයතනය ලෙස සමාජයට හුරු කිරීමේ වගකීම පාසලේ ප්‍රධාන කාර්යයි.<br>**3.** පාසන්ස් (1976) පාසලෙන් කෙරෙන කාර්යයන් හතරක් දක්වා ඇත.<br>• ළමයා පවුල සමග පැවති භාවාත්මක සබඳතා වලින් නිදහස් කර ගැනීම .<br>• පවුලට වඩා ඉහළ මට්ටමකින් සමාජ අගයන් ප්‍රතිමාන අභ්‍යන්තරීකරණය.<br>• පාසැල් කාලය පුරාම පුරා ම විවිධාකාර ඇගයීම් ලබාදීම.<br>• වැඩිහිටි භූමිකා පද්ධතියට අවශ්‍ය මානව සම්පත් තේරීම,වෙන් කිරීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම.<br>**4.**ස්පෙන්සර් වාර්තාව : පාසල ඉගෙනීම ලබා දෙන ආයතනයක් පමණක් නොව එය සමාජ ඒකකයක්ද වන බව පවසයි.<br>ජීන් පියාජේ : පවුල සහ සමාජය යන ලෝක දෙක අතර අන්තර් මධ්‍යස්ථානය ලෙස පාසල දකියි.<br>5 පාසැල් වාතාවරණය ( school climate) ළමයාගේ චර්යාව ටත් පන්ති කාමර වාතාවරනය ( Class room climate) ළමයාගේ සාධනය ටත් සාධනය ටත් සෘජුවම බලපායි.<br>6. පාසලේ සමාජානුයෝගී ක්‍රම ශිල්ප අතර ත්‍යාග සහ දඬුවම් ,උපදේශනය,ආදර්ශනය,අනුකරණය වේ.ඒවා අතර ජීවී කාරක ලෙස යටත්වීම ,පිළිගැනීම ,අනුමැතිය ,අනුකූලවීම,එකගවීම,අනුගමනය සහ අනුවේදනය දැක්වෙන අතර, අජීවී කාරක ලෙස විෂය මාලාව,පාලනය,සම්ප්‍රදාය ,සංස්කෘතිය,භෞතික සම්පත් දැක්වේ. | • පරිපාලනය හා කළමනාකරණ යන ක්‍රියාවලිය තුළින් පාසල සමාජානුයෝජනය ට ප්‍රබල දායකත්වයක් ලබා දෙයි.<br>• පාලන නීති රීති හා හා සම්ප්‍රදායන්ට අනුව පාසලක් මෙහෙය වන විට සමාජානුයෝජනය ද පාසලට ආවේණික ලක්ෂණයන්ගෙන් සැදුම් ගනියි.<br>• ලෙවින් හා වයිට් : ප්‍රජාතන්ත්‍රවාදී පාසල් වාතාවරනය නිසා යහපත් සමාජානුයෝජනයක් සිදුවෙන බව පවසයි. ( ඒකාධිපති හා වන්නාටවාදී සමාජ වාතාවරණය සමාජානුයෝජනයට බාධා පමුණුවයි .)<br>• බර්න්ස්ටයින් (1977) පාසල් සංස්කෘතිය තුළ අදෘශ්‍යමාන ශික්ෂණ විද්‍යාවක් මගින් සිසුන්ලේ සාධනයට දිගු කාලීන බලපෑමක් කෙරේ.<br>• පාසලක ක්‍රියාකාරී විෂය මාලාව සමාජානුයෝගී ක්‍රියාවලියේ ප්‍රධාන ක්ෂේත්‍රයයි.<br>මස්ග්‍රේව් : සමාජානුයෝගී විෂයමාලාව කොටස් කරයි.<br>1. අධ්‍යාපනික විෂය මාලාව<br>2. සදාචාර විෂය මාලාව<br>3. සැඟවුණු විෂය මාලාව<br>බර්න්ස්ටයින් (1977) පාසලක සමාජ පන්ති ස්වභාවය ද සමාජානුයෝජන ක්‍රියාවලියට බලපෑමක් ඇති කරයි.පාසලේ ව්‍යක්ත භාෂාවට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් ඇතැම් ශිෂ්‍යයන් ගේ අපේක්ෂා බිඳ වැටේ.<br>**4.** අයිවන් ඉලිච් (1977) සමාජානුයෝගය සමහර සිසුන් ගේ සාර්ථකත්වයට උපකාරී වුවත් සමහර සිසුන් අධෛර්යමත් කරන බව පවසයි.<br>**5.** සමාජානුයෝජනයට ඇතැම් තැනෙක ශිෂ්‍ය උප සංස්කෘතින් ගෙන්ද බාධා එල්ල විය හැක.<br>**6.** සමාජානුයෝගී ක්‍රියාවලිය සජීවිව ක්‍රියාත්මක වන අංශය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියයි.<br>**7.** බාලක බාලිකා වශයෙන් පාසල් වෙන් වෙන්ව පවත්වනවාට වඩා මිශ්‍ර අධ්‍යාපනයේදී සමාජානුයෝජනය මැනවින් සිදුවේ.<br>**8.** පාසලේ සමා ගත කණ්ඩායම් වල අන්තර් ක්‍රියාකාරකම් ක්‍රියාකාරකම් ද අවිධිමත් ලෙස සමාජානුයෝගී ක්‍රියාවලියට දායක වේ.පාසල ප්‍රිය ජනක තැනක් කිරීමට සමාගත කණ්ඩායම් වැදගත්ය.<br>**9.** සිසු -සිසු , ගුරු - සිසු ,සිසු - දෙමාපිය ,ගුරු - දෙමාපිය වැනි අන්තර් ක්‍රියාවන්ද සම වයස් කණ්ඩායම් වලට උත්තේජක සපයයි. | • පාසලේ සමාජානුයෝගී ක්‍රියාවලියේ අඩුපාඩු නිසා සිසුන් තුළ පෞරුෂ ගැටලු ඇතිවිය හැක.<br>• ඇතම් සිසුන් පාසල තුළ නිශ්ක්‍රීය භූමිකාවන්ට පෙළඹවීමක් දැකිය හැක.<br>• පාසල මන්දගාමී ආදී ලෙස සිසුන් වර්ග කිරීම ද සමාජානුයෝගී ක්‍රියාවලියට බාධාවකි.<br>• සිසුවාගේ පවුල් පසුබිම - සමාජ පසුබිම නිසාද පාසලේ සමාජානුයෝගී ක්‍රියාවලියට බාධා පැමිණේ .<br>• ළමයාගේ භාෂාව ද ( ඇතම් කුඩා පාසල් වලින් ද්විතීයික අධ්‍යාපනයට මහා විද්‍යාල එන සිසුන් භාෂාව නිසා අපහසුතාවයට පත් වූ බව පර්යෙෂණ වලින් අනාවරණය විය.මෙනිසා කුඩා සහ අවාසිදායක සමාජ පරිසර වලින් එන සිසුන්ගේ ප්‍රාථමික අධ්‍යාපන කාලය තුළ භාෂා විෂය කුසලතා සංවර්ධනය ගුරුවරයාට මග හැර යා නොහැකි වගකීමකි.)<br>• පර්යේෂණ බොහොමයක් මගින් එළිදරව් කරගත් සත්‍යය නම් මධ්‍ය පාන්තික දරුවනට පාසලේ සමාජ සංස්කෘතිය වඩාත් වාසි සහගත බවයි.සමාජානුයෝගී ක්‍රියාවලිය තුළ වඩාත් ප්‍රයෝජන ලබන්නේද මධ්‍යම පන්තික සිසුන් ය.පාසලක ගුරුවරුන්ද මධ්‍යම පන්තිකවීම මෙම තත්ත්වය මග හැරවීමට දුෂ්කර කර ඇත.<br>අධි සමාජානුයෝජනය නිසා මතුවන ගැටලු<br>• දැඩි විනයානුකූල බව සහිත පාසල් වල ඇතම් සිසුන් අධි සමාජානුයෝගයට ලක්වේ.<br>• දඬුවම් මෙන්ම ප්‍රශංසාවද අසීමාන්තිකව ලබාදීම තුළ ද සිසුවාට තමා පිළිබඳ වලංගුතාව නිවැරදි ව අධ්‍යයනය කර ගැනීම අපහසු වේ.<br>• නවීන තාක්ෂණික මෙවලම් ද අධි සමාජානුයෝජනයට හේතු විය හැක.<br>• පාසල් විෂය මාලාව ,තරගකාරී විභාග පද්ධතිය ද බලපෑම් කරයි.<br>• පවුලෙන් හා පාසලෙන් තරගකාරී ව එල්ලවන ශික්ෂණ බලපෑම් ද හේතු විය හැක.<br>ඌණ සමාජානුයෝජනය :<br>• පුද්ගලයෙක් තුළ පවතින ව්‍යාධි චර්යාවන් (Pathological Behavior ) ට හේතු වන්නේ ඌණ සමාජානුයෝජනය යි.<br>• දරුවෙකුට අවශ්‍ය ආදරය,කරුණාව සහ සැලකීම නොලැබීම නිසා විනාකරණයට හෙවත් අහිමි කිරීමකට භාජනය වේ.<br>• ජෝන් බෝල්බි : අනාථ නිවාස වල ළමුන් මෙන්ම මව හෝ පියා අහිමි වීම තුළ සිටින ළමුන් ද බරපතල පෞරුෂ අක්‍රමිකතා පෙන්වන බවත් එම හේතුවෙන් ඌණ සමාජානුයෝජනය ක් විය හැකි බව දක්වා ඇත.<br>ගැටලු අවම කිරීම :<br>**1.** විධිමත් ශිෂ්‍ය වාර්තා පවත්වා ගැනීම<br>**2.**ප්‍රබෝධමත් සම වයස් කණ්ඩායම් වලට දිරි දෙන ක්‍රීඩා කණ්ඩායම් ,විනෝදාංශ කණ්ඩායම් ( ජායාරූප සමාජ,ගවේෂණ සමාජ ) පාසල තුළ විධිමත්ව පවත්තා ගෙන යාම.<br>**3.** පාසල් පද්ධතියක තුළ විශාල සමාජ පන්ති ස්වරූපයන් පවතින විට සුදුසු උපදේශන ප්‍රවේශ යොදා ගැනීම.<br>**4.** සිසු - සිසු ,ගුරු - සිසු මෙන්ම ආදී ශිෂ්‍ය ප්‍රජා සම්බන්ධතා ශක්තිමත් ව පවත්වා ගැනීම. |

# 13. සමාජානුයෝගී කාරක

## අවිධිමත් සමාජානුයෝගී කාරක.

පවුල : සමාජ විද්‍යා ශබ්ද කෝෂය (1970)නිර්වචනය කරන්නේ පොදු සංස්කෘතියක් නිර්මාණය කරන පුද්ගල සමූහයක් ලෙස යි.

- සමාජයේ අත්තිවාරම පවුලයි.
- පවුල සමාජ ජීවිතයට අවශ්‍ය දැනුම ලබා දෙයි.
- ගැටළු විසඳා සඳහා අත්දැකීම් ලබා දෙයි.
- යහපත් ජීවිතයකට චිත්තවේගී සමබරතාවය පවත්වා ගැනීමට උදව් කරයි.

ළදරු වියට පමණක් නොව ජීවිත කාලයටම වැදගත් සමාජානුයෝගීකාරකය පවුලයි.පෞරුෂ වර්ධනයේ භූමිය එයයි.පවුලක මව ගේ ආදරය නොලැබීම පුද්ගලයෙකුට සෙනෙහසින් තොර පෞරුෂයක් හිමි වන බව ජෝන් බෝල්ට් (1954) පවසයි.

පවුලේ ස්වභාවය :

- විස්තිරණ පවුල (Extended )
- න්‍යෂ්ටික පවුල (Nuclear)

න්‍යෂ්ටික පවුලේ සමාජානුයෝගී දායකත්වය අඩුයි.බිඳ වැටුණු පවුල ට තුළ සම්බාධක සහිත සමාජානුයෝජනයක් සිදුවේ.

පවුලේ ස්වභාවය හා සමාජ පන්තිය අනුව සමාජානුයෝජනය වෙනස් වේ.අවාසිදායක පරිසර ,ආර්ථික ,සංස්කෘතික හා සමාජ අංශයෙන්ද පවතින දුප්පත්කම සමාජානුයෝජනය ට හිතකර නැත

මස්ග්‍රේව් (1970)පවුලේ කාර්යය ලෙස ලිංගික අවශ්‍යතා,ආර්ථික කාර්යභාරය සහ සාමාජීය අවශ්‍යතා දක්වයි.මෙහි සාමාජීය අවශ්‍යතා යනු සමාජානුයෝගයයි.

මර්ඩොක් (1949) පොදු වාසය,ආර්ථික සහයෝගිතාව, ප්‍රජනනය සහ අධ්‍යාපනය දක්වයි.මෙහිද අධ්‍යාපනය යනු සමාජානුයෝජනය යි.

රොනල්ඩ් ෆ්ලෙක්චර් : (1966) පවුලේ කෘත්‍ය (4) ආරක්ෂක , නීතිමය ,චින්දනාත්මක සහ ආගමික යන කෘත්‍යයන් .මෙහි ආගමික කෘත්‍ය යනු සමාජානුයෝජනය යි.

පවුලේ කාර්ය පිළිබඳ ගැටලු

- පවුලේ සාමාජික සංඛ්‍යාව කුඩා වීම.
- ආගමික අධ්‍යයනය පිළිබඳ වගකීම ඉවත්වීම.
- බිඳ වැටුණු පවුල් සංඛ්‍යාව ඉහළ යාම.(ත්‍රස්තවාදී අරගල,යුද්ධ )

පවුලෙන් සමාජානුයෝජනය :

බේල්ස් : තෑගි,දඬුවම් ,ආදරය,ගෞරවය සහ අනුකරණය තුළ සමාජානුයෝජනය සිදුවන බව පවසයි.

භාෂාව අභ්‍යන්තරීකරණය ට පවුල වැදගත්.අධ්‍යාපනයේ අත්තිවාරම පවුල යි.

පියාජේ : බුද්ධි සංවර්ධන න්‍යාය ට අනුව සංයුක්ත චින්තනය සිට වියුක්ත චින්තනය දක්වා ප්‍රජානන ක්ෂේත්‍රයේ වර්ධනයට පවුලේ ඇසුර දායක වේ. සදාචාර වර්ධනය ගුණධර්ම අනුකරණය තුළ සදාචාර අධ්‍යාපනය පවුලෙන් සිදුවීම සමාජානුයෝජනයට ප්‍රබල බලපෑමක් කරයි.

## සමපදස්ත කණ්ඩායම් (The Peer Groups)

අයිවන් මොරිස් : (1976) සමාන පුද්ගලයන්ගෙන් සමන්විත,නිරතුරුව අන්තර් ක්‍රියාකාරී වන,එම අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස චින්තනය ,හැසිරීම් පිළිබඳ සමාන ප්‍රතිමාන ,ආකල්ප ගොඩ නගා ගන්නා කණ්ඩායම සම වයස් කණ්ඩායම යි.

- සම මට්ටමේ හැඟීම් ඇත.
- මානසික බැඳීම් ප්‍රබලය.
- ආවේණික උප සංස්කෘතියක් ඇත.
- සිරිත් විරිත් ,ඇඳුම් පැළඳුම් , ඇගයුම් පවතී.
- ස්වේච්ඡා කණ්ඩායම් නිසා සීමා මායිම් අස්ථාවරය.
- ඇතම් විට දැඩි අභ්‍යන්තර ව්‍යුහයක් ඇත.ව්‍යුහය තීරණය කරන්නේ කුසලතා,මිත්‍රශීලී බව වැනි සාධක.
- කැපී පෙනෙන්නෝ නායකයන් වෙති.
- යමෙක් එකම කාලයක කණ්ඩායම් ගණනක සිටිය හැකියි.
- ආයතන ගත හෝ නිත්‍යානුකූල බව නොසලකයි.
- එහෙත් සමාජ ගත කිරීම ප්‍රබලය.
- අවු. 6 – 12 කණ්ඩායම් විසුරුවා හැරිය හැකි නමුත් අවු. 12 – 18 කණ්ඩායම් එසේ කළ නොහැක .
- සමාජගත කණ්ඩායම් විධිමත් හා අවිධිමත් ලෙසද බෙදා හඳුනා ගත හැකිය.

බිහිවීම ට බලපාන සාධක :

1. මැක්ඩුගල්ට අනුව රංචු ලැදියාව. මෙම අන්තර් ක්‍රියාවලිය සමාජ විද්‍යාත්මක අවශ්‍යතාවකි.
2. පවුල හා සමාජය අතර අන්නෝන්‍ය ලෙසින් සබඳතා නැති වූ විට හෝ බිඳ වැටුණු විට මෙම කණ්ඩායම් බිහිවෙයි.
3. දෙමාපිය දරු සබඳතා බිඳ වැටීම තුළ ළමයා සමාජයට යයි.
4. නූතන තාක්ෂණය තුළ සමාජ ජාල කණ්ඩායම් ,FB ,Whats App groups ආදී ලෙස විශාල පරාසයක විහිදෙයි.

පාසල තුළ සම වයස් කණ්ඩායම්

වැඩිහිටි සංස්කෘතියට වෙනස් ශක්තිමත් ශිෂ්‍ය සංස්කෘතියක් පාසල් වල පවතින බව කෝල්මන් (1961) සඳහන් කරයි.

1. ළමුන් තුළ තුළ ජනප්‍රිය ක්‍රියාකාරකම් සඳහා පාසල තුළ ද
2. නිදැල්ලේ සිටීම සඳහා පාසලෙන් පිටත ද මෙවැනි සමාජ කණ්ඩායම් පවතී.

මෙම කණ්ඩායම් වලට නතු නොවන සිසුන්ට පාසල හැර යාමට පවා සිදුවූ අවස්ථා වාර්තා වේ.පාසලේ අපේක්ෂණයන්ට එකඟ සහ පාසලේ අපේක්ෂකයන්ට එකඟ නොවන කණ්ඩායම් ද පැවතිය හැකිය.

අධ්‍යාපන ක්‍රියාවලිය ට දායකත්වය

- ගුරුවරයාට මෙම කණ්ඩායම් ක්‍රියාවලිය හඳුනාගැනීම සඳහා මොරිනෝ ඉදිරිපත් කර ඇති සමාජ මිතික පරීක්ෂණ ශිල්ප ක්‍රමය යොදා ගත හැක.
- ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් මෙම කණ්ඩායම් වල වෙනස්කම් පවතී.සමවයස් කණ්ඩායම් වල ගැහැණු ලමුන් සබඳතා මත වැඩ කරයි.පිරිමි ලමුන්ගෙ එබඳු හැසිරීම් දැකීම අසීරු.

පාසල,මෙම කණ්ඩායම් වල සමාජ ජාල මැනවින් හඳුනා ගත යුතුයි .ඔවුනට නොදැනෙන්නට මඟ පෙන්වන නම්‍ය වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළ යුතුයි .

## ජන මාධ්‍ය (සන්නිවේදන මාධ්‍ය )

වර්ග 1. අන්තර් පුද්ගල සන්නිවේදනය (පෞද්ගලික සන්නිවේදන ක්‍රම)
2.සමූහ සන්නිවේදනය ( භාෂණය ,ලේඛනය , සංඥා)

විල්බට් ශ්‍රැම්: ගැබ් වූ වූ සංඥාවක් කරණ කොට දෙපාර්ශවයක් අතර එක හා සමාන චිත්ත තත්ත්වයක් ඇති කරලීම සන්නිවේදනයේ බව පවසයි.

පුළුල් ජන සමාජයකට පණිවිඩ හුවමාරු කර ගැනීම ජන සන්නිවේදනය යි.

- ජන මාධ්‍ය : පොත්,පුවත්පත් ,සඟරා,පෝස්ටර් පත්‍රිකා, ප්‍රකාශන.
- විද්‍යුත් මාධ්‍ය : ගුවන්විදුලිය,සිනමාව,රූපවාහිනිය,දූරකථනය,චිත්‍රපට ,සන්දේශ චන්ද්‍රිකා ,අන්තර් ජාලය .
- මහාචාර්ය හැරල්ඩ් ලැස්වස් දක්වන පරමාර්ථ :

1. මිනිසාට සහ සමාජයට සිය පරිසරය ගැන කරුණු කියාදීම.
2. මිනිසාගේ සහ සමාජයේ සමාජ මතය සකස් කිරීම.
3. දැනුම පුද්ගලයාගේ පුද්ගලයාගෙන් පුද්ගලයාට සහ පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යාම. පසුව විල්බට් ශ්‍රාම් මෙයට,
4. විනෝදාස්වාදය ලබාදීම එකතුකරන ලදී.

රූපවාහිනිය ගුවන්විදුලිය ,මුද්‍රිත මාධ්‍ය සහ අන්තර්ජාලය සමාජානුයෝජනය ට ක්‍රියාවලියට වැඩි බලපෑමක් කරයි.

1992 ජාතිකජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සන්නිවේදනය ප්‍රධාන අධ්‍යාපන කාරකයක් ලෙස ජාතික අධ්‍යාපන අරමුණු වලට එකතු කොට ඇත.

සමාජානුයෝජනයට බලපෑම :

1. ළමා මනසට මනසට ප්‍රබල බලපෑමක් කරයි.
2. ඉහළ සමාජ පන්ති වල දරුවන්ට වැරදි සමාජානුයෝජනයක් සිදු වන බව පර්යේෂණ හෙළි කරගෙන ඇත.
3. නූතන මාධ්‍ය පහසුකම් ඇති ගුරුවරයාගෙන් ඉගෙන ගන්නා ළමයින්ගේ දැනුම වැඩි වැඩි බව.
4. ආකාර දෙකකින් ජනමාධ්‍ය සමාජයට බලපාන බව.

- ප්‍රතිජනනාත්මක බලපෑම්
- ප්‍රතිෂේධාත්මක බලපෑම්

නෝබල් (1975) නාගරීකරණය තුළ තනි වී ඇති පවුල්වල ළමයි තනිකම මගහරවා ගැනීමට ප්‍රයෝජනවත් වූ බව සඳහන් කරයි.

වැදගත්කම :

- සංස්කෘතිය ආරක්ෂා කිරීමේ කාරකයක් ලෙස යොදා ගත හැකිය.
- සම කාලීන සමාජ ජීවියකු බිහි ජීවියකු බිහි කිරීමට යොදා ගත හැක.
- පුද්ගල ශක්‍යතා වර්ධනයටඅවශ්‍ය පසුබිම සකස් කිරීමට.
- පොදු සමාජයේ අධ්‍යාපන අවශ්‍යතා සකස් කිරීමට .
- විශ්ව පුරවැසියෙක් බිහි කිරීමට .

අයහපතට බලපාන සාධක :

1. දෙමව්පිය දූ දරු සබඳතා අඩු කරයි.
2. ළමුන් ආක්‍රමණශීලී චර්යාවන්ට නැඹුරු වෙයි.
3. ළමයාගේ අධ්‍යාපන කටයුතු වලට සෘජු බාධකයක් ලෙස කටයුතු කරයි.
4. වැඩිහිටි හා බාල උප සංස්කෘතික අතර පරතරය අඩු කරයි.
5. වෙළඳ ප්‍රචාරණ තුළින් පරිභෝජනවාදී ආකල්ප ඇති කරයි.
6. රූපවාහිනිය සං ස්කෘතික ආයුධයක් ලෙස ක්‍රියාත්මක වන බව.

සමාජානුයෝජන ගැටලු :

- බාලයන් චරිත අනුකරණය.
- ඉදිරිපත් කරන සියල්ල බොහෝ දෙනා ගේ අභිමතය අභිමතය නොවීම.
- පාරිභෝගිකවාදී ආකල්ප සමාජ ය තුළ ඇතිවීම .
- සංස්කෘතියට නොගැලපෙන හැසිරීම් බහුල වීම.

(තවත් තොරතුරු එකතු කර ගන්න )

# 14.සංස්කෘතිය සහ අධ්‍යාපනය

| සංස්කෘතිය හැදින්වීම සහ අධ්‍යාපනය අතර ඇති සම්බන්ධය | නිර්වචන | සංස්කෘතියේ ස්වභාවය සහ කාර්යභාරය | සංස්කෘතික වෙනස්වීම් සහ අධ්‍යාපනය |
|---|---|---|---|
| සංස්කෘතිය:සමාජයක් අධ්‍යයනය කිරීමේ විෂය සමාජ විද්‍යාවයි.සංස්කෘතිය සහ සමාජය එකිනෙකට වෙන් කළ නොහැකි සංකල්ප දෙකකි.සමාජය අධ්‍යයනයට සංස්කෘතියත්,සංස්කෘතිය අධ්‍යයනයට සමාජයත් එකිනෙකට වැදගත්වේ.සමාජය පුද්ගල අන්තර් ක්‍රියාකාරකම් වල සමාජීය එකතුවකි .සමාජයේ ජනතාවගේ ජීවන ක්‍රමය සංස්කෘතිය යි.ලෝකයේ ප්‍රාථමික සමාජ ,ගැමි සමාජ ,නාගරික සමාජ,සමාජ ජාලා,පාතාල සමාජ වැනි විවිධ සමාජ පවතී.<br>සමාජයකින් තොරව සංස්කෘතිය හෝ සංස්කෘතියකින් තොරව සමාජ යක් නොපවතී.සතුනට සමාජ ජීවිතයක් ඇතත් සංස්කෘතියක් නැත.<br>පුද්ගලයා තම සමාජයේ සාමාජිකත්වය නිසි පරිදි ලබා ගන්නට නම් සංස්කෘතික දායාද උරුම කර ගත යුතුයි . අනෙකුත් සතුන් ස්වාභාවික පරිසරයක ඉපිද ස්වාභාවික පරිසරයක මිය යන අතර,මිනිසා සංස්කෘතික පරිසරයක ඉපිද සංස්කෘතික පරිසරයක මියයයි.<br>සංස්කෘතිය මිනිසාගේ සාමාජීය උරුමයකි.සංස්කෘතිය ස්පර්ශ කළ නොහැක.එය දර්ශනයට ඇහට/කනට) හසු වන්නක් නොවේ.සංස්කෘතිය සොයන විට දැක ගත හැක්කේ සාමාජීය ක්‍රියාකාරකම් රැසක් පමණි.එය සමාජීය ක්‍රියාකාරකම් පිටුපස ඇති බලවේගයකි.<br>බර්නාඩ් රොසන්බර්ග් : " ඔබ කතා කරන්නේ බල්ලන් ගැන නම් සංස්කෘතියක් ගැන කතා කළ නොහැකි නමුත් ,ඔබ කතා කරන්නේ මිනිසුන් ගැන නම් අනිවාර්යයෙන් සංස්කෘතියක් ගැන කතා කිරීමට සිදු වනු ඇත." | සංස්කෘතිය යන්නට **Oxford** ශබ්දකෝෂයට අනුව පිළිගත් නිර්වචන **164** වඩා දක්වා ඇත.එඩ්වඩ් ටයිලර් **(1871)** පිළිගත් වැදගත් නිර්වචනය ඉදිරිපත් කර ඇත. "ඕනෑම මිනිසෙකු සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ජීවත් වෙන පරිසරය තුළ හුරු පුරුද්දෙන් හා තම හැකියාවෙන් ලබන දැනුම,විශ්වාසය,කලාව,සදාචාරය, නීති රීති සිරිත් විරිත් යන සංකීර්ණ සමස්තය සංස්කෘතිය වේ".<br>නිර් වචනයේ ප්‍රධාන අංශ **(03)**<br>• කාලය : අඛණ්ඩ ඓතිහාසික ක්‍රියාවලියක් ලෙස ගමන් කරයි.<br>• ඉගෙනුම් ක්‍රියාවලියක් : උපත්තිය නිසාම සංස්කෘතිය ගැන අවබෝධයක් නොලැබේ.එය උගත යුතුයි .<br>• චර්යාවන්ට මග පෙන්වීම : විවිධ අවස්ථාවල සමාජයේ හැසිරිය යුතු ආකාරය පෙන්වා දීම.<br><br>විස්ලර් : " භාෂාව ,විවාහය ,අයිතිය පිළිබඳ ක්‍රම ආචාර සමාචාර විධි,කර්මාන්ත ශිල්ප කලා සියල්ල සංස්කෘතියයි.<br>රේමන්ඩ් පර්ත් : "අප සමාජයේ විසීමෙන් ලබන කාටත් පොදු වූ,නිතර භාවිතා කරන අනාගත පරම්පරාවට භාර දෙන,හැසිරීම් මෝස්තර පිටුපසින් ඇති අදහස් සමුදාය සංස්කෘතිය යි " | • සංස්කෘතිය පුද්ගලයා ඉගෙන ගත් දෙයකි.<br>• සංස්කෘතිය ව්‍යුහගතය.<br>• එය විවිධ විවිධ කොටස්වලට බෙදෙයි.සාමාජිකයන් හා පරම්පරා අතර බෙදා හදා ගනියි.<br>• සංස්කෘතිය ගතිකයි.පල් නොවේ.<br>• පුද්ගලයාගේ සමාජ ජීවිතය නිරවුල් කර දෙන ඊට මඟ පෙන්වන්නකි.<br>• එය සමාජයෙන් සමාජයට විවිධය.<br>• සංස්කෘතිය හොඳින් අනුකලනය වී තිබේ.<br>• එය පුද්ගල පෞරුෂය නිර්මාණය කරයි.<br>• සංස්කෘතිය සමාජ ගලන උපකරණයකි.(ගලා යාමට උදව් වන)<br>• එය දැනුමේ භාණ්ඩාගාරයයි.<br>සංස්කෘතිය හැඩගැසීමට බලපාන සාධක:<br>**1.**කාලගුණය සහ දේශගුණය .(උදා : උණුසුම් රටවල සංස්කෘති පුරුදු / ඇඳුම් පැළඳුම් )<br>**2.** රටක භූගෝලීය පිහිටීම. උදා : ලුණු ලේවායන්/ධීවරකර්මාන්තය )<br>**3.**රට මුහුණ දෙන ඓතිහාසික සංසිද්ධි.(උදා : මෙරට විජයගේ පැමිණීම,මහින්දාගමනය තුළ බෞද්ධ සංස්කෘතියක් ස්ථාපනය,යටත් විජිත යුගයේ බටහිර සංස්කෘතිය )<br>**4.** අර්ථ ක්‍රමයේ ස්වභාවය. (රජු හා කෘෂිකර්මය / යටත්විජිත යුගයේ වැවිලි).<br>**5.** ආගමික මතවාද : සිංහල බෞද්ධ සිංහල කතෝලික /දෙමළ හින්දු දෙමළ බෞද්ධ වැනි කණ්ඩායම් වල සමාජීය වෙනස්කම් . | පාසල සමාජයේ ආකෘතියයි.සමාජයේ සිදුවෙන වෙනස්කම් සෘජුවම පාසලට දැනේ.පාසලේ කාර්යය කොටස් **02**<br>• සංස්කෘතිය පවරාදීම (වටිනා සංස්කෘති හරයන් පවරාදීම )<br>• සංස්කෘතිය වෙනස් කිරීම (නොගැලපෙන නිසරු හරයන් ඉවත් කිරීම )<br><br>අධ්‍යාපනය යනු පුද්ගල සංවර්ධනයයි.<br>• සාමාජීය සංවර්ධනය<br>• චිත්තවේගික සංවර්ධනය<br>• මානසික සංවර්ධනය<br>• ශාරීරික සංවර්ධනය යන ක්ෂේත්‍ර ඊට අදාළ වේ.චරිත සංවර්ධනය යන ක්‍රිස්තියානි සංකල්පය තුළ පුද්ගලයා පව් සමග උපදින බවත් ,පවු නැති කිරීමේ මාර්ගය අධ්‍යාපනය ලෙසත් සැලකේ. සංස්කෘතිය සංවර්ධනය වන්නේ අධ්‍යාපනය තුළිනි.පුද්ගලයා සංස්කෘතිය ලෙන යන වාහකයායි.<br>පුද්ගලයා ජීවීත කාලය මුලුල්ලේම සංස්කෘතිය පවරාදෙයි.හැම සමාජයකම හැසිරීම් පද්ධතිය ,පොදු සංඥා හා සංකේතාවලිය,ද්‍රව්‍යමය නිෂ්පාදිතය බාල පරපුරට පවරාදේ.<br>සංස්කෘතිය පවරාදීම සිදුවන සැටි<br>• උත්සාහයෙන්<br>• නිරුත්සාහයෙන්<br>• සවිඥානිකව (හිතාමතා )<br>• අවිඥානිකව<br>(අවුරුදු කාලය,මල්වර උත්සව,විවාහ චාරිත්‍ර ,අවමංගල චාරිත්‍ර ,විෂය බාහිර ක්‍රියාකාරකම් වැනි අවස්ථා අධ්‍යයනය කරන්න.<br>හින්දු : පුද පූජා විධි ,වේල් උත්සව<br>කිතුණු : මලවුන්ගේ නැගිටීම් වැනි.<br>වර්තමාන ලෝකයේ දී සංස්කෘතිය ඉක්මනින් වෙනස් වන නිසා සමාජයක අධ්‍යාපන පරමාර්ථ ද ඒවාට හැඩ ගැසිය යුතුයි .උදා : එකළ ළමුනට දඬුවම් දීම ගුරු ,දෙමාපිය හැමගේ අනුමැතිය මත සිදුවීම.වර්තමානයේදී එය ළමා හිංසනයක් ලෙස සැලකීම. |

# 14.සංස්කෘතිය සහ අධ්‍යාපනය

| සංස්කෘතිය සම්ප්‍රේෂණය සඳහා පාසලේ කාර්ය භාරය | පාසල් විෂය මාලාව තුළින් සංස්කෘතිය හා අධ්‍යාපනය ( ශාස්ත්‍රීය ,සදාචාර හා විෂය සමගාමී ) | පාසල් සංස්කෘතිය හැඳින්වීම |
|---|---|---|
| • පාසල වර්ධනය කරන සංස්කෘතික ගුණාංග සිරිත් විරිත්,අදහස් උදහස් ,ගති පැවතුම් ,ආකල්ප (මේ සඳහා විෂය මාලාව සකස් සකස් වී ඇති ආකාරය අධ්‍යයනය කරන්න.විශේෂයෙන්ම ප්‍රාථමික විෂය මාලාව )<br>• විෂ සමගාමී,විෂයානුබද්ධ සහ විෂය බාහිර ක්‍රියාකාරකම් තුළින් සමාජ පැවැත්ම සඳහා අවශ්‍ය නීති රීති,විනය ගරුක බව,සමාජ කුසලතා,අවංක බව,යුක්ති ගරුක බව,සාරධර්ම ලබාදෙයි.මේ සඳහා විවිධ ක්‍රියාකාරකම්,පැසසුම් මෙන්ම දඬුවම් ද යොදා ගැනේ.<br>• පාසලේ ඉතිහාසය ,දැක්ම,මෙහෙවර,අධ්‍යයන අනධ්‍යයන ක්‍රියාකාරකම් ,සමිති සමාගම්,වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය ,ක්‍රීඩා තරගාවලී සංස්කෘතිය පවරා දෙන මෙවලම් වේ.<br>• සැඟවුණු විෂය මාලාව තුළ පාසලක සංස්කෘතිය මැනවින් අධ්‍යයනය කළ හැක.පාසැල් සංස්කෘතියෙන් ළමයා උකහා ගන්නා දේ ඔහු/ඇය සමාජය වෙත සම්ප්‍රේෂණය කරයි.ළමයා ඔහු උගත් පාසලේ කැඩපතකි.<br>• ජීවිතයේ මුලුල්ලේම සමාජයට අනුව හැඩගැසීම ' සංස්කෘතිකකරණය' යි.එය සෑම සමාජයකම අධ්‍යාපනය පදනම්ව සිදුවේ.එය විධිමත් ,නොවිධිමත් ,අවිධිමත් වැනි ඕනෑම අධ්‍යාපනයකින් සිදුවිය හැකි අතර,විධිමත් අධ්‍යාපනය එය වඩා විධිමත් ව සිදු කරයි.<br>• නූතන තාක්ෂණික මෙවලම් නිසා පුලුල් වූ ඩිජිටල් සමාජ අවකාශ තුළ සංස්කෘතික සම්ප්‍රේෂණය අභියෝගයට ලක්ව ඇත.21 සියවසේ ඇල්ෆා පරම්පරාවේ දරුවන් ජාතික හෝ දේශීය සංස්කෘතියකට වඩා ගෝලීය සංස්කෘතියකට යොමුව ඇති බැවින් රටක අධ්‍යාපන පරමාර්ථ ද ඒ අනුව වෙනස් වෙනස් විය යුතුව ඇත. | ශාස්ත්‍රීය : මව්බසින් භාෂාව ,සාහිත්‍යය ද,සමාජ අධ්‍යාපනයෙන් පුරවැසි බව හා නීති රීතිද,ඉතිහාසයෙන් සංස්කෘතික සභ්‍යත්වය හා ප්‍රෞඪත්වය ද, චිත්‍ර මගින් කලා කැටයම් මූර්ති හා බැඳුණු චරිනාකම්ද,නැටුම් උඩරට,පහතරට,සබරගමු වැනි සම්ප්‍රදායන්,සංගීතයෙන් ජනකවි,ජන ගී ආදී අතීත ,වර්තමාන සංස්කෘතික උරුමයන් ගැනගැන හැදෑරීම.<br>• සදාචාර විෂය මාලාව තුළ ආගමික අධ්‍යාපනය.<br>• විෂය සමගාමී ,ආගමික සාමාජීය උත්සව,මා පිය වන්දනා,පෙරහැර,චාරිකා,පොත් පිංචි සැකසීම ,බිත්ති පුවත්පත් ,උදය රැස්වීම් වැනි.<br>ගුරු කාර්යභාරය තුළින්<br>• පළමුව ගුරුවරයා පාසල් සංස්කෘතිය හැදෑරිය යුතුයි.<br>• සංස්කෘතිය පවර දෙන්නෙත් සංස්කෘතිය වෙනස් කරන්නෙත් ගුරුවරයායි.<br>• ඔහුට පාසලේ දැක්ම හා මෙහෙවර ගැන පුලුල් අවබෝධයක් අවශ්‍යයි.<br>• සංස්කෘතිය වෙනස් කරන විටත් පවරා දෙන විටත් පුලුල් අවබෝධයක් තිබීම වැදගත්.<br>• ගුරුවරයා ප්‍රජාවට වගකිව යුතුයි. ප්‍රජාව ගේ සංස්කෘතියට ගරු කළ යුතුයි.<br>• ප්‍රජාවක සංස්කෘතිය හඳුනා ගෙන එහි දුබලතා අධ්‍යයනය කර වෙනස් කිරීම කළ යුතුයි . | හැම පාසලකටම ඊට අනන්‍ය වූ පාසල් සංස්කෘතියක් ඇත.එය සමාජ දේශගුණය මත පදනම් වේ.කෘෂි ,වානිජ ,ධීවර,නාගරික,ආදිවාසී ,වතුකරය වැනි විවිධ සමාජ පද්ධති වල පාසල් වල සංස්කෘතිය එකිනෙකට වෙනස්ය.<br>• පාසල් සංස්කෘතියේ අංග : ගීතය,කොඩිය,දැක්ම,මෙහෙවර,ගොඩනැගිලි,භූමිය,වැට,වැසිකිළි ,පන්ති කාමර,බුදු මැදුර,ආදී සියල්ල සංස්කෘතිය විදහා දක්වයි.<br>• පාසල් සංස්කෘතියේ විවිධත්වය ; පාසල් සංස්කෘතිය එළි දකින අවස්ථා ලෙස විෂය සමගාමී ක්‍රියාකාරකම්,පාසලේ විභාග ප්‍රතිඵල,පාසලේ ක්‍රීඩා තරඟ,පාසලේ සමාජීය වැඩ සටහන් ,නිල ඇඳුම් ,අතිරේක පන්ති,සුබ සාධන සේවා,විනය ගරුක බව ආදී සියල්ල දැක්විය හැක.<br>• ඵලදායී පාසල් සංස්කෘතියක් සංවර්ධනය කිරීම<br>1.සංස්කෘතිය සමාජ උරුමයකි.එය පාසලේද සමාජ උරුමයකි .එය බෙදා හදා ගන්නා හැසිරීම් රටාවකි.<br>2. සදාචාර විෂය මාලාවෙන් පාසලට ආවේනික සංස්කෘතිය ප්‍රබලව පවරා දිය හැක.<br>3. පාසලක් හ හුරු වී පවත්වා ගෙන යනු ලබන රටාව සංස්කෘතිය යි.<br>4. පාසල භාෂාව උපයෝගී කර ගෙන සංස්කෘතිය පවරා දෙයි.<br>5. විශ්ව සංස්කෘතිය පැවරීමේ වගකීමද පාසල සතුයි.<br>6. අධ්‍යාපන සාධනයට පාසල් සංස්කෘතිය ප්‍රබල බලපෑම් කරයි.<br>7. තරගකාරී පාසල් හා ජනප්‍රිය පාසල් තීරණය කරන සාධකය එකී පාසල් වල සංස්කෘතික සාධකයයි.<br>8. සමාජ විරෝධී කණ්ඩායම් බිහිවීම සිදු වන්නේ පාසලක සංස්කෘතිය බිඳ වැටීම තුළය.<br>9. ඵලදායී පාසලක ජීව රුධිරය එම පාසලේ සංස්කෘතියයි.<br>10. ඕනෑම පාසලක සැඟවුණු විෂය මාලාව ක්‍රියාත්මක වන්නේ පාසල් සංස්කෘතියට සමගාමීවයි. |

# 15. බහු සංස්කෘතික අධ්‍යයනය

| බහු සංස්කෘතික අධ්‍යයනය | බහු සංස්කෘතික අධ්‍යාපනය ජාතික ඒකාබද්ධතාවයට හා සහජීවනයට වැදගත් වන ආකාරය | ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ අභියෝගය | අභියෝග ජය ගැනීමේ උපාය මාර්ග |
|---|---|---|---|
| බහු සංස්කෘතිය පිළිබඳ සංකල්පය හැදින්වීම<br>නිර්වචනයන් :<br>"විවිධ සංස්කෘතින්හි පිරිස් එකම භූගෝලීය අවකාශයක සහජීවනයෙන් ජීවත්වීම "<br>**banks and banks 1995**<br>"විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයන්ගේ සාහිත්‍යය අගයයන් හා පර්යාවලෝකනයන් අන්තර්ගත වන ආකාරයෙන් ඉගැන්වීම "<br><br>හැදින්වීම :<br>1.සංස්කෘති දෙකක් හෝ ඊට වැඩි ගණනක් පවතින සමාජ වල ක්‍රියාත්මක වන අධ්‍යාපනය බහු සංස්කෘති අධ්‍යාපනයයි.<br>2. සැම සංස්කෘතියක් තුළම ජීවත් විය හැකි සංස්කෘති සාක්ෂරතාවක් ලබාදීම මෙහි අරමුණු යි.<br>3. ජාතික ඒකාග්‍රතාවය ඇති කිරීමට මෙම සංකල්පය යොදා ගනී.<br>4. ගෝලීයකරණය නිසා සියලු වාර්ගිකයන් ඒකාබද්ධ කටයුතු කිරීමට සිදුවේ .<br>5. විවිධ සංස්කෘති වලින් පෝෂණය ලබා ගැනීමේ අවශ්‍යතාව මත බහු සංස්කෘතික අධ්‍යාපනයට යොමු වේ.<br>6. වෙනත් සංස්කෘතින් සමග ගැටීම් වැලක්වීමද,සමාජ ආකල්ප නිවැරදි දිශානතියන් යොමු කිරීමටත් යොදා ගනී.<br>7. බහු භාෂීය,බහු වාර්ගික ,බහු ආගමික සියලු සමාජ කණ්ඩායම් බැඳ තබන හුය මෙයයි.<br>8. ජන වාර්ගික ප්‍රශ්න විසදීමට යොදා ගන්නා ප්‍රයත්නයකි<br><br>බහු සංස්කෘතික අධ්‍යාපනයේ අරමුණු :<br>• පුද්ගල සමූහ හා ජාතීන් එකිනෙකා මත යැපෙන බැවින් අන්තර් සබදතා අවශ්‍ය බව .<br>• ජාතාවාදය හා ජාතිවාදී හැගීම් පුද්ගල දැනුවත් බව.<br>• විවිධ වාර්ගික ළමා අවශ්‍යතා සැලකිල්ලට ගැනීම.<br>• සංස්කෘති විවිධත්වය විෂය මාලාව තුළ පිළිබිඹු වීම.<br>• යම් යම් වාර්ගික කණ්ඩායම් වල අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වැලක්වීම .<br>• දේශපාලන බලය සම්බන්ධව තීරණ වලට බලපෑම් කිරීම . | • බහුසංස්කෘතික අධ්‍යාපන ප්‍රතිපත්ති මගින් තුන් ආකාරයක බලපෑම් සිදුවේ.<br>1. අධ්‍යාපනය මගින් බහු බහුසංස්කෘතික පරතරය තුනී වීම.<br>2. සියලුම ජාතීන්ට සමාන අයිතිවාසිකම් ලබා දී වෙනස පවත්වාගෙන යාම.<br>3. සාමාජීය උස් පහත් භේදයන් එයාකාරයෙන්ම පවත්වා ගෙන යාම.<br>බහු සංස්කෘතික අධ්‍යාපනයේ මාන 5 කි.<br>1. විෂය මාලාවේ අන්තර්ගතය.<br>2. දැනුම සංවර්ධනය කිරීම.<br>3. පූර්ව නිගමන වලට එල්බ ගැනීම අවම වීම.<br>4. ඒකීයත්වය ඇතිවන ලෙස කටයුතු කිරීම .<br>5. පාසල් සංස්කෘතික බල ගැන්වීම . | • රටක සියලුම මානව කණ්ඩායම් වලට ගරු කිරීම මෙරට විවිධ අණපනත් මගින් ඉදිරිපත් කර ඇතත්,ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කිරීම දුෂ්කර වී ඇත.විවිධ දේශපාලන බල කණ්ඩායම් බලය ලබා ගැනීම ගැනීම සඳහා ජාතිය භාෂාව සහ ආගම උපායශීලීව භාවිතා කරනු ලබන බව දක්නට ලැබීම .<br>• ජාතික අධ්‍යාපන අරමුණු මගින් සමාන විෂයමාලා අවස්ථාවන් යෝජනා කර ඇතත් ඒවා කිරීමේ දුෂ්කරතා පවතී.<br>• සියලුම පාසැල් වල සමාන සම්පත් භාවිතය තහවුරු කිරීම යෝජනා කර ඇත ඇතත් ඊට ප්‍රායෝගික දුෂ්කරතා පැවතීම.<br>• ජාතික,වාර්ගික ලෙස පීඩාවට පත්ව සිටින සිසුන් බල ගැන්වීම අපේක්ෂිත නමුත්,එය ප්‍රායෝගිකව දුෂ්කර වීම.<br>• සංකල්පය පිළිබඳව ගුරුවරයාගේ දැණුම යාවත්කාලීන කිරීම යෝජිත නමුත් සැලසුම් සහගත ලෙස එබඳු වැඩ සටහන් ක්‍රියාත්මක නොවීම.<br>• සිංහල,දෙමළ,මුස්ලිම් වැනි ජාතිකත්වය මත පාසල් වර්ගීකරණය කිරීම ද බාධාවකි.<br>• සිංහල බෞද්ධ ,සිංහල කතෝලික, දෙමළ හින්දු /කතෝලික ලෙස පසල් නාමකරණය ද බාධාවකි. | 1. පාසල තුළ අභියෝගය ජය ගැනීම සඳහා විෂය මාලාව තුළින් මෙන්ම විෂයමාලාවට පිටතින්ද ක්‍රියාකාරකම් සංවිධානය කළ හැක.<br>උදා : විෂය තේමාත්මක වැඩසටහන්,සමස්ත පාසලම එක්වන ජාතික සහ ආගමික උත්සව,සංස්කෘතික රසාස්වාදනය මගින්.<br>2. දෙවනබස හඳුන්වා දීම හා එය අනිවාර්ය කිරීම .<br>3. සන්නිවේදනයට ද්වි භාෂා සංකල්පය .<br>4. මැදහත් භාෂාව ලෙස ඉංග්‍රීසි යොදා ගැනීම .<br>5. පුරවැසි අධ්‍යාපන විෂය බල ගැන්වීම .<br>6. ළමා මිතුරු පාසල් සංකල්පය වර්ධනය කිරීම<br>7. අන්තර්කරණ අධ්‍යාපන පහසුකම් සංවර්ධනය කිරීම.<br>ගෝලීය සංස්කෘතියක් කරා ප්‍රවිෂ්ට වීම.<br>• මැදිහත් භාෂාව ලෙස පිළි ගන්නා ඉංග්‍රීසි ඉගෙන ගැනීම සහ ඉගැන්වීම අවස්ථා හැකිතාක් පුලුල් කිරීම .<br>• ජාත්‍යන්තර වශයෙන් පවතින සමාජ යථාර්ථය හඳුනාගෙන බහු සංස්කෘතික අභියෝගයනට මුහුණදිය හැකි ප්‍රජාවක් බිහි කිරීම<br>• වාර්ගික ,ජාතික හා ජාත්‍යන්තර අනන්‍යතාව පිළිබඳ ගැටලු සැලකිල්ල ට ගනිමින් එම අංශ තුන අතර තුලනයක් ඇති කිරීමට කටයුතු කිරීම . |

# 16. ගෝලීය සංස්කෘතිකට ප්‍රවේශවීම

| ගෝලීය සංස්කෘතිය හැඳින්වීම | එහි (ගෝලීය සංස්කෘතිය ) ඇති අවශ්‍යතාව. | ගෝලීය සංස්කෘතියේ වාසි / අවාසි | සංස්කෘතින් අතර සංවාදශීලී හා සහ ජීවනය ගොඩනැගීම සඳහා ගුරු කාර්ය භාරය. |
|---|---|---|---|
| ගෝලීයකරණය සංකල්පය 1981 ජෝන් මැක්ලීන් ඉදිරිපත් කරන ලද අතර,1985 දී රෝලන් රොබට්සන් ගෝලීය සංස්කෘතිය යන සංකල්පය ඉදිරිපත් කරන ලදී.<br>සමස්ත ලෝ වැසියා පොදු සංස්කෘති න්‍යාය පත්‍රයකට අනුව කටයුතු කිරීම සරල නිර්වචනය යි.<br>සියලු රටවල සංස්කෘති තව දුරටත් දේශීය අනන්‍යතාව තුළ නොපවතී.<br>ලෝක සමාජ සබඳතා පුළුල් හා ප්‍රයෝජනවත් කරන අකාරයට අර්ථ හා වටිනාකම් ලොව පුරා ප්‍රචාරණය සංස්කෘතික ගෝලීයකරණය යි.<br>සමාජීය සබඳතා බිහිවීම හා ව්‍යාප්තිය භෞතික වශයෙන් පමනක් දැකගත නොහැකි ද්‍රව්‍ය මෙන්ම ,ජනතාව පොදුවේ හා පෞද්ගලිකව සම්බන්ධ වී සිටින චර්යාව හා දැනුම හුවමාරු කරගත හැකි මාධ්‍යයක් ලෙස ගෝලීය සංස්කෘතිය යොදා ගනියි.<br>ටෙලිවිෂනය ගෝලීය සංස්කෘතිය විසරණය සඳහා උපයෝගී වන ප්‍රමුඛ මාධ්‍යයයි.එය තනි තනිව පුද්ගලයන් වෙත ලබාගත හැකිවීම එයින් සිදුවන බලපෑම් වඩාත් තීව්‍ර කරයි.<br>ගෝලීය සංස්කෘතිය ජාතික සංස්කෘතිය හෝ දේශීය සංස්කෘතිය ලෙස හඳුන්වා ගන්නා ප්‍රපංචයන්ට විකල්පය ලෙසත් අර්ථ දැක්වේ. | • රටක ආර්ථිකය ,දේශපාලනය සංස්කෘතිය ,මාධ්‍ය ආදී සියලු මානව ක්‍රියාකාරකම් ගෝලීයකරණයට ලක්ව ඇති නිසා,එය ආර්ථික ක්‍රියාවලියක් ලෙසද ආර්ථික අපේක්ෂා මත වැඩෙන්නට ඉඩහැර ඇති බවද විවාදාත්මකයි .<br>• ගෝලීය සංස්කෘතිය තියුණු ලෙස විවාදයට ලක් වන්නේ ආර්ථිකය විසින් ගෝලීය සංස්කෘතියට තියුණු බලපෑම් එල්ල කිරීම නිසාවෙනි.<br>• ගෝලීය සංස්කෘතිය සන්නිවේදනයේ හා විඥාපනයේ දැවන්ත වර්ධනයයි.<br>• සංස්කෘතික සංසරණය වීම,ඒවා සම්මිශ්‍රණය.පුද්ගලයන් ලෝකය පුරා සංක්‍රමණය ලෝක ඉතිහාසය පුරාවටම සිදුව ඇතත්,එය මෙතරම් අනන්‍ය ගති ලක්ෂණ වලින් යුතුව ව්‍යාප්ත වන්නේ මෙම යුගයේය.<br>• වත්මන් සමාජයන් තුළ මූලික ගති ස්වභාවයන් 2කි.<br>1. අන්තර් සම්බන්ධියත්වය<br>2. ජංගමත්වය<br>මෙනිසා ගෝලීය සංස්කෘතිය දිනෙන් දින වර්ධනය වේ.මෙනිසා බහුත්ව ( විවිධත්වයෙන්) අනන්‍යතාවන් ඇති පුද්ගලයන් බිහිවීමේ ප්‍රවණතාව බහුලව පවතී. | • ලොව පුරා ජාලගතව ක්‍රියාත්මක වන බහු ජාතික සමාගම් ජාතික රාජ්‍යයන්ට කෙරෙන බලපෑම් නිසා ගෝලීය සංස්කෘතියටද බලපෑම් සිදුවීම අවාසියකි.<br>• ගෝලීය දැනුම අප්‍රමාදව ලබාගත හැකිවීම ගෝලීය සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා වාසි සහගතය.<br>• ගෝලීය සංස්කෘතිය ගෝලීය උපරි සමාජයට (ශක්තිමත් ආර්ථිකයක් ඇති සුපිරි සමාජ ) වලට වඩා සේවය කරයි.අන් රටවල් වහලුන් සේ සලකයි.එය අවාසියකි.<br>• ලොව විවිධ සංස්කෘති පැවතීම සුන්දර මෙන්ම විවිධත්වය වර්ධනය කලළද,ගෝලීය සංස්කෘතිය තුළ සියලු ජාතික සංස්කෘති ඒකාකාරී වීම අවාසියකි.<br>• ලොව එක් එක් සංස්කෘති සතු අනන්‍යතාවන් අභියෝගයට ලක්වීම අවාසියකි.<br>• අනන්‍ය සංස්කෘති ගවේෂණය ,හා ඒවා නැවත විමසා බැලීමට හැකිවීම වාසියකි.<br>• දුර හා දිශාව පිළිබඳ මෙතෙක් පැවති අර්ථ කථන බිඳ වැටෙමින් එය නිමේෂයක් බවට පත්වීම වාසියකි.<br>• ලෝකය තුළ තව දුරටත් සංස්කෘතික අනන්‍යතාව නොපැවතීම අවාසියකි.<br>• මෙට බටහිර පරිභෝජන සංස්කෘතිය සමග බරපතල ලෙස සාර්ථක සංසිද්ධියක් වීම අවාසියකි . | 1. ගෝලීය සංස්කෘතියේ අර්ථ දැක්වීම් නිවැරදිව ග්‍රහණය කර ගනිමින්,එහි සමස්ත චිත්‍රය අර්ථ නිරූපනය කිරීමේ හැකියාව ලබා ගත යුතුයි .<br>2. ජාතික හෝ දේශීය සංස්කෘතියක ඇති අනන්‍ය ගති ලක්ෂණ සිසුන්ට හඳුන්වා දෙමින් ගෝලීය සංස්කෘතිය තුළ ඊට ලබා දී ඇති වටිනාකම් තහවුරු කිරීම.<br>3. සංස්කෘතින් අතර සංවාදශීලී මෙවලමක් ලෙස ගෝලීය සංස්කෘතියෙන් ලබාගත හැකි වාසි සහගත අත්දැකීම් සිසුන්ට ලබාදීම .<br>4. ජාතිකකත්වය,වාර්ගිකත්වය වැනි මිනිස් සන්තානයේ පවතින සංවේදී කාරනා වල නිරර්ථක බව ගෝලීය සංස්කෘතිය තුළ දිය වෙමින් පවතින බව සිසුන් ට අවබෝධ කරදීම .<br>5. ගෝලීය සංස්කෘතියක් තුළ ජාතික හෝ දේශීය වශයෙන් ඇති සාරධර්ම අභියෝගයට ලක්විය හැකි අවස්ථා සිසුන් සමග සාකච්ඡා කිරීම හා ඊට මුහුණ දිය හැකි ආකාරයන් ගැන දැනුවත් කිරීම .<br>6. ගෝලීය සංස්කෘතිය නිසා හට ගන්නා සමාජ ආතතීන් ගැන ප්‍රජාව දැනුවත් කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී උපදේශනය සැපයීම හා ඒ සම්බන්ධ වෙනත් පාර්ශව සමග සමීප සන්නිවේදනයක් පවත්වා ගැනීම. |

# 17. සමාජ සමූහ සංකල්ප

| සමාජ සමූහ සංකල්පය හැදින්වීම - නිර් වචන හා අංග ලක්ෂණ | සමාජ සමූහ වර්ග (විධිමත් සහ අවිධිමත් ලෙස) | සමාජ සමූහ වල අවශ්‍යතාවය (සමාජ හා මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් ) | විධිමත් සමූහ සහ අධ්‍යාපන ක්‍රියාවලිය |
|---|---|---|---|
| සංකල්පය හැදින්වීම :<br>• අධ්‍යාපන ක්‍රියාවලියේ සිදුවන සාමූහික ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම අධ්‍යාපන සමාජ විද්‍යාවේ ප්‍රමුඛ කාර්යයකි.<br>• පන්ති කාමරය විධිමත් සමාජ සමූහයක් ලෙස ඒකරාශී වුවද,සමාජ අන්තර් ක්‍රියාවලිය වැඩි වශයෙන් පවතින්නේ එහි අවිධිමත් සමාජ සමූහ තුළ ය.<br>• පන්ති කාමරය පමනක් නොව විශ්ව විද්‍යාල වල පවා,රාජ්‍ය ආයතන වැනි වැඩිහිටි සමාජ තුළ ද අවිධිමත් සමාජ සමූහ වඩා ප්‍රබලය.<br>• ගුරුවරයා තම පන්තියේ විධිමත් හා අවිධිමත් සමාජ සමූහ නිසි ලෙස හදුනා ගැනීම ඉගෙනුම් ක්‍රියාවලියට ප්‍රබල පහසුවකි.<br>නිර්වචන :<br>මැකයිවර්: **(1950)** එකිනෙකා අතර සම්බන්ධතා ඇති කර ගන්නා මිනිස් එකතුවක් .<br>ස්ලැන්ඩර් **(1965)** කාලයක් තිස්සේ අන්තර් ක්‍රියා කරමින්,පොදු අභිප්‍රාය හවුල්ව බුක්ති විදින,හැසිරීම් සම්මතයන් පනවා ගත් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් සමූහයකි.<br>මර්ටන් **(1957)** යම් රටාවකට,එකිනෙකාට අන්තර් ක්‍රියා කරන,සමූහ යන හැගීම් ඇති,වෙනත් අය විසින් කණ්ඩායමක් ලෙස හදුන්වන පිරිසක් සමාජ සමූහයකි .<br>අංග ලක්ෂණ :<br>• සමාජයක අන්තර් ක්‍රියා පැවතීම සදහා පදනම වන්නේ සමාජය සමූහයි.සමාජය අවබෝධ කර ගැනීම සඳහා ද සමාජ සමූහ වැදගත් වේ.<br>• සමාජයක පැවැත්ම සඳහා මූලික පදනම සැකසී ඇත්තේ සමාජ අන්තර් ක්‍රියා තුළිනි.<br>• සමාජ සමූහ නිසා සමාජීය ජීවිතයේ ව්‍යාකූලභාවය දුරුවීමද තවත් වැදගත් ලක්ෂණයකි.<br>• සමූහයන්ට අරමුණු ඇතිවීමද,එමගින් පොදු සම්මත හෙවත් ප්‍රතිමාන ගොඩනැගීමද සිදුවේ.පසුව එය සංස්කෘතියක් දක්වා වර්ධනය වේ.<br>• සාමූහික හැඟීමක් පැවතීම තවත් අංග ලක්ෂණයකි.<br>• සංසත්තික භාවය (සමූහයක් තුළ රදවා ගැනීමෙ ශක්තිය ) තවත් අංග ලක්ෂණයකි.<br>• හොද හෝ නරක නායකයන් ගොඩනැගීමෙ ශක්තිය ද සමූහ වලට ඇත.<br>• සමූහ ව්‍යුහයක් ප්‍රදර්ශනය වීමද ලක්ෂණයකි. | • පළමුව පොදුවේ සමාජ සමූහ හදුනා ගන්න : කුඩා සමූහ ,විශාල සමූහ ,විස්තෘත සමූහ,මිත්‍ර (සමපදස්ථ ) සමූහ,අභ්‍යන්තර සමූහ,බාහිර සමූහ,සිරස්,තිරස් සමූහ ,සමුද්දේශ (තමා ගැන හෝ තමාගේ චර්යා ගැන තක්සේරු කරන සමූහ)<br>• විවිධ ස්ථර වල සාමාජිකයන් නියෝජනය කරන්නේ නම් සිරස් ලෙසත්,සමාන ස්ථර නම් තිරස් සමූහ ලෙසත් හදුනා ගන්න.<br>• **C.H.cooley (1992)** ගේ වර්ගීකරණය ට අනුව<br>**1.**ප්‍රාථමික සමූහ<br>**2.** ද්විතීයික සමූහ ලෙස වර්ග කරයි.<br>• **P.A.sorokin** මිත්‍ර සබදතා ප්‍රාථමික ලෙසත්,ගිවිසුමක් මත ගොඩ නැගෙන සබදතා ද්විතීක ලෙසත් වර්ග කරයි.<br>• සමූහ තුළ පවතින සබඳතා වල ස්වරූපය අනුව අවිධිමත් සහ විධිමත් ලෙසත් කාණ්ඩ කළ හැක.<br>• පාසල තුළ විධිමත් සමාජ සමූහ ලෙස ශිෂ්‍ය සමිති,සෞඛ්‍යය සමිති,පාසල් සංවර්ධන ,ආදී ශිෂ්‍ය.ශිෂ්‍ය හට,සුබ සාධක,පන්ති ,විෂය,ක්‍රීඩා, වැනි සමිති ලෙස දැක්විය හැක.<br>• පාසල තුළ අවිධිමත් සමාජ සමූහ ලෙස සම වයස් කණ්ඩායම් ,සුහද ගුරු කණ්ඩායම් ,සේවක මිත්‍ර කණ්ඩායම් ,ලැදියා කණ්ඩායම් ,වැනි සමූහ රාශියකි.<br>• විධිමත් සමූහයක සංවිධානයක් තිබීම ,පරිපාලන ව්‍යුහයක් තිබීම ,නිලබල ව්‍යුහයක් තිබීම වැනි ලක්ෂණ දැකිය හැකිය.<br>• අවිධිමත් සමූහ තුළ නිති රීති මාලාවක් නොවීම ,විධිමත් බදවා ගැනීම් නොවීම,සමාජිකත්වය ස්ථාවර නොවීම ,නිදහස් සමාජ වාතාවරණය ,නායකත්වය ක්‍රියා කාරකම් ඔස්සේ මතුවීම වැනි ලක්ෂණ ප්‍රදර්ශනය වේ. | සමාජ විද්‍යාත්මක :<br>• සමස්ත සමාජයක පැවත්මට සමාජ සමූහ වැදගත් වේ.<br>• සමාජයක ව්‍යුහය සමාජ සමූහ මත ගොඩ නැගී ඇත.සමූහ ඉවත් කළ විට සමාජය තුළ ඉතිරිවන ශෙෂයක් නැත.<br>• පුද්ගල අනන්‍යතාව හදුනා ගැනීමට.එය අන්‍යයනට ඔප්පු කළ හැකි මාධ්‍ය මෙයයි.<br>• සමාජ සමූහ අසීමිත ශක්තියක් පෙන්වයි. උදා : වෘත්තිය සමිති,අරගල කණ්ඩායම්<br>මනෝවිද්‍යාත්මකව :<br>• පුද්ගලයෙක් තනිව කරන ප්‍රතිචාර වලට වඩා සමූහ ප්‍රතිචාර ප්‍රබලය.<br>• සමූහයක අන්තර් ක්‍රියා පහසු කිරීමට සමූහ චර්යා වැදගත් වේ.<br>• සමාජ සමූහ පුද්ගලයාට මානසික ආරක්ෂාව සලසයි.පුද්ගලයා හුදෙකලාවීම වලකයි.සක්‍රීය බව ලබා දෙයි.<br>• වියපත් සමාජ කණ්ඩායම් වලට සමාජ සමූහ ඉතා අත්‍යවශ්‍ය බව පිළිගෙන තිබේ.<br>• බටහිර රටවල හුදෙකලා මහලු විය හා වැඩි වැඩිහිටි නිවාස සහ පෙරදිග රටවල නිවසේ පවුල තුළ ප්‍රීතිමත් මහලු විය.<br>• අසීමිත ලෙස අභියෝගයන්ට මුහුණ දීමේ ශක්තිය .උදා : පවුලක් ලෙස /පාසලක් ලෙස/<br>• සමාජ සමූහ පුද්ගල ආත්ම තෘප්තිමත්භාවය සලසයි.එය සමාජය තුළ සාරධර්ම හා ප්‍රතිමාන ගොඩ නගයි.<br>• සමාජ සමූහ නිසා සමාජ සම්මත නිතී රිතී වලට හුරුව ලබාගනී. | පාසලේ හා පන්ති කාමරයේ විධිමත් සමූහ ස්වරූපය හදුනා ගැනීම .<br>විශාල සාමාජික පිරිසක් යම්කිසි සුවිශේෂී අරමුණු එකක් හෝ කිහිපයක් අරඹයා සැලසුම් කරන ලද ක්‍රියා පද්ධතියක් සහිත සංවිධානය විධිමත් සමූහයයි.<br>විධිමත් සමූහ ඔස්සේ ද්විතීයික සමූහයක ලක්ෂණ :<br>**1.**නිශ්චිත අරමුණු හෝ සැලසුම් කරණයක් තිබීම .<br>**2.** පෞද්ගලික අරමුණු අභිබවා පොදු අරමුණු වැදගත් වීම.<br>**3.** බලාධිකාරිය පිළිබඳ ධුරාවලියක් ඇත.<br>**4.** එය පිරමීඩයක හැඩය ගනී.ඉහළ පිරිස සීමිත වුවද බලය වැඩිය.(උදා: පන්තියේ එක ගුරුවරයෙක් සහ ළමයි විශාල සංඛ්‍යාවක් සිටීම.)<br>**5.** ශ්‍රම විභජනය මත කාර්ය සංවිධානය සිදුවේ.<br>**6.** විවිධ සුදුසුකම් සහ හැකියා මත වැඩ බෙදා බෙදා ගනී.<br>**7** .නීති-රීති පවතී.නිශ්චිත අයිතිවාසිකම් හා යුතුකම් ඇත.<br>**8.** විධිමත් සන්නිවේදනයක් පවතී.<br>**9.** වාර්තා තැබීම් සිදු කෙරේ.<br>වැදගත් : පාසැලකට එලෙසම නිලබල ක්‍රමය පවත්වා ගෙන යා නොහැක.පාසලේ පරිමාව අනුව අනුව එය වෙනස් වේ.(ප්‍රධාන පාසලක් සහ කුඩා පාසලක් සසඳන්න.) කුඩා පාසලක විධිමත් සන්නිවේදනයට වඩා අවිධිමත් සන්නිවේදනය පවතී.(කුඩා පාසලක පාසලක විදුහල්පති කටවචනයෙන් වැඩ පැවරීම.) පුද්ගලාන්තර සබඳතා නිලමය සබඳතා ඉක්මවා යයි. මෙනිසා විධිමත් සමූහ පාසලක ඇතත් එහි වඩා ලිහිල් බවක් ඇති බව අමතක නොකරන්න.<br>• විධිමත් සබඳතා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බලපාන අකාරය: විශාල සමූහයක ගැටළු අවම කරමින් ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට උදව් කරයි.පන්ති කාමරයේ අන්තර් ක්‍රියා සුසාධ්‍යකරණයට විධිමත් සමූහ බෙහෙවින් දායක වේ.පාසලක දරුවන්ගේ අධ්‍යාපනයට ප්‍රතිජනනාත්මක මෙන්ම ප්‍රතිශේෂධාත්මක ලෙසද බලපෑම් කළ හැකි අතර,එමගින් ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියට ඇති කරන බලපෑම ඉමහත්ය . |

# 18. සමාජ ස්තරායනය සමාජ පන්තිය සහ අධ්‍යාපනය

| හැදින්වීම සහා නිර් වචන | ස්තරායනය පිළිබඳ න්‍යාය | ස්තරායනය පිළිබඳ න්‍යාය : ගැටීම් න්‍යාය(භෞතික වාදී න්‍යාය :මාක්ස් වාදය) |
|---|---|---|
| ස්තරායනය පිළිබඳ නිර්වචන :ටැල්කොට් පාසන් :යම් සමාජයක සිටින සාමාජිකයන් වර්ග කර අගය කිරීමේ මිනුමක් හා සාපේක්ෂ ලෙස සමාජය පිළිගත් වැදගත් අංග වලින් උස් හා පහත් කොට සැලකීම යි.<br>මැක්ස් වෙබර්: විෂය මූලික ලෙස ආදායම් මට්ටම,නිවාස සහ දේපළ මනෝ මූලික ලෙස සමාජයේ ඉහළ ඉහල පහල මනින මට්ටම පදනමට ලෙසත් සලකා ස්තරායනය අර්ථ ගන්වා ඇත<br>විල්පිඩෝ පරේටෝ :සමාජ ස්තාරනය මිනිසාගේ සහජ දක්ෂතා වල ප්‍රමාණය අනුව උද්ගත වන බව .<br>කාල්මාක්ස් : ආර්ථික සාධකය මත ධනපති පන්තිය පංතිය හා නිර්ධන පන්තිය ලෙස සමාජය වර්ග කරයි.<br>වෙබර් : ආර්ථික සාධනයට අමතරව සමාජ ගරුත්වය හා බලය ඊට එකතු කරයි.<br>හැදින්වීම : ස්තරායනය යන්නෙන් අදහස් කරන්නේ යම් සමාජයක සාමාජිකයන් විවිධ තලවල ස්තර ගතව සිටීමයි.සෑම සමාජයක්ම සිරස් අතට ස්තර ලෙස වෙන් වෙන්වීම ප්‍රදර්ශනය කෙරේ.වරප්‍රසාද,ප්‍රතිලාභ සහ අවඅවස්ථා ලෙස ඉහළ සිට පහළට වෙබිදුණු ස්තර සමාජය දක්නට ලැබේ.<br>ස්තරායනයේ ලක්ෂණ : සමාජ සමූහ එකිනෙකාට උස් හෝ පහත් කොට සැලකීම හා ඒ අනුව ක්‍රියා කිරීම මෙහි ඇති මූලිකම ලක්ෂණය යි.<br>• යම් ස්තරයක පොදු ජීවන රටාවක්,පොදු අනන්‍යතාවයක් හා උප සංස්කෘතියක් පැවතීම දැකිය හැක.<br>• සමාජ ප්‍රභේදනය,තරාතිරම තීරණය කිරීම,අගය කිරීම හා පාරිතෝෂණ පොදු ලක්ෂණයකි.<br>• ජාතිය,කුලය,වර්ණය,ආගම,වයස,අධ්‍යාපනය හා ජීවත් වන පළාත පොදු ලක්ෂණ යි.<br>• ආදායම් ව්‍යාප්තිය,අධ්‍යාපන ප්‍රාප්තිය,ජීවන තත්ත්වය අනුව අනුව සමාජ අසමානත්වය මත ස්තරායනය පදනම් වේ. | කෘත්‍යවාදය (Functionalism)<br>1945 දී කිංස්ලි ඩෙවිස් හා විල්බට් මුවර් මෙම න්‍යාය ඉදිරිපත් කරන ලදී.සමාජය විවිධාකාර කෘත්‍යමය අවශ්‍යතා නිසා ගොඩ නැගෙන්නක් ලෙස සමාජ ස්තරායනය හදුනාගෙන ඇත.ටැල්කොට් පාසන්ස් එකිනෙකට සම්බන්ධ ස්තර වලින් සමාජය සෑදී ඇති බවත්,එනිසාම සමාජය ස්ථාවරව පවතින බව කියයි.<br>එමිල් ඩුර්කයිම් : ආගම නිසා සමාජ ඒකාබද්ධතාව පැවතීම නිසා සමාජය දැඩි වූ බව පවසයි.ස්තරායනය යනු පොදු වටිනාකම් පද්ධතියක් අනුව සමාජ පද්ධතියේ ඒකක ස්තර ගත කිරීමකි.<br>මෙම න්‍යායයට අනුව ,සමාජයේ පැවතීමට හේතුවන විග්‍රහ කෙරේ.ප්‍රධාන හේතුව ලෙස භූමිකා වෙන් කිරීම හා කාර්ය සාධනය හදුනාගෙන ඇත.සමාජයේ වඩාත් සුදුසුකම් ඇති පුද්ගලයන් මගින් වැදගත් තනතුරු පිරවීම තහවුරු කරන ක්‍රමයක් ලෙස ස්තරායනය හැදින්වුවද,පසුව එය දැඩි විවේචනය ට ලක්කර ඇත.බුද්ධිමත් හා හැකියා ඇති අය පහළ ස්තර වලම සිටින අතර,ඉහළ ස්තරවල සිටින අය එම ඉහළ ස්තර උපත ලැබීමම ඉහළ තනතුරු වලට පත්වීමට හේතු වී ඇති බව ට විවේචන ඇත.(වර්තමාන ලංකාවේ දේශපාලනය ඇසුරෙන් විමසන්න.)<br>සමාජ වෙනස්වීම් තුළින් සමාජ ස්ථාවරත්වය වෙනස් කොට නව සමතුලිතාවයක් ඇති වන අවස්ථා ද ඇත.(උදා : පාස්කු ප්‍රහාරය ,2019 ජනාධිපතිවරණය,කොරෝනා වසංගතය ආදියේ දිගුවක් ලෙස අරගලය,)<br>සමාජය වෙනස් කරන ප්‍රධාන උත්තේජක ජන වර්ධනය හා ශ්‍රම විභජනයයි.ජන වර්ධනය මත අන්තර් ක්‍රියා සංකීර්ණවීම, රැකියා විශේෂිතකරණය,නාගරීකරණය,මුදල් පාලනය හා වානිජ්‍යය පැතිරීම,පාසල් රෝහල් බිහිවීම,කර්මාන්ත ,සන්නිවේදනය ආදියේ ව්‍යාප්තිය සිදුවේ.<br>බොහෝ රටවල් සාම්ප්‍රදායිකත්වයේ සිට නවීනත්වයට යාමෙන් කෘත්‍යයන් ඉටුකර ගනී.එනයින් නාගරීකරණය,නවීකරණය ,කාර්මීකරණය හා ගෝලීයකරණය ට මුල් තැනක් ලැබී ඇත. | සමාජ ගැටුම් නිසා සමාජය වෙනස්වේ.මාක්ස් ට අනුව අසමාන ආර්ථිකය හා සමාජ පරස්පරතාව නිසා සමාජ වෙනස්වේ .දේපල පිළිබඳ පොදු අයිතිය තිබූ ප්‍රාථමික සමාජය මෙන්ම වහල් යුගයේ හා වැඩ වසම් යුගයේත් සමාජය වෙනස් වූවේ සමාජ ගැටුම් තුළිනි.<br>මුදල් භාවිතය,වානිජ නිෂ්පාදන ඇතිවීම තුළින් සමාජය ධනවාදී සමාජයකට විපරිනාමය වූ අතර,ශ්‍රම සූරාකෑම් වලට එරෙහිව පන්ති සටන් ඇවිලෙන්නට විය.සමාජ ඒකක අතර ගැටීම්,ජාතිවාදී ගැටුම් ,වර්ගවාදී ගැටුම් ,දේශපාලන ගැටුම් සිවිල් සමාජ වෙනස්වීම් වලට පදනම සපයන බව මෙම න්‍යායයේ පිළි ගැනීමයි.<br>සමාජ ස්තරායනය ආර්ථික වශයෙන් පදනම් වූ පන්ති ක්‍රමයක් මත ගොඩ නැගෙන බව මාක්ස් ගේ පිළි ගැනීමයි. |

# 18. සමාජ ස්තරායනය සමාජ  පන්තිය සහ අධ්‍යාපනය

| සමාජ පන්තිය හැදින්වීම | සමාජ ස්තරායනය හා සමාජ පන්තිය අධ්‍යාපනයට බලපාන ආකාරය. | සමාජ සචලනය සදහා අධ්‍යාපනයෙන් ගතහැකි/ගන්නා ලද ක්‍රියා මාර්ග |
|---|---|---|
| සමාජ පන්තිය යනු සමාන තත්ත්වයක් ඇති පුද්ගල එකතුවක් හෝ කාණ්ඩ වීමකි.<br>මාක්ස්වාදී විග්‍රහය : නිෂ්පාදන මාර්ග වලට එක හා සමාන සම්බන්ධතාවක් දක්වන පිරිසක් සහිත සමාජ කණ්ඩායම - සමාජ පන්තියයි.<br>වෙබර් : ආර්ථික තත්ත්වය ,සමාජ තත්ත්වය හා බලය තුළින්  සමාජ  පන්තිය හඳුනා ගත හැක.<br>• සමාජ  පන්තිය හඳුනා ගැනීමේ නිර්ණායක :<br>1. ආදායම<br>2. රැකියාවේ ගරුත්වය<br>3. බලය<br><br>සමාජ විශ්ලේෂණය   ගොඩ නැගෙන්නේ පොදු අපේෂණ කණ්ඩායම් නිර්මාණය කරගන්නා සමාජ ශක්තිය මතය. එය උසස් අධ්‍යාපනය , එනිසා ගොඩ නැගෙන සාරධර්ම  හා චර්යා මත  නිර්මාණය වන ශක්තින් මත තීන්දු වේ.<br>ස්ටැල්කෆ් (1968) පෙන්වා දෙන්නේ පවුල් පරිසරය,ආදායම් මට්ටම ,රැකියාව,ජන වර්ගය හා සමාජ ආකල්ප සමාජ  පන්තිය හැදින්වීමට නිර්ණායක ලෙස යොදා ගැනීම වඩා සුදුසු බවයි.<br>සමාජයක කුල ක්‍රමයට වඩා සමාජ පන්ති ක්‍රමය විවෘතයි.පහත් සමාජ පන්තිය ක උපත ලැබුවද,අධ්‍යාපන  සාධනය තුළ  ඉහළ සමාජ  පන්තියකට යාමට ඉඩකඩ විවෘතව පවතී.<br>සමාජ පන්ති වර්ගීකරණය :<br>ධනවාදී සමාජය :<br>1. ඉහළ පන්තිය (කර්මාන්ත  හිමි)<br>2. මධ්‍යම පන්තිය (කාය ශ්‍රමික නොවන රැකියා.<br>3. කම්කරු පන්තිය  (ශ්‍රමිකයන්)<br>ඇමෙරිකාවේ සමාජ  පන්ති ව්‍යුහය<br>• විෂයානුබද්ධ නිර්ණායක : අධ්‍යාපන මට්ටම ,ආදායම් මාර්ග,රැකියාව ,පදිංචි ප්‍රදේශය ,ජන වර්ගය .<br>• පුද්ගල බද්ධ නිර්ණායක : පුද්ගලයා විසින්ම තම සමාජ පන්තිය නිර්ණය කර ගැනීම.<br>ගරුත්වය  මත අන්‍යයන් විසින් තීරණය කිරීම .<br><br>බ්‍රිතාන්‍යයේ වර්ගීකරණය<br>• පළමු මට්ටම : ඉහළ රැකියා<br>• දෙවන මට්ටම : වෘත්තිකයන් | අ mධ්‍යාපනය හා සමාජ වෙනස්වීම් අතර සම්බන්ධතාව ද්විධාකරය.<br>1. සමාජ වෙනස්වීම් වලට අනුව අධ්‍යාපනය සකස් වේ.<br>2. අධ්‍යාපනයෙන් මගින් සමාජ වෙනස්කම් සිදු කරයි.<br>අධ්‍යාපනය කෙරෙහි සමාජ පංතියේ බලපෑම.<br>• මස්ග්‍රේව් (1983) : මධ්‍යම පාන්තික දෙමව්පියන් තම දරුවන්ගේ හැඟීම් වලට මුල්තැන ලබා දෙන අතර,පහල සමාජ පන්ති වල දෙමව්පියන් දරුවන් වෙත දැඩි විනය නීති ක්‍රියාත්මක කරති.මේ නිසා මධ්‍යම පන්තික දරුවන්ට සමාජ භූමිකා තෝරා ගැනීමට හැකිවන අතර,පහළ  සමාජ පාන්තික දරුවන්ට සමාජ භූමිකා උරුම කර දීමක් සිදුවේ.<br>• පහල සමාජ පන්ති දරුවනට අනුකරණයට උචිත ආකෘති  විරලය.නිසි පෝෂණය නොලැබී මේ හේතුවෙන් පහල සමාජ පාන්තික දරුවන්අධ්‍යාපනික සහ විෂය බාහිර ක්‍රියාකාරකම් වල දක්වන උනන්දුව සහ අධිෂ්ඨානය හීන කරවයි.<br>• භාෂා හැකියාව සහ සමාජ පන්ති අතර ද අතර ද සබඳතා පවතින බව පර්යේෂණවලින් හෙළි වී ඇත.බර්න්ස්ටයින් ට අනුව,පහල සමාජ පාන්තික දරුවන්ට භාෂා හැකියාව සීමිත ය.පුළුල් වාග් මාලාවක් නැත.<br>• ප්ලවුඩන් වාර්තාව u.s.a 1967 නුගත්කම,පවුලේ ආර්ථික ගැටලු,අවම ගෘහ පහසුකම්,සමාජ  පරිසරය පහළ සමාජ පංතියේ  අධ්‍යාපනයට ඇති පෙළඹවීම හීන කරවයි.එනිසා ඔවුන්ගේ සාධන මට්ටමේ අඩුවක් පවතී.<br>• ශ්‍රී ලංකාවේ උසස්  අධ්‍යාපනයේ දී වෛද්‍ය,ඉංජිනේරු සහ කළමණාකරන පීඨවලට ඇතුලත්වීම් වල දී සමාජ පංතියේ බලපෑම දක්නට ලැබේ.දුෂ්කර සහ පහළ සමාජ පන්ති වල දරුවන්  කලා විෂය ධාරාවට ඇතුළත් වීමේ වැඩි ප්‍රවණතාවක්  ඇත. | 1.අධ්‍යාපනය අනිවාර්ය කිරීම (අනිවාර්ය අධ්‍යාපන නීතිය )<br>2. නිදහස් අධ්‍යාපනය සහ ස්වභාෂා අධ්‍යාපනය.<br>3. අධ්‍යාපන ප්‍රවේශය සඳහා සමාන ඉඩ ප්‍රස්ථා ලබාදීම.<br>4.  අධ්‍යාපන  සහභාගිත්වය  ඉහළ නැංවීම.<br>5. අධ්‍යාපන සම  අවස්ථා සම්පාදනය.<br>6. අධ්‍යාපන පල සාධාරණ ලෙස බෙදී යෑම සහතික කිරීම .<br>7. කාලීන විෂයමාලා නවීකරණය කිරීම.<br>8. අධ්‍යාපන  සුභසාධනය පුළුල් කිරීම.<br>9. ගුරුවරැනට දුෂ්කර සේවාව අනිවාර්ය කිරීම .<br>10. පළාත් මට්ටමෙන් විශ්වවිද්‍යාලය පුළුල් කිරීම (ඌව /නැගෙනහිර )<br>11. විද්‍යා පීඨ ආරම්භය.<br>12. කොළඹ විශ්ව විද්‍යාලයේ සේවක අධ්‍යාපන  ආයතනය (විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ අයට,රැකියාවකට ගොස් විශ්වවිද්‍යාලයට යාමේ අවස්ථාව ලබා දීම.)<br>13. නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම. |

- තෙවන මට්ටම : ශ්‍රමිකයන්
- සිව්වන මට්ටම : නුපුහුණු /අර්ධ

1981 අධ්‍යයනයකට අනුව ශ්‍රී ලංකාවේ වර්ගීකරණයක්.

- ඉහළ පන්තිය
- ඉහළ මධ්‍යම පන්තිය
- පහළ මධ්‍යම පන්තිය
- ඉහළ කම්කරු පන්තිය
- ඉහළ මධ්‍යම  කම්කරු පන්තිය
- පහළ පන්තිය
  ලංකාව වැනි රටවල කෘෂි ආර්ථිකයට දායක වන කණ්ඩායම් අයිති වන පන්තිය ගැන නිවැරදි පැහැදිලි කිරීමක් නැතිවීම අඩු පාඩුවකි. එසේ වුවද ලංකාවේ කම්කරු පන්තිය  පිළිබඳ වර්ගීකරණයක් දැක්වේ.
- පහළ මධ්‍යම කම්කරු පන්තිය
- පහළ කම්කරු පන්තිය
  විවිධ  සමාජ වල සමාජ පන්ති වර්ගීකරණයන්හි සුලු සුලු වෙනස් කම් ඇතත් ඊට යොදා ගන්නා සාධක වල බෙහෙවින් සමානතා පවතියි.

# 19. සමාජ ප්‍රාග්ධනය (Social Capital )

<table>
<tr><th>සමාජ ප්‍රාග්ධනය හැඳින්වීම</th><th>සමාජ ප්‍රාග්ධන සංකල්පය</th></tr>
<tr><td>
• රොබට් පුට්නම් නම් අමෙරිකානු සමාජ විද්‍යාඥයා විසින් සමාජ ප්‍රාග්ධනය පිළිබඳ සංකල්පය හඳුන්වා දී ඇත.<br>
• අන්නෝන්‍ය සබඳතා ,සමාජ ජාල, ප්‍රතිමාන හා වටිනාකම් එකතු වී නිර්මිත සංකල්පයකි.<br>
• සමාජ ප්‍රාග්ධනය ඵලදායි සමාජ ආයෝජනයකි.<br>
• පුද්ගලයන්ට තනිව ඉටුකරගත නොහැකි නොහැකි අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමට,සාමාජීය ලෙස ගොඩ නඟා ගන්නා විශ්වාසය,විනය,අන්තර් සබඳතා මත සමාජ ප්‍රාග්ධනය ගොඩ නැගේ.<br>
• කෝල්මන් (1988) ළමයාගේ වර්තමාන හා අනාගත යහ පැවැත්මට හේතු වන පවුල් සංස්ථාවට අයත් සම්පතකි.<br>
• පුද්ගලයා හා සමාජය අතර අන්තර් ක්‍රියා කිරීමෙන් සමාජ ප්‍රාග්ධනය නිර්මාණය වී යථාර්ථයක් බවට පත් වේ.<br>
• පියරේ බෝඩියෝ (1984) තරුණ ජනයා අතර අංශ තුනකින් සමාජ ප්‍රාග්ධනය සමන්විත බව පවසයි.<br>
1. සමාජ ජාල,අන්තර් ක්‍රියා හා සමාජ කරණය.<br>
2. විශ්වාසය හා එය ආපසු ලබා ගැනීම.<br>
3. අයත් බව පිළිබඳ සංවේදනය හෙවත් ස්ථානීය බැඳීම.<br>
• කෝල්මන් (1988) මූල්‍ය ප්‍රාග්ධනය (පවුලේ වියදම්) මානව ප්‍රාග්ධනය (දෙමව්පිය ආර්ථික කුසලතා ) හා සමාජ ප්‍රාග්ධනය පදනම් කරගනිමින් පවුල් පද්ධතිය පද්ධතිය ගොඩ නැගී ඇති බව පවසයි.<br>
• රොබට් පුට්නම් නැවත දක්වන්නේ ,සමාජ ප්‍රාග්ධනය යනු සමාජ සංවිධානයේ අංශයක් වන විශ්වාස,පුද්ගල ප්‍රතිමාන හා අන්තර් සම්බන්ධතා යන අංශ වල එකතුව බව.<br>
• ලීන් (2001) සමාජ ප්‍රාග්ධනය පුද්ගල නැඹුරුවකි.එය ආයෝජනය කළ ආර්ථික වටිනාකමක් බවට පත් කළ හැක.<br>
මේ අදහස් හා නිර්වචනයන් අනුව ලබා ගත හැකි පොදු අදහස වන්නේ සමාජ ප්‍රාග්ධනය යනු සමාජය තුළ ජනිත වන ශක්තියක් මෙන්ම සම්පතක්ද බවය.
</td><td>
• රසාක් : කරුණු තුනක් දක්වයි.<br>
1. සමාජ යහ පැවැත්ම රැඳී ඇත්තේ අන්‍යෝන්‍ය විශ්වාසය හා අන්තර් සබඳතා වල ස්ථාවරත්වය මතය.<br>
2. සමාජ ප්‍රාග්ධනය වර්ධනයට හා සමාජ ප්‍රාග්ධනය සම්පත රැක ගැනීමට එම සමාජයේ භෞතික හා ආර්ථික සංවර්ධනය අත්‍යාවශ්‍යයි.<br>
3. සමාජ ප්‍රාග්ධනය ඕනෑම ප්‍රජාවක තිරසාර සංස්කෘතියට දායක වේ.<br>
ලීන් : සමාජ ප්‍රාග්ධනය ප්‍රයෝජන සමාජ විද්‍යාත්මක,මනෝවිද්‍යාත්මක,චිත්තවේගික හෝ ආර්ථික විය හැකියි.<br>
• බෝඩියෝ සහ කෝල්මන් : සංකල්ප පහක් ඉදිරිපත් කරයි.<br>
1. ජාල - පුද්ගලයන් හා කණ්ඩායම් අතර රේඛීය සබඳතා.<br>
2. අන්නෝන්‍ය අපේක්ෂා - කෙටිකාලීන හෝ දිගුකාලීන.<br>
3. අවදානම් දැරීම - අපේක්ෂිත ප්‍රතිචාර පිළිබඳ හැඟීම.<br>
4. සමාජ ප්‍රතිමාන - චර්යා සහ අන්තර් ක්‍රියා.<br>
5. සාමූහිකත්වය - සාමූහික හෝ පෞද්ගලික ක්‍රියාකාරීත්වය.<br>
• කෝල්මන් : ශිෂ්‍යය චර්යා සහ ජීවන අපේක්ෂා යටතේ මෙසේ දක්වයි .සමාජ ප්‍රාග්ධනය පවුල තුළ පවතින අතර,එයින් පිටස්තරව ද ගොඩනැඟේ.වැඩිහිටියන් හා ළමුන් අතර සම්බන්ධතා,සමාජ ජාල හා ප්‍රතිමාන යන සමාජ ප්‍රාග්ධනයට අදාළ කරුණු 3 ළමයාගේ වර්ධනයට බලපායි.<br>
• සංකීර්ණ සමාජ තුළ සමාජ ප්‍රාග්ධනය උවමනාවෙන් අත්පත් කරගැනීමත් ,ගොඩනැඟීමත් කළ යුතුය .<br>
සමාජ ප්‍රාග්ධනය සංකල්පය තක්සේරු කිරීමේ නිර්නායක :<br>
1. අන්‍යෝන්‍ය විශ්වාසය හා අන්තර් පැවැත්මක් ප්‍රදර්ශනය වන සමස්තසමස්ත පැවතීම හා ඒවායේ ආර්ථික,භෞතික ජීවන තත්ත්වය,යහපත්ව පවත්වා ගැනීමට දායක වී ඇති ආකාරය 2. ප්‍රජා මූල සංවිධාන සංවිධාන හා කණ්ඩායම් ක්‍රියාකාරිත්වය තුළ ජන සහභාගිත්වය.<br>
3.සාමූහිකව ක්‍රියාත්මක වන සමාජයක් පැවතීම.<br>
4. ස්වෙච්ඡාවෙන් පොදු කටයුතුවල යෙදීම.<br>
5. ඉහළ සහ පහළ සමාජ පන්ති වල සුබදායක බැදීම්.<br>
6. නීතිය සහ ව්‍යවස්ථාදායකය ගැන ඇති විශ්වාසය ප්‍රමාණය.<br>
7. පොදු දේපල පිළිබඳව පුද්ගලයන්ගේ ධනාත්මක හැගීම.<br>
8. සමාජ යහපැවැත්ම පිළිබඳ පොදු සමාජ කතිකාවක් පැවතීම.<br>
9. සමාජයේ පොදු සංස්කෘතික ආයතන (පන්සල/පල්ලිය වැනි) ශක්තිමත් ව ක්‍රියාත්මක වීම.<br>
බ්ලැක්ස්ටර් : 2001 සමාජ ප්‍රාග්ධනය බහුමානිය සංකල්පයක් බැවින් පැහැදිලිව තක්සේරු කළ නොහැකි බව දක්වා ඇත.
</td></tr>
</table>

# 19. සමාජ ප්‍රාග්ධනය (Social Capital )

| සමාජ ප්‍රාග්ධනයේ වැදගත්කම හා ප්‍රයෝජන. | අධ්‍යාපනයෙන් සමාජ ප්‍රාග්ධනය ගොඩ නැංවීම . |
|---|---|
| 1. සමාජ ප්‍රාග්ධනය පුද්ගල සබඳතා හා පුද්ගලයන්ට උදව් කරන බව ( පහල සමාජ පන්ති වල සිසුන්ට පුද්ගල සම්බන්ධතා අඩුවීම නිසා සමාජ ප්‍රාග්ධනය පවුල තුළින් උපයා ගැනීමේ නොහැකිතාවය දකින්න.)<br>2. සමාජ ප්‍රාග්ධනය ප්‍රජාතන්ත්‍රීය සමාජයක් ගොඩ නගයි.අපරාධ අඩු කරයි.සෞඛ්‍ය තත්වය ගොඩ නංවයි.සමාජ ජයග්‍රහණ අත්කර දෙයි.<br>3. එය,තනි පුද්ගලයෙකුගේ යහපත සඳහා නොව පොදු සමාජ සමාජ යහපත උදෙසා පවතී .<br>4. සමාජ ප්‍රාග්ධනය සමාජ ස්ථාවරත්වය ,ආර්ථික වෘද්ධිය, සමග එක්ව ගමන් කරයි.<br>5. ලෝකයේ සංවර්ධන පිළිබඳ ජගත් සංවිධාන (UNDP,UNICEF) වැනි සංවිධානවල අවධානයට යොමු වී තිබේ.ගෝලීය සමාජයක පොදු ගැටලු විසඳීමට හැකි ප්‍රවේශයක් ලෙස යොදා ගත හැකි බව හඳුනා ගෙන තිබේ.<br>• සමාජ ප්‍රාග්ධනය පිරිහීම හෝ සාමූහික ඒකාග්‍රතාවය බිඳ වැටුන විට සංස්කෘතික තිර සාරත්වයට දැඩිව හානි පැමිනේ.<br>වර්තමාන ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පසුබිම සමාජ ප්‍රාග්ධනයට කර ඇති බලපෑම උදාහරණ සහිතව විමසන්න . | 1. පුද්ගලයන්ගේ සෑම අධ්‍යාපන ක්‍රියාවලියක් තුළම සමාජ ප්‍රාග්ධනය අත්පත් කර ගනියි.<br>2. අතීතයේ දී අවිධිමත්ව(පවුලෙන් / පාසලෙන්)වර්තමානයේදී විධිමත් ව (පාසලෙන් /අධ්‍යාපන ආයතන මගින් ) සමාජ ප්‍රාග්ධනය අත්පත් කරගනියි.<br>3. සිසුවාට පාසලෙන් පරිබාහිරව පවුල හා සමාජය තුළ තමා වෙනුවෙන් හිමි ව ඇති සමාජ සම්පත් ප්‍රමාණය සමාජ ප්‍රාග්ධනය යි.<br>4. දෙමව්පියන්ගෙන් සමාජ ප්‍රාග්ධනය දරුවාට හුවමාරුව ඉතා වැදගත් ය.(උගත් දෙමව්පියන් ගේ දරුවන් ගේ අධ්‍යාපන සාධන මට්ටම ඉහළ ය.)<br>5. දෙමව්පියන්ගේ සබඳතා බිඳ වැටීමේදී දරුවාට ලැබෙන සංඥා දුර්වල වේ.පවුලක සාමූහිකත්වය සමාජ ප්‍රාග්ධනය ඉහළ නංවයි.<br>පාසලට හා ගුරුවරැනට සමාජ ප්‍රාග්ධනය වැදගත් වන ආකාරය<br>• පාසලක සමාජ අන්තර් ක්‍රියා වැඩිවන තරමට අධ්‍යාපන සාධනය ඉහළ යයි.<br>• විෂය සමගාමී ,විෂයානුබද්ධ ක්‍රියා බහුල පාසලක සමාජ ප්‍රාග්ධනය ඉහළ තලයක පවතී.<br>• සාර්ථක ගුරු භූමිකාවක් සඳහා සමාජ ප්‍රාග්ධනය ගොඩ නගා ගෙන තිබීම අමිල සම්පතකි.<br>• ප්‍රජාවේ දැනුම සංවර්ධනය ට හා ප්‍රජාවට උදව් උදව් උපකාර කිරීමට ගුරුවරයා සතු සමාජ ප්‍රාග්ධනය වැදගත් වේ.<br>• ප්‍රජාවේ දුෂ්කරතා අවබෝධ කරගැනීමට.<br>• ප්‍රජාවේ මෙන්ම දරුවන්ගේස ආත්ම විශ්වාසය ගොඩ නැංවීමට සමාජ ප්‍රාග්ධනය වැදගත් මෙහෙවරක් ඉටු කරයි.<br><br>( ජනප්‍රිය හෝ විශාල පාසලක් සමාජ ප්‍රාග්ධනය නිතැතින්ම හිමිකර ගනියි.දුෂ්කර හෝ අවාසි දායක සමාජ පාසල්වල සමාජ ප්‍රාග්ධනය ගොඩ නැගීමට ඇති බාධා අධ්‍යාපන සාධනයට ද බලපෑම් ඇති කරයි.) |

# 20. සංස්කෘතික ප්‍රාග්ධනය (Cultural Capital)

| හැඳින්වීම | සංස්කෘතික ප්‍රාග්ධන න්‍යාය |
|---|---|
| • සංස්කෘතික ප්‍රාග්ධනය යනු පවුල විසින් යමෙකු තුළ ජනිත විය යුතු යැයි අපේක්ෂා කරන සංකේතාත්මක සම්පත් ගොන්නකි.මෙම සංකේතාත්මක සම්පත් සමහරවිට සංස්කෘතික ප්‍රාග්ධනය වන අතර තවත් විටෙක ආර්ථික වටිනාකමක් විය හැකිය.<br>• බෝඩියෝ **(1977)** සුවිශේෂී සංස්කෘතික විශ්වාස, සම්ප්‍රදායන්, සම්මත චර්යාවන් සංස්කෘතික ප්‍රාග්ධනය ට ඇතුළත් කොට ඇත.<br>නිර්වචන :<br>**1.** පුද්ගලයකුගේ මූල්‍යමය හා සමාජ ප්‍රගමනයට දායක වන සංස්කෘතික දැනුම සංස්කෘතික ප්‍රාග්ධනයයි.<br>**2.** බෝඩියෝ **(1986)** දැනුම,බුද්ධිමය හැකියා,වෙනත් නිපුණතා,අධ්‍යාපනය වැනි සමාජ සචලතාවයට හේතුවන ඉහළ තත්ත්වයක් ලෙස සංස්කෘතික ප්‍රාග්ධනය නිර්වචනය කොට ඇත.<br>පුද්ගලයාගේ සංස්කෘතික ප්‍රාග්ධනය පවුල හා ඒ ආශ්‍රිත පසුබිමෙන් නිර්මාණය වේ.පවුලේ සංස්කෘතික යෙදවුම් දරුවාගේ අධ්‍යාපන සාධනයට හේතු කාරක වේ. | • සංස්කෘතික ප්‍රාග්ධනය ලෙස සංකේතාත්මක වටිනාකම වන ගතිගුණ ,දැනුම ,උපාධි සමාජ සබඳතා ඇතුළත් වේ.ප්‍රාග්ධනය හුවමාරු වන සමාජ පද්ධතියක සමාජ සබඳතා ලෙස සංස්කෘතික ප්‍රාග්ධනය ක්‍රියාත්මක වේ.<br>බෝඩියෝ දක්වන සංස්කෘතික ප්‍රාග්ධනයේ අංග **(3)**<br>**1.** මූර්තිමත් තත්ත්වය<br>**2.** වාස්විකෘත තත්ත්වය<br>**3.** ආයතන ගත තත්ත්වය<br>මූර්තිමත් තත්ත්වය යනු පුද්ගලයන්ට උරුමයෙන් ලැබුණු දේ හා පුද්ගලයා අත්පත් කර දේ.(කාලය,සංස්කෘතිය ,පවුල හා සමාජානුයෝජනයෙන් ලද දේ භාෂාව හා සන්නිවේදනය වැනි )<br>වාස්විකෘත තත්ත්වය යනු විද්‍යාත්මක උපකරණ,වටිනා කලා කෘති වැනි ද්‍රව්‍ය අත්පත් කර ගැනීමයි.(කලා කෘතියක් නිසි ලෙස රස විඳීම සඳහා එහි ඓතිහාසික පසුබිම,සමාජ පසුබිම වැනි දැන සිටීම සංස්කෘතික ප්‍රාග්ධනයයි.<br>ආයතනගත තත්ත්වය යනු පුද්ගලයෙකු සතු සංස්කෘතික ප්‍රාග්ධනය ආයතනයක් වශයෙන් පිළි ගැනීමයි.එය සහතික පත්‍රයක්,පශ්චාත් උපාධියක්,අක්ත්‍ර පත්‍රයක් වැන්නකි.එය පුද්ගලයාගේ සංස්කෘතික ප්‍රාග්ධනයයි.<br>• සංස්කෘතික ප්‍රාග්ධනය ක්ෂේත්‍ර හා ජනාවාස ලෙස ද විග්‍රහ කෙරේ.ක්ෂේත්‍ර යනු සමාජ සම්බන්ධතා ව්‍යුහය වන අතර,විවිධ තනතුරු හා ස්ථාන ජනාවාස ලෙස ගැනේ.<br>• පවුල මෙන්ම පවුල අයත් සමාජ පන්තිය තුළින්ද පුද්ගලයකුට සංස්කෘතික ප්‍රාග්ධනය අත්පත් කරගත හැකි වේ. |

# 20. සංස්කෘතික ප්‍රාග්ධනය

| අධ්‍යාපනය තුළින් සංස්කෘතික ප්‍රාග්ධනය ගොඩ නැංවීම | අඩු අධ්‍යාපන සාධනයට සංස්කෘතික ප්‍රාග්ධනයේ බලපෑම |
|---|---|
| • පුද්ගලයකුගේ පවුල් පසුබිමේ සංස්කෘතික ප්‍රාග්ධනය අධ්‍යාපනයට බලපායි.අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් ඕනෑම සමාජයක සංස්කෘතික ප්‍රාග්ධනය අත්පත් කරගත හැකිවේ.<br>• පවුලේ සංස්කෘතික ප්‍රාග්ධනය විධිමත් හා අවිධිමත් ලෙස දරුවන් වෙත සම්ප්‍රේෂණය වේ.<br>• පවුල ,පාසල හා සමාජගත කණ්ඩායම් මගින් සංස්කෘතික ප්‍රාග්ධනය වර්ධනය වේ.<br>• අධ්‍යාපනය හා සංස්කෘතික ප්‍රාග්ධනය එකිනෙකාට බලපෑම් ඇති කරයි. බෝඩියෝ (1986) අධ්‍යාපනයේ සාර්ථකත්වය සඳහාසංස්කෘතික ප්‍රාග්ධනය ට දායක වීමට සපුරාලිය යුතු කොන්දේසි තුනක් ඉදිරිපත් කරයි.<br>1. දෙමව්පියන්ට සංස්කෘතික ප්‍රාග්ධනයක් තිබිය යුතුයි.<br>2. එය දරුවන්ට පවරා දිය යුතුයි.<br>3. ළමුන් එය උරා ගෙන අධ්‍යාපනයේ සාර්ථකත්වයට පත්විය යුතුයි .<br>    • ඉහල පන්ති වල සාමාජිකයන් සතු සංස්කෘතික ප්‍රාග්ධනය මගින් පාසලකට කළ හැකි බලපෑම් ඉතා ඉහලය.<br>    • න්‍යෂ්ටික පවුල් සංකල්පය නිසා සංස්කෘතික ප්‍රාග්ධනය ජනිත කිරීමට පවුලට වඩා පාසලට වැඩි වගකීමක් පැවරී ඇත.<br>    • බෝඩියෝ ට අනුව පාසල වනාහී සහතික මගින් සංස්කෘතික ප්‍රාග්ධනය පවරා දෙනු ලබන ආයතනයයි.<br>    • පාසල සංස්කෘතික පෙරණයක් ලෙසත් ක්‍රියා කරයි.<br>    • පාසල සංස්කෘතිය ලෙස ගනු ලබන්නේ ප්‍රමුඛ සමාජ පන්තියේ සංස්කෘතියයි.(පාසල් නිල ඇඳුම් සපත්තු ,ටයි පටි )<br>ගුණවර්ධන (1975) ශ්‍රී ලංකාව ආශ්‍රිතව කරන ලද අධ්‍යයනයක් මගින් සංස්කෘතික දරිද්‍රතාව පහල මට්ටමේ අධ්‍යාපන ප්‍රාප්තියට හේතු වී ඇති බව හෙළි කරගෙන ඇත. | • සමාජ කණ්ඩායම් වල උප සංස්කෘතීන් ද සංස්කෘතික ප්‍රාග්ධනය පවරා දීමේදී බාධාකාරී ලෙස කටයුතු කරයි.<br>• ආර්ථික ශක්තියක් පැවතියත් සංස්කෘතික දරිද්‍රතාවය ඇත්නම් අධ්‍යාපන සාධනය හීනවේ.<br>• අධ්‍යාපන සාධන විෂමතා ද ඇති වීමට සංස්කෘතික ප්‍රාග්ධනය බලපායි.<br>• ශිෂ්‍ය සංස්කෘතික ප්‍රාග්ධනය ශාස්ත්‍රීය කාර්ය සාධනයට ද,ගුරුවරයාගේ සංස්කෘතික ප්‍රාග්ධනය ශිෂ්‍ය ශාස්ත්‍රීය සංස්කෘතික සාධනයට ද එකිනෙකට බලපෑම් කරයි.<br>• උසස් අධ්‍යාපනයේ දී ශිෂ්‍යයෙකුගේ ඉහළ සමාජ ආර්ථික පසුබිම ඉහළ ශාස්ත්‍රීය සාධනයට හේතු වන අතර ,විශ්ව විද්‍යාලයට ඇතුළත් වන විට අත්පත් කරගෙන සිටින සංස්කෘතික ප්‍රාග්ධනය විශ්ව විද්‍යාලය තුළ ඉහළ ශාස්ත්‍රීය සාධනයට හේතු වී ඇති බව අධ්‍යයනයන් වලින් හෙළි වී ඇත.<br>• සටහන : දුෂ්කර පළාත්වල සහ දුෂ්කර අධ්‍යාපන කලාප වල අධ්‍යාපන සාධන මට්ටම ඉහළ නැංවීමට නම් පාසලේ මෙන්ම පාසල් ප්‍රජාවේද සංස්කෘතික ප්‍රාග්ධනය ඉහළ නැංවීමේ ක්‍රියා කාරකම් උපරිම තලයට ගෙන ආ යුතුය.ඔබ සේවය කරන දුෂ්කර පාසල් වල අධ්‍යාපන සාධනය දුර්වල වී ඇත්තේ සමාජ හා සංස්කෘතික ප්‍රාග්ධනයන් පිළිබඳ ගැටලුවක් නිසා බව අවබෝධ කර ගන්න. |

# 21. පාසල හා ප්‍රජාව - I

| ප්‍රජාව යනු කුමක්ද ? | ප්‍රජා සංවිධානයකින්,සමාජයෙන් ප්‍රජාව වෙනස් වන අන්දම | පාසල් ප්‍රජාව ස්වරූපය |
|---|---|---|
| සමාජ විද්‍යාත්මකව ප්‍රජාව යනු අන්තර් ක්‍රියා හා අන්තර් සබඳතා වලින් යුත් එකට බැඳුණු පුළුල් ප්‍රදේශයක ව්‍යාප්ත වූ පිරිසක් යන අදහස ඉදිරිපත් කෙරේ.<br>මැකයිවර් සහ පේජ් : ඕනෑම සමූහයක් පොදු ජීවිතයට අවශ්‍ය මූලික තත්ත්වයන් හවුලේ භුක්ති විඳිමින් එකට ජීවත් වන්නේ නම් එවැනි සමූහයක් ප්‍රජාවකි.<br>මෙල්වින් වෙබර් (1964) ප්‍රදේශයකට සීමා නොවුණ ද එකිනෙකා අතර ඇතිවන උනන්දුව ඔස්සේ සිදුවන සබඳතා මඟින් ද ප්‍රජාව ගොඩ නැගේ.<br>• පොදු උනන්දුවක් ඇති,සන්නිවේදනයන් සිදුවන පුද්ගල එකතුව ද ප්‍රජාවකි .<br>• ප්‍රජාව යනු පොදු අභිරුචීන් මෙන්ම විෂම අභිරුචීන් ඇති ප්‍රාදේශීය ජනගහනයකි.<br>• විලියම්ස් (1986) සමාජ ආර්ථික සංස්කෘතික අභිරුචීන් පොදුවේ භුක්තිවිඳින පුලුල් හා විස්තීරණ ජන කණ්ඩායමක් .<br>• වර්ගීකරණයක්.<br>1. නේවාසික ප්‍රජාව ( විශේෂිත ප්‍රදේශයක වාසය කරන)<br>2. සාමාජීය ප්‍රජාව ( සමාජ සබඳතා නිසා එකට බැඳුණු)<br>3. ආධ්‍යාත්මික ප්‍රජාව (විශ්වාස හා හා ඇදහිලි නිසා එකට එක්වූ )<br>• මූලික ලක්ෂණ :<br>1. ප්‍රජාව සතු යම් ප්‍රදේශයක් තිබීම.<br>2. තරගකාරී පුද්ගල හැඟීම්වලින් තොර එකමුතුව.<br>3. පොදු ජීවන ක්‍රමයක සිටීම<br>4. කල් පවත්නා අගයන් වෙත සදාචාරාත්මකව බැඳීම. | • සමාජය යන්න විශාල ජන කොට්ඨාසයක් වෙනුවෙන් ව්‍යවහාර කෙරේ.ප්‍රජාව සමාජයේ උප කොටසකි.<br>• ප්‍රජාවක ඔවුනට සුවිශේෂී සිරිත් විරිත්,ඇදහීම්,විශ්වාස සාරධර්ම හා ප්‍රතිමාන වැනි සමාජ විද්‍යාත්මක ලක්ෂණ පවතී.<br>• ටෝනීස් : ප්‍රජාව ස්වාභාවික අභිමතය පදනම් කර ගනියි.සමාජය තාර්කික අභිමතය පදනම් කර ගනියි .<br>• ප්‍රජාව ඓන්ද්‍රීය එකක් වන අතර ස්වභාවික ඒකාග්‍රතාවක් ඇත.සංවිධානය නිර්මාණය කළ එකක් වන අතර කොන්ත්‍රාත් මගින් එකඟතාවයන් ඇත.<br>• ප්‍රජාව පොදු අභිමතය පරිදි පොදු අවශ්‍යතාවයන්ට මුල් තැන දෙන අතර පොදු දේපළ හිමිවේ.සමාජය පුද්ගල අභිමතයන් ට පුද්ගල අවශ්‍යතාවයන්ට පුද්ගලික දේපල වලට මුල්තැන දේ.<br>• ප්‍රජාව අන්‍යෝන්‍ය වශයෙන් බැඳී උපතේ සිට මරණය දක්වා සාමකාමීව ජීවත් වේ.සංවිධානය තරගකාරී බව තරග කාරී බවින් යුක්තය. එක්තරා අරමුණකින් අපෞද්ගලිකව කටයුතු කරයි.<br>• ප්‍රජාව සමාජයට තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් ගැන සැලකිළි මත්වේ.සංවිධානය සමාජයෙන් තමාට ලැබිය යුතු දේ ගැන උනන්දු වෙයි.<br>• ප්‍රජාව ප්‍රාථමික සමූහයකි.සංවිධානය ද්විතීයික සමූහයකි. | ඒ ඒ සමාජයේ සම්බන්ධතා ගොඩ නැගීමේ ස්වරූපය මත හඳුනා ගැනීම් සිදු වේ.<br>• පාසල අවට කිසියම් විශේෂිත ප්‍රදේශයක වෙසෙන ජන සමූහය පාසල අවට ප්‍රජාව හෙවත් නේවාසික ප්‍රජාව ලෙස හඳුන්වයි. උදා : පාසලට දරුවන් වෙන දෙමව්පියන්,වෘත්තිකයන්,පූජ්‍ය පක්ෂය ,දේශපාලඥයන්,සුබ පතන්නන්)<br>• පාසල සමග සාමාජීය සබඳතා පවත්වන සියලු අය පාසල් ප්‍රජාව ලෙස ලෙස වර්තමානයේ දී හඳුනා ගනී. උදා: පාසලෙන් දුර බැහැර සිට පාසල හා සබදතා පවත්වන,විදේශීය රටවල සිට විය හැකිය .මෙනිසා සාමාජීය ප්‍රජාව යන සංකල්පය ඉදිරිපත් කර ඇත.නාගරික පාසලක සමාජීය ප්‍රජාව වැඩි අතර,ග්‍රාමීය පාසලක නේවාසික ප්‍රජාව වැඩිය.<br>• භූගෝලීය ව්‍යාප්තිය ,ජන සංයුතියේ ස්වරූපය ,බෙදීම්,විවිධතා,සමානතා,ශක්තීන්,හා ප්‍රජා අවශ්‍යතා පාසල් ප්‍රජාව හඳුනා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු වේ.<br>• පෝල් (1986) පාසල් ප්‍රජාව සරලව නිර්වචනය අසීරුය. පාසලක් හා බැඳුණු කණ්ඩායම් භූගෝලීය වශයෙන් විශාල ප්‍රදේශයක පැතිර සිටිය හැකි බව පවසයි.<br>• පොදු සංවර්ධනාත්මක අපේක්ෂාවෙන් යුත් පාසල හා සබදතා පවත්වන ජන සමූහයද පාසල් ප්‍රජාවකි.<br>• පාසල් ප්‍රජාවට පාසලේ අභ්‍යන්තර ජන සමූහයද,පාසලේ බාහිර ජන සමූහයද සංවිධාන හා පුද්ගලයන් ද අයත්වේ.<br>• ගුරුවරයෙකුට පාසල් ප්‍රජාව ගැන මනා අවබෝධය නැතහොත් ඔහුට හිමි සමාජ ගෞරවය හා විශ්වාසය අහිමි වේ.වෘත්තීය සාර්ථකත්වයට ප්‍රජා සබදතා ඉතා වැදගත් වේ. |

# 21.පාසල හා ප්‍රජාව - II

| පාසල හා ප්‍රජාව අතර සම්බන්ධය | නාගරික හා ග්‍රාමීය ප්‍රජා සබඳතා වල වෙනස්කම් | පාසල හා ප්‍රජාව අතර ඵලදායි සම්බන්ධතා ගොඩ නැගීම. |
|---|---|---|
| පාසලක ප්‍රජා සබඳතා වල ස්වරූප 2<br>1. පාසල ප්‍රජාවෙන් යැපීමේ තත්ත්වය.<br>2. පාසල හා ප්‍රජාව අතර අන්‍යෝන්‍ය වශයෙන් සම්පත් හුවමාරු වීමේ තත්ත්වය.<br>යැපීමේ තත්වය යටතේ පාසලෙන් මෙහෙවරක් සිදු නොවේ.ගුරු දෙමව්පිය සබඳතා දුරස්ථය.පාසල ඒකාධිකාරයක් පවත්වා ගනී.ප්‍රජාව බෙලහීන ලෙස සලකයි.<br>ලින්ඩා (1982) පාසැලක ප්‍රජා සම්බන්ධතා මට්ටම් හතරක් දක්වයි.<br>1. ඉතා දුර්වල - ප්‍රජා සබඳතා කිසිත් නැති.<br>2. පහල මට්ටම - ප්‍රජා උදව් පමණක් ඇති.<br>3. ඉහළ මට්ටම - පාසලෙන් ප්‍රජාවට හා ප්‍රජාවෙන් පාසලට උදව් ඇති.<br>4. ප්‍රශස්ත මට්ටම - පාසල හා ප්‍රජාව ඒකාබද්ධව ක්‍රියා කරන. | වර්තමානයේ දී සමාජය අධ්‍යාපන කටයුතු හා රැකියා සඳහා නාගරික සංක්‍රමණ වැඩි වීම තුළ නාගරිකනාගරික ලක්ෂණ ද ග්‍රාමීයව පැතිර ගොස් ඇත.<br>ගම්වල ප්‍රජා ලක්ෂණ අඩුවීම<br>නාගරික ප්‍රජාවේ පාසල ගැන ඇති ආකල්ප අසතුටුදායක බව අධ්‍යයනයකින් හෙළි වී තිබේ.<br>ආදී ශිෂ්‍ය සංගම් පිහිටුවගෙන නාගරික දෙමව්පියන් දෙමව්පියන් පාසල් වලට උදව් කරයි.(මේ පාසල් ප්‍රජාවෙන් කොටසක් පමණි)<br>පාසල හා හා ප්‍රජාව අතර සබඳතා ඇත් වීමේ හේතු : නාගරීකරණය,පාසල සමාජයෙන් හුදෙකලා වීම,ආයතනගත ආධිපත්‍ය,ප්‍රජා ප්‍රශ්න වලට නිසි විසඳුම් ලබා නොදීම,පාසල ශ්‍රමයෙන් මගහැරීම,ප්‍රජා අරමුණු ඉටු කිරීමට අපොහොසත් වීම,පාසල ප්‍රජාව මත බලෙන් ආරෝපණය,පාසල යට යටත් විජිත ස්වරූපයක් ප්‍රදර්ශනය කිරීම | 1. පාසල ප්‍රජා සම්බන්ධතා උවමනාවෙන්ම සංවිධානය කළ යුතු වේ.<br>2. පාසල ප්‍රජාවට ව්‍යාප්ත විය යුතුයි.<br>3. පාසල සමාජ සුබ සිද්ධියට කාර්යක්ෂමව ක්‍රියා කළ යුතුයි.<br>4. පාසල ප්‍රජාව සොයා යා යුතුයි .<br>5. පාසල් සංවර්ධන සමිතිය සංස්ථාපිත ආයතනයක් වශයෙන් ප්‍රජා හඳුනා ගැනීම් කළ යුතුයි.<br>6. පාසල තමාට උදව් කළ හැකි රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන හඳුනාගත යුතුයි. වර්ධනය කළ යුතුයි<br>7. සමීප මානව සබඳතා ක්‍රම භාවිතා කළ යුතුයි.<br>8. පාසල හා නිවස සමග සබඳතා වර්ධනය කළ යුතුයි.<br>9. පාසල ප්‍රජාවට ආකර්ශනීය තැනක් බවට පත් කළ යුතුයි .<br>10. පාසල එම ප්‍රජාවේ ප්‍රජාවේ පෙරගමන්කරුවා ලෙස කටයුතු කළ යුතුයි.<br>පාසල හා ප්‍රජාවෙ අන්‍යෝන්‍ය සම්බන්ධය<br>• පාසල සමාජ උප පද්ධතියකි.එහි පැවැත්මට ප්‍රජාව අනිවාර්යය වේ<br>• පාසලට ළමුන් සපයන්නේ ප්‍රජාවයි.පාසලින් පිටවන ළමුන් බාර ගන්නේ ගන්නේ ප්‍රජාවයි.<br>• ඔටාවේ (1980) පවුලෙන් ලබාගත් දැනුම,ආකල්ප,කුසලතා ළමයාට කරන බලපෑම ගුරුවරයා වටහා ගත යුතු බව පවසයි .<br>• පාසලට එන ළමුන්ගේ ආකල්ප ප්‍රජාවේ ආකල්ප අනුව හැඩ ගැසී ඇත.මෙම ආකල්ප අතර ගැටුමක් ඇතිවීම පාසල හා ප්‍රජාව අතර දුරස්ථතාවගොඩ නංවයි.<br>• මස්ග්‍රේව් හා ටේලර් (1989) පාසලේ කටයුතු පිළිබඳව සෙවීමට දෙමව්පියන්ට දී ඇති නිදහස හා දැනුම් දීම් වල ප්‍රමාණය මත පාසලේ පාසලේ දියුණුව රදා පවතී.(පාසල ප්‍රජාවට ප්‍රජාවට විවෘත වීම.)<br>• හැල්සි (1972) පාසල හා පවුල් අතර සම්බන්ධතා වර්ධනය කර ගැනීමෙන් ,දෙමව්පියන් තුළ අධ්‍යාපනය පිළිබඳ අවබෝධයත් ගුරුවරයා තුළ සමාජය පිළිබඳ අවබෝධයත් වැඩි දියුණු වේ. |

# 21. පාසල හා ප්‍රජාව - III

| පාසලේ භෞතික හා මානව සම්පත් ප්‍රජාවේ ප්‍රගමනයට දායකත්වය | භෞතික සම්පත් ප්‍රජාවේ ප්‍රගමනයට දායකත්වය | පාසල හා ප්‍රජා සම්බන්ධතා සංවර්ධනය සඳහා ගුරු භූමිකාවේ දායකත්වය | පාසල හා ප්‍රජා සබඳතා සංවර්ධනයේදී මතුවන ගැටලු හා ඒ සඳහා ගත හැකි ක්‍රියා මාර්ග |
| --- | --- | --- | --- |
| 1. පාසලක විදුහල්පති හා ගුරු භූමිකාව ඍජු ලෙස ප්‍රජා සබඳතාවන්ට දායක වේ.<br>2. ඔවුහු ප්‍රජාවේ සිතුම් පැතුම් ප්‍රත්‍යාවේක්ෂණය ට වගබලා ගත යුතුයි.<br>3. ප්‍රජාවේ ජීවත්වන,ප්‍රජාව අවබෝධ කරගත් අය විය යුතුයි .<br>4. ගුරුවරයා ප්‍රජා සේවකයෙකි.<br>5. ගුරුවරයා සහ ප්‍රජාව අතර සබඳතාව සියලු රාජ්‍ය නිළධාරීන් අතර ඇති සබඳතාවය ට වඩා ඉහළය.<br>6. ප්‍රජාවේ සහ ගුරුවරයාගේ සමාජ පන්ති විෂමතාව අවම කිරීමට ඔහු සමාජ විවිධත්වය තේරුම් ගෙන කටයුතු කළ යුතුයි .<br>7. දෙමව්පිය සිසු දුෂ්කරතා හදුනා ගැනීමට උපකාර කරන මාර්ගෝපදේශකයකු විය යුතුයි .<br>8. ගුරුවරයා ප්‍රජාව තුළ කායික ශ්‍රමයට ඇල්මක් ඇති කිරීම අනොන්‍ය අවබෝධයට හේතු වේ.<br>• ප්‍රජා අවශ්‍යතා මත ශ්‍රමදාන<br>• සෞඛ්‍ය පනිවිඩ ප්‍රජාවට ගෙනයාම<br>• ආගමික ආයතන අතර සමෝධානය<br>• ප්‍රජා සංස්කෘතියට සංස්කෘතියට ගෞරව කිරීම (කඨින පිංකම්,වෙල් උත්සව වැනි අවස්ථාවන්) | • පාසල් පුස්තකාල ,ක්‍රීඩා පිටි ,ගොඩනැගිලි ප්‍රජාවට විවෘත කිරීම .(මෙරට තරුණ අසහනය පිළිබඳ ජනාධිපති කොමිසම (1990) පාසල් ගොඩනැගිලි සවස 2න් පසුව ප්‍රජාවට විවෘත කළ යුතු බවට කළ නිර්දේශය මෙතෙක් ඉටුවී නැත.)<br>• පාසලේ භෞතික සම්පත් නිවාඩු කාලවල හා සති අන්තයේදී ප්‍රජාවේ ප්‍රයෝජනයට යොදවා ගැනීම.<br>• පාසල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස යොදා ගැනීම.<br>• ටැන්සානියාවේ සෑම පාසලක්ම වැඩිහිටි අධ්‍යාපන මධ්‍යස්ථානයකි.<br>• හන්ගේරියාව තම පාසල් වල වාර්ෂික සංවර්ධන සැලස්ම සකස් කරන්නේ ප්‍රජාව සමග ඔවුන්ගේ අවශ්‍යතා ද එකතු කර ගෙනය(ලංකාව කවදා හෝ මෙය කර තිබේද?)<br>• බහු සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස පාසල භාවිතා කිරීම .මෙමගින් ප්‍රජාව තුළ පාසල පිළිබඳ ඇල්මක් හා ගෞරවය ගොඩ නැගේ.<br>• මින්සේ : පාසල ප්‍රජාවේ තැරව් කරුවෙක් ලෙස කටයුතු කළ යුතු බව .එනම් ප්‍රජා ගැටලු හා සම්පත් හදුනා ගැනීම ,ප්‍රජා සම්පතට ගැටලු ගැන දැන ගැනීමට සැලස්වීම සහ පාසල මැදිහත් ව ගැටලු විසදීමට මග පෙන්වීම. | • ගුරු භූමිකාවේ කාර්ය භාරය<br>1.ප්‍රජාව හඳුනාගැනීම<br>2. ප්‍රජා අවශ්‍යතා ඉටු කිරීම<br>3. සංවිධාන ගොඩනඟා ගැනීමට සහය වීම<br>4. ප්‍රජාවගේ සංස්කෘතික ගැටලු විසදීමට සහායවීම .<br>5. අවශ්‍යතා අනුව අධ්‍යාපනය ලබාදීම.<br>6.සෞඛ්‍යයට හා උපදේශනයට මැදිහත් වීම.<br>පොදු රාජ්‍ය මණ්ඩලයේ ආසියානු කලාපීය ගුරු සේවාස්ථ සැසිය (1978) ගුරු භූමිකාවේ ප්‍රධාන ක්ෂේත්‍ර හතර අතරට පළමු වැන්න ලෙස දෙමාපිය හා පාසල් ප්‍රජාව අතර මනා සම්බන්ධීකරණය දක්වා ඇත. | පාසලකට තම කටයුතු තනිවම කළ නොහැක.තනිවම කටයුතු කිරීම තුළ ස්වයං ශක්ති සංවර්ධන බාධා පැමිණේ.<br>1. ප්‍රජාව පාසලට ශ්‍රම සැපයීමෙන් දායක වී ඇතත්,ප්‍රජාවේ ජීවන පැවත්ම වෙනස් කිරීමට පාසල දායක වී නැත. (වික්ටෝරියා බේකර් 1988 මොනරාගල සුදු වතුර ආර පාසල ඇසුරෙන් කළ පර්යේෂණය)<br>2. පාසල සමාජ ප්‍රගතියේ කේන්ද්‍රය වනවා වෙනුවට සමාජයේ ග්‍රාත්‍රාවක් (පාදයක් ) වීම.<br>3. විල්සන් හා කර්කෝන් : (1998) ප්‍රජා දායකත්වය තුළ පාසලට ලැබෙන ප්‍රයෝජන<br>• පාසලේ සම්පත් ඌණතා මග හැරවීම .<br>• දේශපාලන සහායෙන් පාසලේ ගැටලු විසදා ගැනීම .<br>• ශිෂ්‍යයන් තුළ මනා සන්නිවේදනය ගොඩ නැගීම.<br>• සමාජය පිළිගත් ආයතනයක් බවට පාසල පත්වීම<br>4. ප්‍රජාවේ විශේෂඥ දැනුම පාසල වෙත ළගා කර ගැනීම<br>• අත්දැකීම් බහුල ගොවි මහතුන්<br>• ප්‍රවීණ කාර්මිකයන් |

# 23. ගුරුවරයාගේ සමාජ භූමිකාව

| සමාජ භූමිකාව හැඳින්වීම | ගුරු භූමිකාව තීරණය වන සාමාජීය සාධක | ගුරු භූමිකාවේ වගකීම සහ වගවීම |
| --- | --- | --- |
| අර්ථ කථනය : කිසියම් තත්ත්වයක ,සේවයක හෝ වෘත්තීයක යෙදී සිටින සිටින පුද්ගලයකුගේ වගකීම්,බලතල මෙන්ම යුතුකම් හා පැවතුම් යන සංකල්පයන්හි අන්තර් ක්‍රියාවලියක් ලෙස සමාජ භූමිකාව හඳුනා ගත හැකිය.<br>විදුහලක ස්වභාවය ගත්විට එහි භූමිකා (Role) නිලය (Office ) තනතුර (Position ) තත්ත්වය (Status) දරන්නන් සිටිති.<br>පාසලේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පොදුවේ ගුරුවරු ලෙස හැඳින් වුවත් පාසල ඇතුලත ඔවුන් භූමිකා කිහිපයක කටයුතු කරති.නිලය ගත්විට විදුහල්පති,උපගුරු ලෙස වර්ග වෙයි.තත්ත්වය ගත්විට නි.වි පති,අංශ ප්‍රධාන,පුස්තකාලාධිපති, පන්ති භාර ගුරු වැනි පිරිසක් සිටිති. මෙයින් වඩා රාජකාරිමය වශයෙන් වැදගත් තනතුරයි .(තනතුර පිරි නමන නිලමය තත්ත්වය යි. )<br>උප ගුරුවරයා ,පාසල තුළ අංශ ප්‍රධාන වුවත් විවෘත සමාජයට ඔහු ගුරුවරයෙක් පමණි.<br>ගුරු භූමිකාවේ ලක්ෂණ හා ගුණාංග<br>• ඊට වගකීම් ,බලතල,යුතුකම් හා හැසිරීම් ඇතුළත් වීම.<br>• එය ගතිකය.වේගයෙන් වෙනස් වේ.<br>• සමාජයෙන් සමාජයට,කාලයෙන් කාලයට වෙනස් වේ.<br>• එහි චරිතාංග,ගුණාංග රැසක් පවතී .<br>• රටක සමාජ සංවර්ධනයට ප්‍රබල බලපෑම් ඇති කරයි.<br>ගුරු භූමිකාවේ විද්‍යාත්මක පදනම<br>• මනාව ශිෂ්‍යයන් අවබෝධයට.<br>• ගුරුවරයාඅධ්‍යාපන සමාජ විද්‍යාව ,අධ්‍යාපන දර්ශනය ,අධ්‍යාපන මූලධර්ම,කළමනාකරණය,වැනි විෂයයන්ගේ ප්‍රාමාණිකයකු කිරීමට .<br>(ඔබ අධ්‍යාපන ඩිප්ලෝමාවෙන් ලබා ගන්නේ ගුරු භූමිකාවේ විද්‍යාත්මක පදනමයි)<br>• ඉගැන්වීම් ශිල්ප ක්‍රම ඵලදායී හා කාර්යක්ෂම ලෙස හසුරුවා ගැනීමට (ඉගැන්වීම් පුහුණුව )<br>• පවත්නා සමාජය හැදෑරීමට ශික්ෂණය හා දැනුම ලැබීමට. (ක්‍රියා මූලික පර්යේෂණ ) | • 1969 මස්ග්‍රේව් හා ටේලර් : සමාජයක් තුළ ලබා ගන්නා වටිනාකම් හා අපේක්ෂණ පද්ධතියක් බව දක්වයි.<br>• ශිෂ්‍ය අපේක්ෂණ : දැනුම් මූලාශ්‍රයක් වීම,ශිෂ්‍ය අපේක්ෂණයට පහනක් වීම<br>• දෙමාපිය අපේක්ෂණ : ශිෂ්‍යයාගේ චරිත සංවර්ධනය,අධ්‍යාපන සාධනය,කුසලතා ඔප් නැංවීම ,වෘත්තීයකට සූදානම් කිරීම .<br>• පරිපාලන අපේක්ෂණ : කලට වේලාවට වැඩ කිරීම ,පැවරූ වැඩ නිම කිරීම ,සාධනය ඉහළ නැංවීම ප්‍රජා සහයෝගිතාව<br>• රජයේ අපේක්ෂණ : රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම,ජාතික අධ්‍යාපන අරමුණු බල ගැන්වීම<br>• සමාජ අපේක්ෂණ : ඒ ඒ සමාජ පද්ධති,සමාජය ඉල්ලා සිටින වටිනාකම් ලබා දීම .<br>• ජගත් සංවිධාන : ලෝක සාමය හා සංහිඳියාව ,අන්තර් වාර්ගික සාමය,සැමට අධ්‍යාපනය, වැනි ගෝලීය අධ්‍යාපන සංකල්ප සාක් ෂාත් කරයි යන විශ්වාසය<br>මේ අනුව ඔබ පන්ති කාමරයේ සිටින විට ඔබේ ගුරු භූමිකාව තුළ කෙතරම් අපේක්ෂණ ප්‍රමාණයක් සමාජය අපේක්ෂා කරන්නේද යන්න අධ්‍යයනය කරන්න. මෙහි ඇත්තේ උදාහරණ කිහිපයක් පමණි. | යමෙකු තනතුරකට පත් වූ විට ඔහුගෙන් විශේෂිත කාර්යයක් අපේක්ෂා කෙරේ.ඒ අනුව වෘත්තියට හෝ සේවයට හිමිවන තනතුරේ හෝ නිලයේ කාර්යභාරය භූමිකාව වේ.<br>• තනතුරකට හිමි බලය වගකීම් සහ යුතුකම් සියල්ලේම අන්තර් ක්‍රියාවලිය ට භූමිකාව ඇතුළත් වේ.<br>• භූමිකාව යනු තනතුරෙන් අපේක්ෂා කරන දෙයයි.නැතහොත් සමාජයේ අපේක්ෂාවන්ට අනුව හැඩගැසුණු හැසිරීම් තත්ත්වයයි.මේ අනුව භූමිකාව යනු යම් තත්ත්වයක් යටතේ ලැබෙන වටිනාකමකි.<br>(ගුරුවරයෙකු වශයෙන් ඔබව ලැබෙන වටිනාකම් මෙන්ම අපේක්ෂණ පද්ධතියක් භූමිකාව ට අයත් වේ.)<br>• තනතුරකට නිල වශයෙන් අයත් දේ මෙන්ම,සමාජය අපේක්ෂා කරන තත්ත්වයන්ද භූමිකාවක අන්තර්ගත වේ.<br>( ඔබ උපාධිධාරී පුහුණු ගුරුවරයෙකි.පාසලේ දී ඔබට නියෝජ්‍ය විදුහල්පති තනතුරේ තනතුරේ ලැබී තිබේ.පාසල් සමාජය ඔබෙන් අපේක්ෂා කරන්නේ නියෝජ්‍ය විදුහල්පති තනතුරේ සේවාවයි.)<br>• ගුරුවරයකු නම් ඔහුට පැවරී ඇති පුළුල් කාර්යභාරය කාර්යභාරය ගුරු භූමිකාවයි.<br>• ගුරු භූමිකාව සමස්ත ප්‍රජාව පුරාම ව්‍යාප්ත වූවකි.නිලයන් ,තනතුරු හා තත්ත්වයන් යන ස්වභාවයන් එම පරිශ්‍රයන්ට පමනක් සීමා වන ඒවා විය හැකියි.<br>( සමාජ මාධ්‍ය කළඹන ලද කදිරාන විදුහලේ ගුරු දිනය දා එළි මහනේ නටන ලද ගුරුවරියන් දැක සමාජය තුළ විරෝධයක් පැන නගින්නේ ඇයි දැයි විමසන්න.ගුරුවරයෙක් නම් ඔහුට පැවරී ඇති පුළුල් කාර්ය භාරය ගුරු භූමිකාව යි.ඊට වගකීම්,වගවීම්,බලතල, යුතුකම්,හා පැවතුම් පද්ධතියක් ඇතුලත් වේ.මෙහිදී පැවතුම් පද්ධතියක් යන්න අධ්‍යයනය කරන්න. රජයේ සේවකයන් ට සැහැල්ලු ඇඳුමකින් රාජකාරියට පැමිණීමට අවසර දී ඇතත් ගුරුවරියන්ට එම තීරණය වලංගු නොවන්නේ කුමක් නිසාද? මෙම අදහසම ශාරීරික අධ්‍යාපන ගුරුවරයාට හෝ ගුරුවරියට වෙනස් වන්නේ කෙසේද? භූමිකාව යන්න ඉතා ප්‍රබල සාධකයකි. |

# 23. ගුරු භූමිකාව

## ගුරු භූමිකාවේ ගැටුම්

ගුරු භූමිකාවේ ගැටුම් ඇතිවීමට හේතු :

1. ගුරු කාර්ය පැහැදිලි නොවූ විට
2. ඉගැන්වීමේ අරමුණු පැහැදිලි පැහැදිලි නොවූ විට.
3. ගුරුවරයාගේ ආර්ථික තත්ත්වය දුර්වල වූ විට.(ඇතැම් විට ගුරුවරයා ගේ ආර්ථික තත්ත්වය බලවත් වූ විටත් ගුරු භූමිකාවේ ගැටුම් ඇති විය හැක.ධන බලය යොදා ගනිමින් වෙනත් ව්‍යාපාර වල පාසල් කාලය තුළ යෙදීම, අධ්‍යාපන නිලධාරීන් හා විදුහල්පති වරයා වෙත අයුතු ලෙස බලපෑම,දේශපාලඥයන් ඇසුරු කරන ගුරුවරුන් විදුහල්පති වරුන් ගේ භූමිකාව අධ්‍යයනය කරන්න)

ගුරු භූමිකාවේ ගැටුම් වර්ග 1. භූමිකා පෞරුෂ ගැටුම 2. භූමිකා ගැටුම් 3. භූමිකා අන්තර් ගැටුම්

- භූමිකා පෞරුෂ ගැටුම් (Role personality Conflicts) යනු පුද්ගලයෙකුට යම් යම් පෞද්ගලික අපේක්ෂණ පවතී.ඔහුගේ වෘත්තීය භූමිකාවේ ද යම් යම් අපේක්ෂණ ඇත.මේ දෙක අතර අන්නෝන්‍ය වශයෙන් සම්බන්ධතාවයක් නැති වූ විට භූමිකා අවශ්‍යතා හා පෞරුෂ අපේක්ෂණ අතර ගැටුමක් හටගනී.

  (උදා : ගුරුවරයෙකු ඕනෑවට වඩා කාලය තම ඉගෙනීම් කටයුතුවලට යොදමින් පවුලේ කටයුතු අතපසු කරන්නේ නම් පවුලේ අප්‍රසාදයට පත් වේ. එසේම ඔහු පවුලේ කටයුතු වලට මුල් තැන දෙමින් වෘත්තීය කටයුතු අතපසු කරන්නේ නම් පාසලේ දෝෂ දර්ශනයට හසු වේ.මේ අවස්ථා දෙකේදීම ගැටුම් වලට මැදිහත් වීමට ඔහුට සිදුවෙයි.)

  භූමිකා ගැටුම් : Role Conflicts යනු භූමිකාධාරියෙකුට අන්‍යෝන්‍ය වශයෙන් ඉතා වැදගත් , පරස්පර විරෝධී හෝ එයට අනුවර්තිත භූමිකා කිහිපයක එක විට කටයුතු කිරීමට සිදු වූ විට භූමිකා ගැටුම් ඇතිවේ. ඒවා නැවත වර්ග කර ඇත.

  - භූමිකා අන්තර් ගැටුම් - භූමිකා තුළ ගැටුම් - භූමිකා තුළ ගැටුම්

භූමිකා අන්තර් ගැටුම් (Inter Role Conflicts ) යනු එකම පුද්ගලයා උසුලන භූමිකා දෙකක් හෝ වැඩි ගණනක් අතර ගැටුම් පැන නැගීමය.ගුරුවරයෙක් බොහෝවිට පියෙකු,ස්වාමියෙකු යන භූමිකා ද දරයි.පියා හෝ මව පුතාගේ පන්තියේ හෝ විෂය භාර ගුරුවරයා වූ විට /බිරිඳ තම පාසලේම ගුරුවරියක වන විදුහල්පති වරයාට ඇතැම්විට අන්තර් භූමිකා ගැටුම් වලට මුහුණ පෑමට සිදුවනු ඇත.

භූමිකා තුළ ගැටුම් : Intra Role Conflicts ) භූමිකාව තුළ පරස්පර විරෝධී පීඩනයන්ට මුහුණ දීම තුළ ගැටුම් ඇති වේ .විදුහල්පතිවරයා ගතානුගතික ඉගැන්වීම් බලාපොරොත්තු වන අතර,අංශ ප්‍රධානියා නූතන ඉගැන්වීම් ක්‍රම බලාපොරොත්තු අවස්ථාවක ගුරුවරයාට භූමිකා ගැටුම ගැටුමකට මුහුණ දීමට සිදුවනු ඇත.

භූමිකා සමූහ තුළ ගැටුම් ( Conflicts Within the Role Set) යම් භූමිකාවක් පිළිබඳව භූමිකා සමූහයට අයත් විවිධ පුද්ගලයන් විසින් විවිධ අපේක්ෂණ ඇතිකර ගැනීමෙන් ද ගැටුම් ඇතිවේ.මෙයට පෙර ගුරු භූමිකාව යටතේ ගුරුවරයා මග පෙන්වන්නෙක්,රහස් රකින්නේ,මිත්‍රයෙක් වැනි චරිතාංග ගණනාවක් දක්වා ඇත. භූමිකා කිහිපයක් මැනවින් ඉටු එකක් අතපසු වූ විට භූමිකා සමූහ තුළ ගැටුම් උද්ගත විය හැක.

පෞරුෂ ගැටුම් : Personality Conflicts ) මෙයට හේතු වන්නේ භූමිකා දරන්නා තුළ ඇති අවශ්‍යතා සහ විභව්‍යතා අතර ප්‍රතිවිරුද්ධ තාවයයි.නිතර පාසලේ හෝ ගුරු මණ්ඩලයේ වැරදි සොයන එම ගුරු මණ්ඩලයේ ම ගුරුවරයා මෙසේ අවශ්‍යතා සහ විභව්‍යතා අතර ප්‍රතිවිරෝධය දක්වන පුද්ගලයාය.

( බොහෝ විට ඔබගේ ගුරු මණ්ඩලය තුළ හැමදේටම විරුද්ධ වන ගුරුවරු සිටිය හැක.මෙහිදී විරුද්ධ වීම හා එකග නොවීම පටලවා නොගත යුතුයි. උපදේශනය විෂයයේදී සාකච්ඡා කරන 'එකග නොවීමට එකගවීම' ඉතා යහපත් සංකල්පයකි.

ගැටුම් නිරාකරණය :

සෙකෝඩ් හා බිලැක්මන් ගේ යෝජනා .

- භූමිකා අතර යම් අනු පිළිවෙළක් සකස් අනු පිළිවෙළක් ගැනීම. උදාහරණයක් ලෙස ගුරුවරයාට එකම වේලාවක ගුරු රැස්වීම සහ තමාගේ අතිරේක පන්තිය යෙදී තිබිය හැකියි.රාජකාරිමය වශයෙන් ප්‍රමුඛතාව ලබාදිය යුතු යුත්තේ කුමටදැයි ඔහු තීරණය කළ යුතුයි.

භූමිකාවට බලපෑම් ඇති කරන පුද්ගලයන්ගේ අනුපිළිවෙල අනුව ක්‍රියා කිරීම .(නිලබල ධූරාවලියට අනුව .අධ්‍යාපන ලේකම් ගේ විදුහල්පති දක්වා ආදී ලෙස )

| ගුරු භූමිකාවේ තත්ත්වය නගා සිටුවීම | ගුරු ආචාර ධර්ම |
|---|---|
| ඔයිසර් : ගුරු භූමිකාවේ පැති හතක් පෙන්වා දෙයි.උපදේශකයෙක්,සාධනය මනින්නෙක්,ආචාරධර්ම ප්‍රකාශකයෙක්,ව්‍යවස්ථාදායකයෙක් විනිශ්චයකාරවරයෙකු සහ ආරක්ෂකයෙක්.<br>ලින්ච් හා ග්‍රීන් (1974) ක්ෂේත්‍ර හතක් දක්වයි. නවතම ඉගෙනුම් ක්‍රම අනුගමනය ,ඉගෙනුම් ආධාරක භාවිතා කිරීම ,දෙමව්පිය සුහද සබඳතා වර්ධනය,සහායක සේවා ප්‍රයෝජනයට ගැනීම,නම්‍ය කාලසටහනකට සිසුන් හැසිරවීම,වෙනත් වෘත්තිකයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම.<br>මෙම දර්ශක පාදකව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් යෝජිත නිර්දේශ :<br>• 1986 පැරිස් සමුලුව ,ගුරු වෘත්තිය නගා සිටීම පිළිබඳව නිර්දේශ 146 ක් ඉදිරිපත් කොට ඇත.<br>• ගුරුවරයා සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රතිපත්ති මාලාවක් සකසා ඇත.<br>• UNESCO සම්මුති මාලාව<br>• දිවි පැවැත්මට ඉගෙනීම (1972)<br>• U.S.A.අධ්‍යාපන කොමිසම : ගුරුවරයාගේ කැපවීම,විෂය ප්‍රවීණත්වය,ඉගෙනුම් කළමනාකරණය,ඉගෙනුම් ක්‍රම වැඩි දියුණු කිරීම,වෘත්තීය සහයෝගීතාව පිළිබඳව කරුණු ඉදිරිපත් කොට ඇත.<br>• ගුරු වෘත්තිකභාවය නගා සිටුවීම 1981 ධවල පත්‍රිකාව.<br>• ගුරු ආචාර ධර්ම පද්ධතියක් (1991)<br>දේශීය වශයෙන් ගුරු භූමිකාව නගා සිටුවීමේ යෝජනා :<br>1. ඉගැන්වීම් ශිල්ප ක්‍රම දියුණු කිරීම හා පර්යේෂණ කිරීම .<br>2. අධ්‍යාපනය පිළිබඳ න්‍යායාත්මක දැනුම වර්ධනය කිරීම.<br>3. ගුරු පෞරුෂ ගුණාංග වර්ධනය .<br>4. ශ්‍රී ලංකාවට ආවේණික ගුරු ආචාර ධර්ම පද්ධතියක් සම්මත කර ගැනීම.<br>5. ගෝලීය ඉගෙනුම් සංස්කෘතියකට අවශ්‍ය භූමිකා ගුණාංග හඳුන්වාදීම.<br>6. ගුරු ආකල්ප සංවර්ධනය | වර්තමාන ගුරු භූමිකා පොදු ගැටලු:<br>• ගුරු වෘත්තීයමය තත්ත්වය පිළිබඳ ගැටලු සහ අභියෝග රැසක් පැන නැගීම.<br>• වෘත්තීය මට්ටම පහත වැටීම<br>• ගුරුවරයාගේ ආර්ථික තත්ත්වය යහපත් නොවීම.<br>• සේවා තෘප්තිය නොලැබීම<br>• ඇප කැපවීම අඩුවීම<br>• පෞද්ගලික ඉගෙනුම් තරගය<br>• ගුරු ඇගයීම් අතපසු කිරීම<br>• වැටුප් පරිමාණ ගැටලු<br>• ජාතික මාරු ප්‍රතිපත්තියක් නොවීම .<br>ගුරු ආචාර ධර්ම පද්ධතියක් සඳහා ඇතුළත් විය යුතු කරුණු<br>1. සේවය පාසල් කාලයට සීමා නොකිරීම .<br>2. ජාතික නිර්මාපකයෙක් ලෙස.<br>3. වෘත්තීය ගෞරවාන්විත සේවාවක් ලෙස පිළි ගැනීම.<br>4. සේවාවන් අතර විවේචනයන්ගෙන් වැලකීම.<br>5. අපක්ෂපාතීව කටයුතු කිරීම .<br>6. දේශපාලන පක්ෂපාතී බව පෞද්ගලිකව තබා ගැනීම.<br>(මෙම ලේඛනය තවත් සංවර්ධනය කර ගන්න.වෘත්තීය ආචාර පද්ධතියක් අවශ්‍යද යන්නටද කරුණු ගොනු කර ගන්න.) |

# මූලාශ්‍රිත පත පොත


- ආචාර්ය සුවීනිතා ගුණසේකර - 1978 - සමාජ විද්‍යාව - ගුණසේන ප්‍රකාශන
- මහාචාර්ය රෝලන්ඩ් අබේපාල - (2018) සමකාලීන අධ්‍යාපන සංකල්ප - සාර ප්‍රකාශන .
- මහාචාර්ය රෝලන්ඩ් අබේපාල - (2018) ඉගෙනුම් මනෝ විද්‍යාවේ නව ප්‍රවණතා - සාර ප්‍රකාශන
- මහාචාර්ය දයා රෝහණ අතුකෝරළ සහ හේළි නිමලා අතුකෝරළ -(2016 )අධ්‍යාපන මූලධර්ම ලිපි හා අධ්‍යාපන රචනා - ශික්ෂා මන්දිර ප්‍රකාශන .
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්.ගලගමගේ - (2008) අධ්‍යාපන සමාජ විද්‍යාව -

  කර්තෘ ප්‍රකාශන .
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්.ගලගමගේ -(2018) අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම - කර්තෘ ප්‍රකාශන .
- ජාතික අධ්‍යාපන ආයතනය : අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම - 1 සහ 11 මහරගම ගුරු අධ්‍යාපන ආයතනය.
- ජා.අ අ - අධ්‍යාපන මූලධර්ම - පාසල් කළමනාකරණ අත්පොත.